

13

# THE SIGNALLER

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011



SRI LANKA SIGNAL CORPS



20 වන සංවත්සරය නිමිත්තෙන් 2011.06.04 දින ස්වාමීන් වහන්සේ 20 නමක් සඳහා පැවැත්වූ දානමය පිංකම.



20 වන සංවත්සරය නිමිත්තෙන් 2011.06.05 දින ඒකක අණදෙන නිළධාරීතුමන් විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම සහ ආචාර පෙළපාලිය පිළිගැනීම.



20 වන සංවත්සරය නිමිත්තෙන් 2011.06.05 දින ඒකක සංවත්සර දිනය සිහිවීම වස් ඒකක අණදෙන නිළධාරීතුමන් විසින් පැළයක් රෝපණය කිරීම සහ ක්‍රීඩා තරඟ ජයග්‍රාහයකයින් හට ත්‍යාග සහ සම්මාන ලබා දීම.



20 වන සංවත්සරය නිමිත්තෙන් 2011.06.05 ඒකක අණදෙන නිළධාරී තුමන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ සියලු නිළ භෝජන සංග්‍රහය.



යුධ හමුදා දිනය වෙනුවෙන් පැවැත්වූ බෝධි පූජා පිංකම.



20 වන සංවත්සරය වෙනුවෙන් බනි / සැරයන් නිවස්නයේ පැවැත්වූ සුහද හමුව.



# 5 වන රෙජිමේන්තුව (ආධාරක බලඇණිය)
# ශ්‍රී ලංකා සංඥා බලකාය

## 18 වන වියට පා තැබීම

සංඥා බළකා මැණියන්ගේ පළමු ආධාරක බළඇණිය වශයෙන් 1994 ජනවාරි මස 02 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ නව බළඇණියක් වශයෙන් 5 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය ආරම්භ කරන ලදි. අණදෙන නිළධාරී වරුන් 14 දෙනෙකු යටතේ සාර්ථකව ක්‍රියාත්මක රාජකාරී සිදුකිරීමේදී අනෙකුත් පාබල ඒකක සමග උරෙන් උර ගැටී ඔවුන්ට නොදෙවෙනි ලෙස ඉදිරි ආරක්ෂක වළල්ලේ රාජකාරී ඉටුකරන ලද අන්දම හා පාඨමාලාවන්හි දක්වන ලද දක්ෂතාවයන් හේතුවෙන් සේනාංකාධිපතිවරුන්, බළසේනාධිපතිවරුන් සහ අනෙකුත් පාබල ඒකක අණදෙන නිළධාරීවරුන්ගේ ප්‍රශංසාවට පත්ව ඇති මෙම ඒකකය, දැනට මානුෂීය මෙහෙයුම තුලින් මුදවාගත් මුලතිව් දිස්ත්‍රික්කයේ මුල්ලියාවේලි හි, 59 වන පාබල සේනාංක මූලස්ථානයට අයත් 592 බසේමු යටතේ ස්ථානගත කර ඇත.

ත්‍රස්ථවාදය තුරන් කිරීමෙන් පසු, සිවිල් වැසියන් නැවත පදිංචි කිරීමේ භාරදූර කාර්යයද, මෙම ඒකකය වෙතින් ඉටු කරමින් සිටින අතර, එහිදී දක්වන ක්‍රියාශීලිත්වය හා කාර්යශූරත්වය නිසාම මෙම ඒකකය ඉහල මූලස්ථානයන්ගේ නිරන්තර පැසසුමට ලක්වෙමින් පවතී.

තවද, ගෙවීගිය වසරේ සිදුවූ වැදගත් සිදුවීම් ලෙස, යුධ වාතාවරණයක් නොමැති පරිසරයක් තුලදී පාලන හා සිවිල් සම්බන්ධීකරණ රාජකාරී වලට නිසි නායකත්වයක් නව අණදෙන නිළධාරී වෙතින් ලැබීම, මෙම ඒකක නිළධාරීන්/සෙනින්ගේ චිත්ත ධෛර්ය ඉහල මට්ටමක පවත්වා ගැනීමට හැකිවීම, සෙනින්ගේ නිළ උසස් කිරීමේ කටයුතු සඳහා සහ වෘත්තිය දැනුම ඉහල මට්ටමකට ගෙන ඒමේ වැඩසටහන් කිහිපයක්ම ඉතා සාර්ථක අන්දමින් ගෙවී ගිය වකවානුව තුල ඒකකය තුලදී පැවැත්වීමට හැකිවීම හා අන්තර් ඒකක කබඩි තරඟාවලියේදී, ඉළවන ස්ථානය ලබාගැනීමට සමත්වීමද, මෙම ඒකකය ලද ජයග්‍රහණ කිහිපයකි.



2011.01.02 දින ට යෙදුනු ඒකක 17 වන සංවත්සරයේදී ඒකක අණදෙන නිළධාරී විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම.



2011.01.02 දින ට යෙදුනු ඒකක 17 වන සංවත්සරයේදී ඒකක අණදෙන නිළධාරී විසින් පොල්තෙල් පහන දැල්වීම.



2011.01.02 දින ට යෙදුනු ඒකක 17 වන සංවත්සරයේදී සියළු නිළ දිවා භෝජන සංග්‍රහය සහ අණදෙන නිළධාරී විසින් සියළුම නිළයින් ඇමතිම.



2011.03.13 වන දින 5 ශ්‍රීලංසංබ මූලස්ථානයේ දී ඒකකයේ සෙනින් විසින් මුලතිව් රෝහලේ වෛද්‍ය නිළධාරීන්ගේ සහය ඇතිව සිදු කරන ලද, ලේ දන්දීමේ ව්‍යාපාරයේ අවස්ථාවක්.



2011.08.07 වන දින මුල්ලියාවේලි පාසලේදී සිවිල් ජනයා වෙනුවෙන් පවත්වන ලද, අක්‍ෂි සායනය.





2011.08.06 වන දින සංඥා බලකාධිපතිගේ ඒකක සංචාරය.



ඒකකයේ සෙනින් විසින් ඉදිකරනු ලබන මුලතිව් - මුල්ලියාවේලි උන්නාපිලම් දෙමළ විද්‍යාලයේ නව පාසල් ගොඩනැගිල්ල.



ඓතිහාසික වට්ටප්පලේ කෝවිලේදී ආසේමු (මු) ආඥාපති සමග එහි ආගමික වතාවත් වලට සහභාගී වූ ඒකක අණදෙන නිළධාරී.





# 6 වන රෙජිමේන්තුව (ආධාරක බලඇණිය) ශ්‍රී ලංකා සංඥා බලකාය

ඉන්දියන් සාගරයේ මුතු ඇටය, ලෙසින් විරුදාවලිය ලත් ශ්‍රී ලංකා මැණියන් ආරක්‍ෂා කිරීමේ භාරදූර වගකීම කරතේ දරාගෙන දිවිහිමියෙන් ක්‍රියාකරනු ලබන යුද්ධ හමුදා පවුලේ ප්‍රබල සාමාජිකයෙකු වශයෙන් පෞඪ ඉතිහාසයකට හිමිකම් කියන, අභිමානය අතැතිව සංහිවේදනයේ ප්‍රමුඛයා වන ශ්‍රී ලංකා සංඥා බලකායට දෙවන ආධාරක බලඇණිය ලෙසින් එක් වූ 6 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය (ආධාරක බලඇණිය) තම රාජකාරී ගමන් මගෙහි ආරම්භය සනිටුහන් කරනු ලැබුවේ 223 බසේමු (එවකට 6 බසේමු) යටතේ වැලිඔය ප්‍රදේශයෙනි.

එම ප්‍රදේශය තුල පැවැති අධි ක්‍රියාන්විත තත්වයන් යටතේ මෙම ඒකකය වෙත පැවරුන රාජකාරීන් ඉතා උසස් මට්ටමින් ඉටුකරනු ලැබීම තුලින් නවක ඒකකයක් වුවද, උසස් මූලස්ථානයන් හි ඇගයීමට මෙන්ම ප්‍රශංසාවට ලක්වීම ඒකකයෙහි ඉදිරි ගමන් මගට මහත් රුකුලක් විය. 1997.05.20 දින වැලිඔය ප්‍රදේශයේ රාජකාරීන් වලින් මිදී, 21 වන සේනාංක මූලස්ථානයට අයත් 211 බසේමු යටතේ වව්නියාව, තාන්ඩිකුලම් ප්‍රදේශයේ ඉදිරි ආරක්‍ෂක වළල්ලෙහි ස්ථානගතව රාජකාරී ඉටුකරමින් සිටියදී, 1997.06.10 දින එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය ඉතා සාර්ථක ලෙස එහාර්ට කරදැමීමට සමත්විය.

එසේ එල්ල වූ ත්‍රස්ත ප්‍රහාර හමුවේ නොබියව මුහුණදෙමින් ලද අත්දැකීම් සමුදායත් සමගින්, වව්නියාව ප්‍රදේශයේ රාජකාරී වලින් මිදී, 1997.09.22 දින මන්නාරම නගරය ආසන්නව ස්ථානගත වෙමින් තම රාජකාරී ඉතා උසස් මට්ටමින් ඉටු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස යුද්ධ හමුදාව විසින් ප්‍රථම වරට ගුවන්යානා නාශක මිසයිලයක් ත්‍රස්තවාදීන්ගෙන් අත්අඩංගුවට ගැනීමේ ගෞරවය මෙම ඒකකය වෙත හිමිවීම සහ එවකට එල්ටීටීඊ සංවිධානයේ මන්නාරම ප්‍රදේශය භාරව සිටි ජෝන් නැමැත්තා මරණයට පත්කිරීම, ඒකකය ලද ජයග්‍රහන ඒකකයට මෙන්ම සංඥා බලකායටම ආඩම්බරයට කරුණක් විය.

එසේම මෙම ඒකකය මන්නාරම් දිස්ත්‍රික්කයට අයත් තාප්පමොටෙයි, උයිලන්කුලම් සහ පිරමනායන්කුලම් යන ප්‍රදේශයන්හි තම රාජකාරී කැපවීමෙන් හා උනන්දුවෙන් යුතුව ඉටුකිරීම හේතුවෙන් එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාර ගණනාවක් ඉතා දක්‍ෂ අයුරින් එහාර්ට කර දැමීමට සමත්විය. මෙම සියළු අත්දැකීම් සමගින් ඒකකය 2000.05.13 දින යාපනය අර්ධද්වීපයට පැමිණ ප්‍රථමයෙන් සරසාලෙයි ප්‍රදේශයේ ස්ථානගතව, යාපනය අර්ධද්වීපය තුල රාජකාරී ඉටුකිරීම ආරම්භ කරන ලදී. එදින සිට කොඩිකාමම්, මිසාලෙයි, ජේදුරුතුඩුව, කිලාලි, මුහමාලෙයි සහ අලිමංකඩ ප්‍රදේශයන්හි ස්ථානගතව ත්‍රස්තවාදීන් විසින් එල්ල කරන ලද ප්‍රහාර ගණනාවක්ම දක්‍ෂ ලෙසින් එහාර්ට කරදැමීමට සමත්විය. එමෙන්ම මානුෂීය මෙහෙයුම් සඳහා සහභාගී වෙමින් පාබල බලඇණි වලට නොදෙවෙනිව පැවරුන රාජකාරී උසස් මට්ටමකින් ඉටුකිරීම හේතුවෙන් සේනාංක මූලස්ථාන, බලසේනා මූලස්ථාන සහ අනෙකුත් උසස් මූලස්ථානයන්හි ඇගයීමට මෙන්ම ප්‍රශංසාවට ලක්වීම ඒකකයේ ප්‍රතිරූපය ඔප්නැංවීමට බෙහෙවින් බලපාන ලදී.

දශක තුනක කුරිරු ත්‍රස්තවාදය ලක් දෙරණින් මුලිනුපුටා දැමීමෙන් පසු ශ්‍රීලංකාවේ භෞමික හා යුධෝපක්‍රමික වශයෙන් වැදගත් ස්ථානයක් වන අලිමංකඩ පිහිටි යාපනය අර්ධද්වීපයට පිවිසෙන දොරටුව රැකගැනීමේ වගකීම මනා අයුරින් ඉටුකරන ලදී. එසේම රජය විසින් සාර්ථකව සිදුකරගෙන යනු ලබන අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ මෙම ඒකකය විසින්, ඉතා කාර්යක්‍ෂමව හා මානවහිතවාදී දැඩි හැඟීමෙන් යුතුව, ජේරාලෙයි, ධර්මකේනි හා සින්න ධර්මකේනි යන ගම්මාන ආශ්‍රිතව පවුල් 180 කට වැඩි ප්‍රමාණයක් නැවත පදිංචි කරවා ඔවුන් අතුරින් තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 15 ක් සඳහා නිවාස 15 ක් කිසිදු බාහිර සහයෝගයක් හෝ නොමැතිව ඒකකයේ ශ්‍රමදායකත්වයෙන් යුතුව සාදා නිමකර එම පවුල් වෙත භාරදෙන ලදී.

ඒකකය අලිමංකඩ ප්‍රදේශයේ රාජකාරී නිමාවෙන් පසු, 2010.10.15 දින සිට සිවිල් ජනතාව වැඩි වශයෙන් පදිංචිව සිටින යාපනය නගරය ආසන්නයේ 51 සේනාංක මූලස්ථානයට අයත් 512 බසේමු යටතේ ස්ථානගතව ප්‍රදේශයේ ආරක්‍ෂාව තහවුරු කරමින් සිටියි. මෙම ඒකක 14 වන උපන්දිනය 2011.01.10 දිනට යෙදී තිබූ අතර, ඒ වෙනුවෙන් ඉතා උත්කර්ෂවත් අන්දමින් උත්සව මාලාවක් පවත්වා සෙබළුන්ගේ චිත්ත ධෛර්ය වර්ධනය කිරීමට කටයුතු කරන ලදී. තවද මෙම ඒකකය 51 සේනාංක මූලස්ථානයේ අධීක්‍ෂණය යටතේ මාදුරුඔය වලමණ්ඩිය වන සටන් පුහුණු පාසල වෙතින් 2011.06.09 දින සිට 2011.07.16



ලූතිනන් කර්නල් කේජ්ඩබ්එස් රත්නායක නව ඒකක අණදෙන නිළධාරීතුමන් වශයෙන් 2011.02.21 දින සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගැනීම.



ඒකකයේ අණදෙන නිළධාරී ලෙස කටයුතුකර 1 වන රෙජිමේන්තුව, ශ්‍රීලංසබ අණදෙන නිළධාරී ලෙස පත්වීම් ලැබ නික්ම යන ලූතිනන් කර්නල් ආර් ඇල්විටිගල නිළධාරී හට සමරු ඵලකය පිළිගැන්වීම.



THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

# 10 වන රෙජිමේන්තුව (ආධාරක බලඇණිය)
# ශ්‍රී ලංකා සංඥා බලකාය

සංඥා බලකා මැණියන්ගේ ලාබාලතම ආධාරක බලකාය වශයෙන් 2008.08.01 දින පිහිටුවනු ලැබූ මෙම ඒකකය එදින පටන් මාතෘභූමිය නිදහස් කර ගැනීමේ උතුරු මානුෂීය මෙහෙයුමට සක්‍රීයව දායකවූ අතර, දැනට යුද්ධයෙන් අවතැන්වූවන්ගේ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදුකරමින් සුගන්දිපුරම්-පුතිකුඩිඉරිප්පු ප්‍රදේශයේ ස්ථානගතව ඇත.

ගෙවීගිය වසර දෙකක කාලය දෙස ආපසු හැරී බැලීමේදී, වසර පුරාම ඒකකයට අයත් බල ප්‍රදේශය තුල ත්‍රස්තවාදීන් විසින් අටවන ලද මර උගුල් හා බිම්බෝම්බ ඉවත් කිරීම් සිදුකරනු ලැබූ අතර, ඒ සඳහා රාජ්‍ය නොවන සංවිධාන හා ඉංජිනේරු බලකාය වෙත සහයෝගය ලබා දෙන ලදි. ඊට අමතරව ඒකකයේ සෙනින් ගේ කැපවීම හා අණදෙන නිළධාරී තුමාගේ මඟපෙන්වීම යටතේ වර්ෂා කාලයේ නිතර ජලයෙන් යට වන මේ ප්‍රදේශයේ මාර්ග නිසි අයුරු ගමන් කර ගමනා ගමනයට උචිත වන අයුරින් පිලිසකර කරන ලදි. මෙම ඒකකයේ සියළුම නිළයින් මාතෘභූමිය බේරා ගැනීමේ උතුරු මානුෂීය මෙහෙයුමට සෘජුවම දායක වූ අතර, විජයග්‍රහණයෙන් පසුව එලැඹි පසුගිය වසර තුල, "මනා පුහුණුවක් ලබන සොල්දාදුවා රටට සම්පතකි", යන අගනා වැකිය ක්‍රියාවට නන්වමින් සියළුම නිළධාරී හා සෙසුනිළයින් එක්ව පුතිකුඩිඉරිප්පු උසස් පාබල පුහුණු පාසලෙන් බළඇණි පුහුණු පාඨමාලාව හදාරා මනා පුහුණුවක් ලබා ගන්නා ලදි.

දැනට මෙම ඒකක බළ ප්‍රදේශය තුල සරණාගත කඳවුරු ජීවිතය අවසන් කර, සිය ගම්බිම් වල පදිංචි වීමට පැමිණි සිවිල් ජනතාව නැවත පදිංචි කිරීමේ වැඩසටහන් ආරම්භ කර ඇති අතර, ඉතාමත් කාර්යක්ෂම ලෙස ඔවුන්ගේ අවශ්‍යතාවයන් රාජ්‍ය සංවිධාන සමග එක්ව ඉටුකරදීමට මෙම ඒකකය කටයුතු කරමින් සිටී. දින තුනක් ඇතුලත සුගන්තිරපුරම් මිශ්‍ර පාසල, ඉරට්ටමඩු මිශ්‍ර පාසල හා උදයාර්කට්ටු මහා විද්‍යාලය පිලිසකර කර ප්‍රදේශයේ දමිල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා දීමට අප ඒකකය දායක විය.

මෙම ප්‍රදේශයේ පදිංචි වන සාමාන්‍ය ජනතාව තවමත් දරුණු ලෙස යුද්ධයෙන් පීඩාවට පත් අයවළුන්ය. ඔවුන්ගේ ආර්ථික මට්ටම පහත් තත්වයක ඇති බැවින්, දරුවන්ගේ විනෝදය හා යුදමානසිකත්වය ඉවත් කිරීම වෙනුවෙන්, ළමා උද්‍යානයක් අණදෙන නිළධාරී තුමාගේ සංකල්පයකට අනුව නිළධාරී/සියළු සෙනින්ගේ මහත් උද්යෝගයෙන් හා සහයෝගිත්වයෙන් යුතුව උදයාර්කට්ටු - [illegible] ප්‍රදේශයේ ඉදිකල අතර, එහි විනෝදයෙන් කාලය ගත කිරීමට ප්‍රදේශයේ සියළු කුඩා ළමුන්ට හැකියාව ලැබී ඇත. තවද ජේරාවිල් පාසලේ ඉගැන්වීමේ කටයුතු කරනු ලබන ගුරු මහත්ම මහත්මියන් ගේ ප්‍රයෝජනය සඳහා ගුරු නේවාසිකාගාරයක් සකස් කරදීමද, මෙම ඒකකය විසින් නැවත පදිංචි කරන ලද වැසියන්ගේ යහපත වෙනුවෙන් කරන ලද තවත් සත්ක්‍රියාවකි. ප්‍රදේශයේ ජනතාවගේ විනෝදය තකා මෙම ඒකකය අයත් 683 බළසේනා මූලස්ථානය හා එක්ව අගනා බක්මහ උලෙළක් සංවිධානය කල අතර, සමගීය හා සාමය කෙතරම් අගනේද යන්න, වටහාදීමට අප සියළු දෙනා හට හැකියාව ලැබිණි. තවද ජාතින් අතර සමගිය ඇති කිරීමට හා ආගම් අතර සුහදතාවය වර්ධනය කිරීමට, මෙම ඒකකය වෙතින් ඉදිරිපත් කල වෙසක් කූඩු ප්‍රදර්ශණය හා පොසොන් පොහොය වෙනුවෙන් ඉදිරිපත් කලු මහින්දාගමනය පිලිඹිබු කල මිස්සක පව්ව අනුරුව, මහත් පිටුවහලක් හා අනුබලයක් වූ බැව් පෙන්වා දිය හැක.

තවද, ගෙවී ගිය වසර තුල මෙම ඒකකයේ සෙසු නිළයින්ගේ ප්‍රයෝජනය සහ සුභසාධනය සඳහා ඒකක අණදෙන නිළධාරීතුමාගේ විශේෂ උපදෙස් මත සෙසුනිළ භෝජනාගාරය සහ භටනිවාසයක් ඉදිකර සෙසුනිළයින්ගේ අවශ්‍යතාවය සඳහා ලබාදීම සිදුකරන ,ලදි. මීට අමතරව 10 ශ්‍රීලංසංබ (ආ/බ) ඒකකය වෙත ඇතුළුවන ප්‍රධාන දොරටුව ඉතා අලංකාරව ඉදිකර ඇති අතර, ඒකක නිළධාරී නිවස්නයද, නවීකරණය කරන ලදි. තවද 2010 වර්ෂය දෙස ආ පසු හැරී බලනවිට මෙම ඒකකය අනෙකුත් සංඥා ඒකක අතුරින්, දෙවන ස්ථානය ලබාගෙන ඇති බවද පවසා සිටින්නේ ඉමහත් සතුටින් සහ නිහතමානිවය.

ඉදිරියේදී ඒකකය වෙත ලැබෙන ඕනෑම අභියෝගයක් වෙනුවෙන් සර්වකව මුහුණ දීමට සූදානමින් සිටින 10 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකායට, තුන්වන සංවත්සරය සැමරීමට ඇත්තේ ඉතා කෙටිකාලයකි. එහිදී ඒකකයට අයත් මියගිය සෙනින්ග්‍රේ දෙමාපියන් හා ලඟම ඥාතින්, ඔවුන්ගේ පුතුනුවන් දැයට අහිමිවූ ප්‍රදේශයේ සංචාරය කරවා නොමැකෙන මතක සටහනක් ලබාදීමට කටයුතු සූදානම් කර ඇත. මීට අමතරව තුන්වන සංවත්සරය සඳහා වැඩසටහන් මාලාවක් සකස් කර ඇති අතර, ගෙවී ගිය වසර තුනක කාලය තුල ඒකකයේ උන්නතිය වෙනුවෙන් මහත් කැපවීමෙන් කටයුතු කල නිළධාරී හා සෙසුනිළයින්, සිවිල් සේවක මහතුන්ගේ දායකත්වය අගය කල යුතුය. අවසන් වශයෙන් මියගිය සහෝදර සෙබළුන්ට අජරාමර නිවන් සුව ලැබේවායි ප්‍රර්ථනා කරන අතර, තුවාල ලබා තවමත් ප්‍රතිකාර ලබන අයවළුන්ටත ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමු.

1

## INTERNATIONAL MARITIME SIGNAL FLAGS





**THE SIGNALLER**
Sri Lanka Signal Corps Journal - 2011

### සංස්කාරක මණ්ඩලය

ලුති කර්නල් ඩබ්ලිව්ඩීඑන් වරාගොඩ පීරිස්
ලුති කර්නල් පීපීඑ ගුණසේකර
මේජර් පීවීවීඑන් චන්ද්‍රසේකර
මේජර් ඩබ්ලිව්ඒආර්එම්ආර් විකුමසිංහ
මේජර් එච්එම්ඩීඑම් හේරත්
මේජර් අයිපීකේ ප්‍රියංකර
මේජර් ඩීඑම්ඩීඑම් හේරත්
කපි I ඩබ්ලිව්ඩීඑන් එම්ප්ද
කපි II අබේසිංහ එච්එම්ඩී

### ලිපිනය

ප්‍රධාන සංස්කාරක,
සංඥා පුහුණු පාසල.
කුණ්ඩසාලය,
මහනුවර.
දුරකථන : 081-2223558
Email : sigsch@mail.army.lk

### සැකසුම සහ මුද්‍රණය

ග්‍රැෆික් නිර්මාණ
කේ.එම්. සුරේෂ් මධුසංඛ
දුරකථන : 075-6346920

රුචිර ප්‍රින්ටර්ස්
නො : 231, පේරාදෙණිය පාර,
මහනුවර.
දුරකථන : 081-4481700




## කතුවැකිය

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 68 ක් සපිරෙන මෙම ඓතිහාසික අවස්ථාවේදී වාර්ෂිකව පලකරනු ලබන ද "සිග්නලර්" සඟරාවේ ප්‍රධාන කතෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලත් භාග්‍යයක් කොට අලකමි.

මීට වසර දහ අනූවකට ප්‍රථම ආරම්භ කරන ලද මෙම සඟරාව තුලින් සංඥා බලකායේ පවණයක් පුරාවට සිදුවන/සිදු වූ කාලීන සිදුවීම් සෑම සාමාජිකයෙකුටම දැන ගැනීමට, ඔවුන්ගේ නිර්මාණශීලි හැකියාවන් විදහා දැක්වීමට හා තම දැනුම වර්ධනය කරගැනීමට මෙම සඟරාව මනා පිටුවහලක් වන බැව් නොඅනුමානය. එසේම වර්ෂ 30 කට අධික කාලයක් තිස්සේ ත්‍රස්තවාදයකට එරෙහිව එඩිතරව මුහුණදුන් අප විරෝධාර සෙබළුන්ට මෙම කලාපය තුල නිර්මාණ හා සිතේ සිරකරන් සිටි අදහස් එළිදැක්වීමට ඉතා හොඳ තෝතැන්නක් වූ බැව් පැහැදිලිවම නිරීක්ෂණය විය. සඳහා සියලුම මූලස්ථාන හා ඒකක නිලධාරී/සෙසුනිලයින් වෙතින් දක්වන ලද සහයෝගය ඉතා අගය කොට සලකමි.

එසේම අවසාන වශයෙන් මෙම සඟරාව සිත් ගන්නා අයුරින් හා හරවත් අයුරින් නිර්මාණය කිරීමට මා හා එක්ව කටයුතු කල සංස්කාරක මණ්ඩලයටත්, අලංකාර අන්දමින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට කටයුතු කල රුචිර ප්‍රින්ටර්ස් ආයතනයේ අධිපති ඇතුළු කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ටත් මාගේ හෘදයාංගම ස්තුතිය මෙයින් පුද කර සිටිමි.

## පටුන



පෙරවදන 2 - 6

මතක පොතින් 7 - 50

කෙළි බිම 51 - 61

කැටපත් පවුර 62 - 70

මන්දාකිනිය 71 - 84

මංගල සිහිනු හා උපන්දින සුභ පැතුම් 85 - 88

විවිධ 89 - 92




## පෙරවදන



## සංඥා බලකාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 68 ක් සපිරෙන මෙම ඓතිහාසික අවස්ථාවේදී පසුගිය වසරේදී මෙන්ම මෙම වසරේදී ද, "ද සිග්නලර්", සඟරාවේ 13 වන කලාපය වෙනුවෙන් සංඥා බලකාධිපති වශයෙන් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යක් කොට සළකමි. ගෞරවනීය හා අභිමානවත් ඉතිහාසයක් ඇති සංඥා බලකායේ සාමාජිකයින් වන අප සංඥා රාජකාරී තුලින් මෙන්ම පාබල රාජකාරී තුලින්ද, යුද හමුදාවට ලබාදුන් අසීමිත දායකත්වය සංඥා බලකාධිපති වශයෙන් මා මෙහිදී සිහිපත් කරණුයේ ඉතා අභිමානයෙනි.

පැවති යුද වාතාවරණය පහව ගොස් එළඹි සාමකාමී සමයේ වුවද, යුද හමුදා සන්නිවේදනයේ පෙරගමන්කරු වන අප බලකායට පැවරෙන රාජකාරීන් කිසිඳු ලෙසකින් හෝ අවම නොවනු ඇත. යුද වාතාවරණය සහමුලින්ම දේශයෙන් බැහැර කිරීමෙහිලා අප බලකාය ලබාදුන් මෙහෙවර අති විශිෂ්ඨ වූ අතර, ඉන් තවත් ඔප් නැංවුනු අප බලකායේ කීර්තිය ඉදිරියටම ගෙන යාමට එක්ව කටයුතු කිරීම අපගේ පරම අභිලාෂය හා එකම අරමුණ විය යුතුය. දිගු කාලයක් මුළු දේශයම වෙලාගෙන පැතිර තිබූ යුද්මය වාතාවරණය සදහටම දේශයෙන් තුරන් කිරීමට තම ජිවිතය කැප කල සියලුම සංඥා රණවිරුවන් සහ සටනේදී ආබාධිත තත්වයට පත් සියළුම නිළධාරී/සෙසුනිළයින්ටත් මාගේ ගෞරවය හා ආචාරය මෙහිදී පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමි.

සංඥා බලකායේ කාලීන සිදුවීම් පිළිබඳව අප සාමාජිකයින් දැනුවත් කිරීම හා නිර්මාණශිලී හැකියාවන් ඇති අයවළුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ තෝතැන්න බඳු වූ, "ද සිග්නලර්", සඟරාව දිනෙන් දිනම දියුණුවට පත් වේවායි, ඉත සිතින් ප්‍රාර්ථනා කරන අතර, ශ්‍රී ලංකා සංඥා බලකායේ සියළුම නිළධාරීන්/සෙසුනිළයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, නිරන්තරයෙන් අප හා එක්ව කටයුතු කරන සිවිල් සේවක කාර්‍ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සාමය සතුට සපිරි සෞභාග්‍යමත් අනාගතයක් උදා වේවායි ප්‍රාර්ථනා කරමි.

ඒ පි ද ඉසෙඩ් අබේසේකර යුඑස්පි
මේජර් ජෙනරාල්
සංඥා බලකාධිපති








## ප්‍රධාන සංඥා නිළධාරීගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් එළිදක්වනු ලබන 2011, "ද සිග්නලර්", සඟරාව සඳහා ප්‍රධාන සංඥා නිළධාරී වශයෙන් පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සලකමි. මෙම වර්ෂය තුල සංඥා ඒකක තම සංඥා රාජකාරීන් ඉටු කිරීමෙන්ද, ආධාරක ඒකක පාබල රාජකාරීන් ඉටුකිරීමෙන් මෙන්ම, තොරතුරු තාක්‍ෂණ ඒකකය සහ මූලික සංඥා වැඩපල තම තාක්‍ෂණික රාජකාරීන් ඉටු කිරීමේදී දක්වන ලද දක්‍ෂතා හා කැපකිරීම් අගය කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

ශ්‍රීලංකා යුධ හමුදාව තුල ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ තොරතුරු තාක්‍ෂණ අධ්‍යක්‍ෂ මණ්ඩලය ස්ථාපිත කිරීමත් සමගම, තොරතුරු තාක්‍ෂණය වේගවත් ගමන්මගකට යොමු කිරීමට හැකියාව ලැබුණු අතර, ශ්‍රී ලංකාවේ දැනට ඇති විශාලතම පරිගණක දත්ත ජාලය වශයෙන් යුධ හමුදා පරිගණක දත්ත ජාලය මේ වනවිට ලබා ඇති ප්‍රගතිය සංඥා බලකාය ලද ජයග්‍රහණයක් ලෙස මා දකිමි. වත්මනයෙහි තොරතුරු තාක්‍ෂණික අධ්‍යාපනය සහ තාක්‍ෂණික පුහුණුව ඉතා වැදගත් කරුණක් වන අතර, අභියෝග ජයගෙන ඉදිරියට ගමන් කිරීම සඳහා පරිගණක දැනුම අත්‍යවශ්‍ය සාධකයක් වී ඇත. නවීන තාක්‍ෂණික උපකරණ භාවිතය සහ එහි නිරතුරු පුහුණුවීම මගින් මෙම ක්ෂේත්‍රය තරඟ අනාගත ලෝකයට නොබියව මුහුණදී අභියෝග ජයගැනීමට අවැසි ආත්ම විශ්වාසය වර්ධනය කරගැනීමට හැකි වනු ඇත. මෙම කාර්යයට හැකි පමණ දායකවීම සඳහා රණවිරු පවුල්වල සාමාජිකයන්ගේ පරිගණක තාක්‍ෂණික දැනුම දියුණු කිරීම වස් පනාගොඩ, අනුරාධපුර, මහනුවර, කුරුවිට හා කිලිනොච්චි යන ස්ථානවල රණවිරු තොරතුරු තාක්‍ෂණික ආයතන පිහිටුවීමට හැකිවීමද, සංඥා බලකායේ අනභිභවනීයත්වය ඔප් නැංවීමට ඉවහල් වන කරුණක්සේ මම දකිමි.

කුරිරු ත්‍රස්තවාදී යුද්ධය නිමාවී වසර 2 1/2 කට ආසන්න කාලයක් ගතවී ඇති මෙම අවස්ථාවේ, අප මාතෘභූමියේ ඒකීයභාවය වෙනුවෙන් ජිවිත පරිත්‍යාගකල සංඥා බලකායේ විරෝධාර රණවිරුවන් හා ආබාධිත රණවිරුවන් ඇතුලු සියලුම රණවිරුවන් මා මේ අවස්ථාවේ ගෞරවාදරයෙන් සිහිපත් කරමි. තවද, අබාධිත තත්වයට පත්ව තවදුරටත් ප්‍රතිකාර ලබමින් සිටින රණවිරුවන්හට ඉක්මන් සුවයත්, ජිවිත පරිත්‍යාගකල හා ආබාධිත රණවිරු පවුල්වල සාමාජිකයන්හට වාසනාවන්ත අනාගතයක් උදාවේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

අවසන් වශයෙන් ප්‍රධාන සංඥා නිළධාරී ලෙස සංඥා බලකායේ සියලුම නිළධාරීන්ටත්, සෙසුනිලයින්ටත්, සිවිල් සේවක කාර්යමණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ටත්, "ද සිග්නලර්", සඟරාව එළිදැක්වීමට කටයුතු කල කතෘ මණ්ඩලයටත් මාගේ සුභාශිංෂණය පිරිනමමි.

ආර් ඒ කඩුවෙල
බ්‍රිගේඩියර්
ප්‍රධාන සංඥා නිළධාරී



## අධ්‍යක්ෂක තොරතුරු තාක්ෂණගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බළකාය විසින් පළකරනු ලබන "ද සිග්නලර්" 2011 වසරේ සඟරාවට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක වශයෙන් දෙවන වතාවටත් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

යුධ වාතාවරණයෙන් පසුව යුධ හමුදාවේ තොරතුරු තාක්ෂණය නංවාලීමේ අරමුණින් 2010 වසරේ ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය යටතේ මෙම අධ්‍යක්ෂක මණ්ඩලය පිහිටුවනු ලදි. මූලික වශයෙන් මෙම අධ්‍යක්ෂක මණ්ඩලය මගින් යුධ හමුදාවේ තෝරාගත් ස්ථානයන්ට ඇවැසි මහා පරිමාණ හා සුලු පරිමාණ ව්‍යාපෘතීන් සකස් කිරීමේ කටයුතුත්, එම ව්‍යාපෘතීන් නොනවත්වා පවත්වාගෙන යාමේ කටයුතුත්, සිදු කරනු ලබයි. දැනටමත් යුද හමුදාව තුල සුලු පරිමාණ පරිගණක ව්‍යාපෘතීන් විශාල සංඛ්‍යාවකුත් මහා පරිමාණ පරිගණක ව්‍යාපෘතීන් කිහිපයකමත් කටයුතු අවසන් කර ඇති අතර, එම ව්‍යාපෘතීන් දැනට ක්‍රියාත්මකව පවතී. ඉදිරියේදීද, තෝරාගත් ස්ථානයන් සඳහා මහා පරිමාණ ව්‍යාපෘති කිපයකම කටයුතු ආරම්භ කිරීමටද නියමිතව ඇත.

මෙම ව්‍යාපෘතීන් මගින් යුධ හමුදාවේ එක් එක් ස්ථානයන්ට අදාල නිවැරදි තොරතුරු කඩිනමින් ලබාගැනීමට හැකිවනවා පමණක් නොව සංඥා බළසේනා මූලස්ථානයේ අධීක්ෂණය යටතේ දැනට යුධ හමුදාව තුල ක්‍රියාත්මක කරගෙන යනු ලබන SRI LANKA ARMY DATA NETWORK ජාලය හරහා මෙම තොරතුරු කඩිනමින් එක් එක් මූලස්ථානයන් අතර හුවමාරු කරගැනීමටද, හැකිවන බැව් පෙන්වා දෙමි.

දැනට ක්‍රියාත්මක තොරතුරු තාක්ෂණ කටයුතු නංවාලීමේ අරමුණින් සංඥා බළකායට කපිතාන් සහ ලුතිතන් නිළයන්ගෙන් නව නිළධාරීන් 24 දෙනෙකු 2010 වසරේදී බඳවාගන්නා ලදි. එම නිළධාරීන්ගෙන් තොරතුරු තාක්ෂණයට ඵලදායී සේවයක් ලබාගැනීමට හැකි වන පරිදි දැනට ක්‍රමානුකූලව පරිගණක ව්‍යාපෘති කටයුතු සඳහාත්, පරිගණක දෘඩාංග කටයුතු සඳහාත්, සේවයේ යොදවා ඇති බැව්ද පෙන්වා දෙමි. එමෙන්ම මෙම වසර තුලදීද කපිතාන් සහ ලුතිතන් නිළයෙන් තොරතුරු තාක්ෂණ නිළධාරීන් 14 දෙනෙකු එම කටයුතු සඳහා බඳවාගැනීමටද නියමිතව ඇත.

අවසාන වශයෙන් සංඥා බළකායේ නිළධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ මූලිකත්වයෙන් යුධ හමුදා තොරතුරු තාක්ෂණය දියුණු මගකට පිවිසි ඇති මෙවන් වකවානුවක බළකාධිපතිතුමා ඇතුලු සංඥා බළකායේ සියලුම නිළධාරීන්ටත්, සෙසුනිලයින්ටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, සිවිල් සේවක මහතුන් ඇතුලු ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, මෙම සඟරාව එළිදැක්වීමට වෙහෙසවී කටයුතු කල කාර්ය මණ්ඩලයටත්, මාගේ සුභාශිංෂනය පිරිනමමි.

එස්පේ වික්‍රමසිංහ යූඑස්පී
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂක තොරතුරු තාක්ෂණ







## සංඥා බළසේනාධිපතිගේ පණිවුඩය

සංඥා බළසේනාධිපති වශයෙන් මා හට මෙම පණිවුඩය ඔබගේ දැනගැනීම සඳහා, "ද සිග්නලර්" සඟරාවේ, 13 වන කලාපයේ, පළකිරීමට අවස්ථාවක් ලැබීම මා ලද ගෞරවයක් හා භාග්‍යයක් ලෙස සලකමි.

ශ්‍රී ලංකාද්වීපය තුල තිස් වසරක කාලසීමාවක තිබූ කුරිරු ත්‍රස්තවාදයට එරෙහිව මාතෘ භූමියේ භෞමික අඛණ්ඩතාවය හා ඒකීයභාවය සුරැකීම සඳහා සිදුකරන ලද මානුෂීය මෙහෙයුමේ සාර්ථකත්වය සඳහා යුධ හමුදාව තුල තිබිය යුතු අත්‍යාවශ්‍ය සාධකයක් වූ සංඥා සම්බන්ධතාවය ලබා දීමේ කාර්යභාරයේදී සංඥා බළකා නිළධාරීන් සහ සෙසුනිළයින් විසින් ඉටු කරන ලද සේවාව අතිමහත්ය.

සාමය උදාවීමෙන් පසු අප මාතෘභූමිය ආසියාවේ ආශ්චර්ය බවට පත්කිරීමේ කාර්යභාරයේ එක් කොටස්කරුවෙකු වශයෙන් ශ්‍රී ලංකා යුධ හමුදාවේ සංඥා බළකා සාමාජිකයන් වන අපහටද, භාරදූර වගකීමක් පැවරී ඇත.

සංඥා බළකාය වෙත පැවරෙන සංඥා රාජකාරීන් ඉටු කිරීම සඳහා අවශ්‍යවන නවීන සංඥා හා පරිගණක තාක්ෂණ දැනුම උපයෝගී කරගනිමින් සමස්ථ යුධ හමුදාවට අවශ්‍ය කරනු ලබන සංඥා සම්බන්ධතාවයන් කාර්යක්ෂමව ලබාදීම සඳහා ඔබ' සියලුදෙනා තම තාක්ෂණික දැනුම වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ඇතැයි මම විශ්වාස කරමි.

අප මාතෘභූමියට සාමය ලබාදීම සඳහා තම වටිනා ජීවිතය පූජාකල, සියලුම නිළධාරීන් හා සෙසු නිළයින් අප මතකයේ රඳවා ගැනීමටත්, කුරිරු යුද්ධය නිසා තුවාල හා ආබාධිත වූ සියලුදෙනා හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමටත්, මම මෙය අවස්ථාවක් කරගනිමි.

"ද සිග්නලර්" සඟරාවේ 13 වන කලාපය එළි දැක්වීමට කටයුතු කල සංස්කාරක මණ්ඩල" සාමාජිකයින්ට මාගේ ස්තූතිය පුද කරමි.

එන්එම් හෙට්ටිආරච්චි පීඑස්සී
කර්නල්
සංඥා බළසේනාධිපති



## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකායේ අභිමානය පිළබිඹු කරමින්, කාලීන සිදුවීම් පිළිබඳව මෙම රෙජිමේන්තුවට අයත් අයවළුන් දැනුවත් කිරීම හා නිර්මාණශීලි හැකියාවන් ඇති අයවළුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ මහගු කාර්යයට උරදී කටයුතු කරන "ද සිග්නලර්" සඟරාවේ 13 වන කලාපය වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යයක් කොට සළකමි.

තිස් වසරක කාලයක් කුරිරු ත්‍රස්තවාදින්ගේ ග්‍රහණයට හසුව තිබූ දේශය සහමුලින්ම මුදවා ගැනීමේ භාරදූර කාර්යයට උරදුන් අභිමානවත් ශ්‍රීලාංකිය හමුදාවේ සාමාජිකයින් ලෙස අප පෙරට ආවෙමු. අනතුරුව එළඹි පස්චාත් යුද සමයේදී ද, වගකිව යුතු වෘත්තිකයින් වන අප වෙත පැවරෙන රාජකාරීන් නොපිරිහෙලා ඉටුකිරීම අපගේ ඒකායන අරමුණ විය යුතු අතර, එය සාක්ෂාත් කරගැනීමට කැපවී කටයුතු කිරීම අප සියළුදෙනාගේ වගකීම විය යුතු බව මෙහිලා සිහිපත් කරමි.

එදා මෙදාතුර අප ආ ගමන් මගෙහි සියළු තොරතුරු මෙන්ම කාලීන හා තාක්ෂණික තොරතුරුද, කැටිකොට "ද සිග්නලර්" වාර්ෂික සඟරාව තුළින් ලබාදුන් දැනුම අසීමිත වන අතර, එය සැමගේ නිර්මාණශීලිත්වය දියුණු කරලීමට බෙහෙවින් දායක විය.

2011 වර්ෂය තුළදිද, "ද සිග්නලර්" සඟරාවේ 13 වන කලාපය සාර්ථකව ඉදිරිපත් කර ගැනීම සඳහා නව අදහස් හා නිර්මාණ මෙන්ම නොයෙකුත් තොරතුරු ලබාදීමෙන් දායකත්වය ලබාදුන් සංඥා බලකායේ සියළුම නිළධාරි/සෙසුනිළයින්ටත් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් මාගේ විශේෂ ප්‍රණාමය පිරිනමන අතර, "ද සිග්නලර්" සඟරාව දිනෙන් දින, දියුණුවෙන් දියුණුවට, පත් වේවායි ඉත සිතින් ප්‍රාර්ථනා කරමි.

ඩීආර් ධර්මසිරි
කර්නල්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක





## ශ්‍රී ලංකා සංඥා බලකාය - 67 වන සංවත්සරය

## මතක පොතින්













සංඥා බලකාධිපති වෙත පිරිනමනලද ආචාර පෙළපාලිය





මියගිය රණවිරුවන් සිහිකිරීම




සියළු නිල දිවා භෝජන සංග්‍රහය






පිරිත් සජ්ඣායනය හා සාංඝික දානය




හිටපු සංඥා බලසේනාධිපති බ්‍රිගේඩියර් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සි එම තනතුරෙන් නික්මයාම නිමිත්තෙන් සියළුම නිළයින් විසින් 2011.07.26 වන දින පිරිනමන ලද තේපැන් සංග්‍රහයේ විශේෂ අවස්ථා.



THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011




කර්නල් එන්වම් හෙට්ටිආරච්චි පීඑස්සි විසින් 2011.08.07 වන දිනට යෙදි තිබුණු සුභ මොහොතින් සංඥා බලසේනාධිපති තනතුරේ වැඩ භාරගැනීමේ විශේෂ අවස්ථාව



ප්‍රධාන සංඥා නිළධාරී බ්‍රිගේඩියර් ආර්ඒ කඩුවෙල විසින් 2011-08-30 වන දිනට යෙදි තිබුණු සුභ මොහොතින් **ප්‍රධාන සංඥා නිළධාරී** තනතුරේ වැඩ භාරගැනීමේ විශේෂ අවස්ථාව



සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ඩීආර් ධර්මසිරි විසින් 2011-05-02 වන දිනට යෙදි තිබුණු සුභ මොහොතින් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තනතුරේ වැඩ භාරගැනීමේ විශේෂ අවස්ථාව

# සංඥා ඒකක සංවත්සර/මතක සටහන්

## 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

## 68 වසරක ඉතිහාසයෙන් බිඳක්

ශ්‍රී ලංකා සංඥා බලකාය, 1943 ඔක්තෝබර් මස 19 වන දින අංක 9183 දරණ ගැසට් නිවේදනය ප්‍රකාරව ස්වෙච්ඡා හඩ පිරිස් වලින් සැදුම්ලත් ඛණ්ඩයකින් ආරම්භවී, 1950 වර්ෂය වන විට එයට නිත්‍ය හඩ පිරිස් ඛණ්ඩයක්ද, එකතුවීම තුලින් බළඝණයක් ලෙසින් ව්‍යාප්ත විය. එම සමය තුල අප රටට නිති විරෝධි සංක්‍රමණිකයින් ඇතුළුවීම වැලැක්වීම සහ වර්ෂ 1956 ජාතිවාද කෝලාහල මැඩ පැවැත්වීමට දායකවීමත්, 1957 වසරේදි රට තුල පැවති ගංවතුර හේතුවෙන් අවතැන්වුවන් බේරාගැනීමට දායකවීමත් සමඟම, 1958 වසරේදි මෙම කුඩා සංඥා බළඝණය ප්‍රථම සංඥා ඒකකය වශයෙන් එනම් 1 වන සංඥා රෙජිමේන්තුව ලෙසින් ස්ථාපනය විය.

1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය, ශ්‍රී ලංකා යුද හමුදාව තුල තිබූ එකම සංඥා රෙජිමේන්තුව වශයෙන් දිගු ගමණක් පැමිණෙමින් තිබූ මොහොතක අප රටේ ආරම්භ වූ රුදුරු බෙදුම්වාදි එල්ටීටීඊ ත්‍රස්තවාදි ක්‍රියාකාරකම් මැඩ පැවැත්වීමේ ජාතික අවශ්‍යතාවය මත 1989 දි, 3 වන සංඥා බලකායත්, 1991 වසරේ 4 වන සංඥා බලකායත් ස්ථාපිත කරන ලදි. එම සංඥා ඒකකයන් බිහිවීමත් සමගම 1 වන සංඥා බලකායේ සිටි සාමාජිකයින්ද එම ඒකක සඳහා අනුයුක්ත කිරීමටද සිදුවිය. සංඥා බලකාය තුල පැරණිම රෙජිමේන්තුව වන 1 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය පනාගොඩ සිට මඩකලපුව ප්‍රදේශයේ ස්ථානගතවීමෙන් අනතුරුව 1996 වසරේ මින්නේරිය - මහසෙන්පුර ප්‍රදේශයේ ස්ථානගතවීමත් සමගම පෙර ස්ථානගතව සිටි ස්ථානවලට වඩා අංග සම්පූර්ණ වූ ඒකකයක් ගොඩනගා ගැනීමට සියළු දෙනාගේ ශක්තිය, ධෛර්‍ය සහ කැපවීම මත හැකියාව ලැබුණි. තැගෙනහිර හා වන්නි මානුෂිය මෙහෙයුම ආරම්භ වනවාත් සමගම නැවත වතාවක් 1 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය, වැලිකන්ද ප්‍රදේශයේත්, එතැනින් පසු වර්ෂ 2009.04.28 දින ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේත් ස්ථානගතවන ලදි. වන්නි මානුෂිය මෙහෙයුම අවසන්වී මාස කිහිපයක් ගතවීමත් සමඟම ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙතින් අක්කර 50 කින් පමණ සමන්විත වූ ඝණ වනාන්තර භූමියක් ඒකකය ස්ථාපනය කරගැනීම සඳහා ලබාදෙන ලදි. මෙම අක්කර 50 කින් පමණ සමන්විත වූ ඝණ වනාන්තර භූමිය නිවැරැදිව හා ක්‍රමානුකූලව කඳවුරක් බවට පරිවර්ථනය කිරීමේ අභියෝගය එවකට අණදීමේ කාර්යභාරය ඉටු කල ලූතිනන් කර්නල් ඩබ්ල්සිඑන් වරකාගොඩ ඩීඑස්සී ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් භාරගෙන, ඉතාමත් කෙටි කාලයක් තුලදී, අංගසම්පූර්ණ කඳවුරු භූමියක් ඉදිකර ගැනීමට හැකියාව ලැබුණු බව මෙහිලා සඳහන් කල යුතුව ඇත. එම ඉදි කිරීම් අතර අංගසම්පූර්ණ රෙජිමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ලක්, සරඹ භූමිය, නිළධාරී නිවස්න භෝජනාගාරය, ඒකක බුදු මැදුර සහ කඳවුරේ අභිමානය පිළිබිඹු කරනු ලබන ප්‍රධාන පිවිසුම් දොරටුවද, පානීය ජල පහසුකම් ලබාගැනීම පිණිස සකස්කරන ලද ළිං ද, ප්‍රධාන තැනක් ගනී.

ඒකකය මුලතිව් ප්‍රදේශයේ ස්ථානගතවීමෙන් පසු ඉදි කරන ලද පුහුණු පෙදෙසෙහි මේ වන විට මූලික සංඥා පාඨමාලා, නිළ උසස් කිරීමේ පාඨමාලා, විශේෂ පාඛල ක්‍රියාන්විත පාඨමාලා සාර්ථකව පවත්වා අවසන්කර, උසස් මූලස්ථානයන්ගේ ගෞරවාදරයටද, පාත්‍රවී ඇත. තවද, මේ වන විට ඒකකය තුල වෙනත් ඒකක සංඥා පාඨමාලාවක්ද, ඉතා සාර්ථකව පවත්වාගෙන යමින් පවතී. එසේම මෙම ඒකකය මුලතිව් ප්‍රදේශයේ ජංගම දුරකථන හා සිඩීඑම්ඒ (CDMA) දුරකථන පද්ධතිය ව්‍යාප්ත කිරීමේ කටයුතු සඳහාද, දායකත්වය උපරිම අයුරින් ලබාදී, දැනට ඉතා සාර්ථකව එම කටයුතු නිමවෙමින් පවතින අතර, එහි ප්‍රතිලාභ යුධ හමුදා සාමාජිකයින්ට මෙන්ම, නැවත පදිංචිකරන ලද අවතැන්වූ ජනයා වෙතද ලැබී ඇත.

වර්තමානයේ අණදීමේ කාර්යභාරය ඉටු කරනු ලබන ලූතිනන් කර්නල් ආර් ඇල්විටිගල ජ්‍යෙෂ්ඨ නිළධාරී තුමාගේ මඟපෙන්වීම යටතේ මෙම ඉදිකිරීම් හි දෙවන අධියර වශයෙන් මේ වන විට මැසුම් හලකින් හා කරණවෑම් හලකින් සමන්විත සුභසාධක වෙළඳසැල් සංකීර්ණයක් ඉදිකර අවසන් කර ඇති අතර, මේ වනවිට බෝධි ප්‍රාකාර බැම්මක්, සියළු පහසුකම් වලින් සමන්විත මුරහලක් ඉදිකර ගැනීමේ මූලික වැඩකටයුතු ආරම්භකර ඇත. එසේම සෙසුනිළ භෝජනාගාරයේ සහ භොහොනි භෝජනාගාරයේ සාමාජිකයින්





අණදෙන නිළධාරී තනතුරේ වැඩ භාරගැනීම සඳහා පැමිණි ලූතිනන් කර්නල් ආර් ඇල්විටිගල විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම.



අණදෙන නිළධාරී තනතුර භාර ගැනීමට පැමිණි ලූතිනන් කර්නල් ආර් ඇල්විටිගල වෙත ආචාර පෙළපාලිය පිරිනැමීම.

හට වඩා පිළිවෙලකට සහ ක්‍රමවත්ව ආහාර ලබාදීමේ අරමුණින් ස්වයං සේවා පහසුකම් (BUFFET SYSTEM) ඇතිකර ඇති අතර, එම භෝජනාගාර සඳහා පානීය ජල පහසුකම්ද සපයා ඇත.



ඒකක අණදෙන නිළධාරී ලූතිනන් කර්නල් ආර් ඇල්විටිගල සුභ මොහොතින් වැඩ භාරගැනීම.

වසර 68 ක ප්‍රෞඩ ඉතිහාසයක් ඇති 1 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය මෙසේ දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ස්ථාපනය වෙමින් පැමිණියද, දැනට ස්ථානගතවී සිටින කඳවුරු භූමිය මේ වනවිට මෙම ප්‍රදේශයේ ස්ථාපිත අනෙකුත් ඒකකයන්ට වඩා ආකර්ෂණීය ලෙස හා ක්‍රමවත්ව ඉදිකර ගැනීමට හැකියාව ලැබීම සංඥා බලකායේ සාමාජිකයින් වන අප සැමගේම භාග්‍යයක් යැයි අප විශ්වාස කරන්නෙමු.



සමූහ ඡායාරූපය - 67 වන ඒකක දින සංවත්සරය.

# 67 වන ඒකක සංවත්සරය




අණදෙන නිලධාරී වෙත ආචාර පෙලපාලිය පැවැත්වීම.



සියළු නිල භෝජන සංග්‍රහය.



නිලධාරී නිවස්න සාදය.



බනි/සැරයන් නිවස්න සාදය.

රෙජිමේන්තු මූලස්ථානය හා නිළධාරී නිවස්නය විවෘත කිරීම සඳහා
සංඥා බලසේනාධිපති හා එවකට ප්‍රධාන සංඥා නිලධාරී ඒකකය වෙත පැමිණීම.






නව රෙජිමේන්තු මූලස්ථානය ඉදිරිපිට සමූහ ඡායාරූපය.







නවතමයෙන් ඉදිරිකරන ලද රෙජිමේන්තු මූලස්ථාන
ගොඩනැගිල්ල සංඥා බළසේනාධිපති විසින්
2011.06.23 දින විවෘත කිරීම.



ඒකක අණදෙන නිලධාරී ලූතිතන් කර්නල් ඩීවල්
සරත්චන්ද්‍ර විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම.



අභිනවයෙන්

...ර්නල් ඩීවල් සරත්චන්ද්‍ර
...ඩ භාරගත් අවස්ථාව.



2011.03.03 වන දින අණදෙන නිලධාරී ඇතුළු
සියළුම නිළයින්ගේ සහභාගීත්වයෙන් ඒකක භූමිය තුල
පැවැත්වූ බෝධිපූජා පිංකම.



අභිනවයෙන් ඉදික...
ජය ශ්‍රී මහ බෝ සමිඳු අංකු...



...දෙන නිලධාරීගේ සහභාගීත්වයෙන්
...කා රෝහල අසලදී, දුගී මගී යාචකයින්
...ා ආහාර වේලක් ලබාදීම.



ප්‍රධාන දොරටුව




රෙජිමේන්තු මූලස්ථාන පිවිසුම් මාර්ගය

# 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 20 වසරක ගමන් මග

1991 ජුනි මස 05 වන දින පනාගොඩ යුධ හමුදා කඳවුරේ ස්ථාපනය කර එතැන් සිට අද දක්වා 20 වසරක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ සිව්වැනි සාමාජිකයා වශයෙන් මේ වන විට 4 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බළකාය හිටිමල් යොවනයෙකු විලසින් ඉතා අනලස්ව කඩිසරකමින් තම රාජකාරීන් ඉටුකරනු ලබයි. එදා සිට මේ දක්වා අණදෙන නිළධාරීන් 14 දෙනෙකුගේ පූර්ණ මග පෙන්වීම සහ පාලනය තුලින්ද, මෙම ඒකකයේ සේවය කරන ලද සහ දැනට සේවයේ නියුතු අනෙකුත් නිළධාරීන් සහ සෙසු නිළයින්ගේ නොපසුබට උත්සාහය සහ කැපවීම තුලින්ද, මෙම ඒකකය සංඥා මාතාවගේ නම ඔප නැංවූ බව නොරහසකි.

තිස් වසරක යුද්ධයේ ගිණිදැල් දේශයෙන් තුරන් වී ගියද, ආධාරක බළඇණි ලෙස සංඥා බළකායේ කාර්යය බහුලත්වය හමාර වී නොමැත. අප හට පැවරී ඇති රාජකාරීන් දිනෙන් දින වැඩි වනවා මිස එහි අඩු වීමක් දක්නට නොලැබේ. නමුත් එම රාජකාරීන් නූතන තාක්‍ෂණය සමග ගැලපෙමින්, පවතින අවම සම්පත් ප්‍රයොජනයට ගනිමින්, 4 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බළකාය අනුරාධපුර ඓතිහාසික භූමියේ ස්ථානගත වී එහි රාජකාරීන් මනාව ඉටුකරගෙන යනු ලබයි. දැනට ආසේනු (ව) බළ ප්‍රදේශයේ සංඥා සම්බන්ධතා පවත්වාගෙන යාමේ භාරදූර කාර්ය මෙම ඒකකය විසින් ඉටු කරනු ලබයි.

තවද, ඓතිහාසික අනුරාධපුර නගරය උතුර දකුණ යා කරන, පොසොන් උත්සව වැනි ජාතික උත්සව රාශියකට අනුග්‍රහය දක්වන ප්‍රධාන නගරයක් ලෙසින් ප්‍රචලිතය. එබැවින් මෙම ප්‍රදේශය, අති විශාල ප්‍රභූවරුන් පිරිසකගේ සංචාරයට භාජනය වන බව විශේෂයෙන් කිවයුතු නොවේ. එවැනි අවස්ථාවන් හිදී අප ඒකකයට නියම වූ සංඥා සම්බන්ධතාවයන් සැපයීමට අමතරව, අභ්‍යන්තර ආරක්ෂක රාජකාරීන්, මෙම ඒකකයේ සිටින නිළධාරීන් සහ සෙසු නිළයින් මනා කැපවීමකින් යුතුව ඉටු කරනු ලබන බව කාටත් නොරහසකි.

සංඥා සම්බන්ධතාවයන් පවත්වා ගැනීමේදී දැනට වඩාත් ප්‍රචලිත වූ මාධ්‍යකොටක් වන ජංගම දුරකථන සම්බන්ධතා සැපයීමේදී, රජයේමෙන්ම පුද්ගලික ජංගම සහ සීඩීඑම්ඒ (CDMA) දූරකථන සම්බන්ධතා සපයනු ලබන ආයතන සමග සම්බන්ධතාවයෙන් සහ සහයෝගයෙන් යුතුව කටයුතු කරනු ලබන අතර, එමගින් ක්‍රියාන්විත ප්‍රදේශයන් හි සේවය කරනු ලබන සෙබලුන් හට තම නිවෙස් සමග සෙරට වඩා ඉතාමත් පහසුවෙන් ඔවුන්ගේ පවුල් සමග පණිවිඩ හුවමාරු කර ගැනීමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි. එමෙන්ම මෙම ඒකකයේ පුහුණු අංශය මගින් ආධුනික පුහුණු පාඨමාලා ගණනාවක් පවත්වා අභිත සෙබළුන් රාශියක් යුධ හමුදා ඒකකයන් හට දායාදකරදී ඇති අතර, මේ වන විට ඉදුරාම සංඥා බළකායට බඳවා ගනු ලැබූ ආධුනික සෙනින් 100 කට ආසන්න පිරිසකට පුහුණුව ලබා දෙනු ලබයි.

මෙවර ඒකකයේ 20 වන සංවත්සරය ආගමික කටයුතු වලට මුල් තැන දෙමින් සමරනු ලැබූ අතර, එහිදී විශේෂ ආගමික වැඩසටහන් කිපයක්ද සංවිධානය කෙරිණි. ඒ අතරින් අනුරාධපුර, අභය ළමා නිවාසයේ, කුඩා දරුවන් හට දානයක් සහ තෑගි භාණ්ඩ ලබාදීම, ස්වාමීන් වහන්සේලා 20 නමක් ඒකක රෙජි මූලය වෙත පෙරහරින් වැඩමවා දහවල් දානය පිළිගැන්වීම, ජය ශ්‍රීමහ බෝධීන් වහන්සේ ඉදිරිපිට බෝධි පූජාවක් පැවැත්වීම සහ අනුරාධපුර ගණදෙවි කෝවිලේ පූජාවක් පැවැත්වීම, වැනි දෑ විශේෂයෙන් සඳහන් කල යුතුය.

තවද ඒකකයේ සෙබලුන්ගේ චිත්ත ධෛර්‍යය ඇති කිරීම වස් සංවිධානය කල බළඇණි අතර ක්‍රීඩා උත්සවය, අණදෙන නිළධාරී වෙත පැවැත්වූ ආචාර පෙළපාලිය, අණදෙන නිළධාරීගේ සහභාගීත්වයෙන් සියලු නිළ භෝජන සංග්‍රහය සහ එදින සන්ධ්‍යාවේ සෙසුනිළ සුහද හමුව ඒකක 20 වන සංවත්සරයේ කැපී පෙනෙන අංගයන් විය. මෙහිදී මෙම සෑම වැඩසටහනක්ම සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබුනේ, ඒකකයේ අණදෙන නිළධාරීතුමන් ඇතුලු සියලුම නිළධාරීන්ගේ සහ සෙසුනිළයින්ගේ උනන්දුව සහ කැපවීම මතය.

අවසන් වශයෙන් 20 වසරක් සපුරනු ලබන 4 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බළකායේ, මෙම ගමන් මග ඔපවත් කිරීමෙහි ලා ජිවිත පූජාකරමින් රාජකාරී කල හා තම ශරීරාංග අහිමි කරගත් නිළධාරීන් සහ සෙනින් අප මේ මොහොතේ මතක් කරනු ලබන්නේ හද පිරි භක්ති ප්‍රණාමයකිනි. 4 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බළකායේ ධජය ලෙළ දෙන සෑම අවස්ථාවකදිම ඔවුන් හෙළු සුසුම්, එම ධජය ඔප නංවනු ලබන අතර එය දැනට සේවයේ නියුතු සියළුමදෙනාටත්, මෙහි සේවයේ නියුතු සියළුමදෙනාටත්, ඒකකයේ අනාගත සුභ සාධනයටත් ආශිර්වාදයක් වනවා නොඅනුමානය. අවසන් වශයෙන් 4 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බළකායේ උත්තරීතර සේවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත්, රටටත් ඉටුකර චිරාත් කාලයක් වැජඹේවායි, පතමින් මෙම කෙටි ආවර්ජනයට නැවතීමේ තිත තබන්නෙමි.







ලුතිනන් කර්නල් ඩබ් පී ඩයස් නව ඒකක අණදෙන නිළධාරී වශයෙන් 2010.10.10 දින සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අවස්ථාව.



2011.05.19 වන දින පැවැත්වූ උතුරු/නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම් පැළඳවීමේ පෙරට්ටුව.





සියලු නිළයින්ගේ සහභාගීත්වයෙන් 2011.04.23 වන දින පැවැත්වූ සිංහල අලුත් අවුරුදු උත්සවය.



ඒකකයේ 20 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත්වූ ක්‍රීඩා උත්සවය.



20 වන සංවත්සරය නිමිත්තෙන් අභය ළමා නිවාසයට දුන් දානය සහ ආගමික වතාවත් පැවැත්වීම.



නව අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් බිඩබ්ඩබ්එම්පේජ් ප්‍රේමදාස ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරී විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම.



2011 මාර්තු මස දින උසස් පාබල පුහුණු පාසැල පුතිකුඩ්ඉරිප්පු හි පැවති බලඇණි පුහුණු පාඨමාලාවේ පුහුණුවීම්හි නිරත භටපිරිස්.



මෙම ඒකකය වෙතින් ඉදිකරන ලද ළමා උද්‍යානය 68 වන සේනාංකාධිපති බ්‍රිගේඩියර් ෂේපිජ් ජයසේකර ඩබ්ඩබ්වී ආර්එස්පී පීඑස්සී විසින් විවෘත කළ අවස්ථාව.



මෙම ඒකකයේ ඉදිකර ඇති නිවාඩු නිකේතනය.



2011.06.23 දින මෙම ඒකක බලප්‍රදේශයේ සිවිල් වැසියන් පදිංචි කරවු අවස්ථාව.



මෙම ඒකක මූලස්ථානයේ නවතමයෙන් ඉදිකරන ලද ප්‍රධාන පිවිසුම් දොරටුව.



# 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ලෝකයේ තොරතුරු සංනිවේදන තාක්ෂණය සීඝ්‍ර දියුණුවක් ලබමින් පවතින අවස්ථාවේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවද ඒ හා සමගාමීව නවීන තාක්ෂණයට ඇතුල්ත් විම යුගයේ අවශ්‍යතාවයක් වූ අතර, එහි මූලික අඩිතාලමක් ලෙස 1990 දශකය වන විට පරිගණක යන්ත්‍ර 50 කින් පමණ සහ වෘත්තිය පරිගණක නිලධාරීන් 20 කින් සහ සෙසුනිලයින් 25 කින් සමන්විතව පරිගණක ක්‍රියාවලිය ආරම්භ විය. ඒ අනුව සංඥා බලකාය යටතේ 1991 අගෝස්තු මස 23 වන දින විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය නමින් ආරම්භ කරන ලද අප ඒකකය, තොරතුරු තාක්ෂණයෙහි වැඩිදියුණුවත් සමග විද්‍යුත් දත්ත සැකසුම් ඒකක නාමයෙන් ඉවත්ව, තොරතුරු තාක්ෂණ ඒකකය නමින් 2003 ඔක්තොම්බර් මස 14 වන දින සභාපති පරිගණක කමිටුවෙන් ඉවත්ව අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික යටතේ නව ඒකකයක් වශයෙන් ආරම්භ කරන ලදි.

තොරතුරු තාක්ෂණය යුද හමුදාව තුල ව්‍යාප්ත වීමත් සමග පරිගණක ක්‍රියාවලින් වෙනුවෙන් ඒකක බල සංඛ්‍යාව වර්ධනය වූ අතර, ඒකකයක් වශයෙන් පිහිටුවීම පිණිස මෙතෙක් යුද හමුදා මූලස්ථානයෙහි ස්ථාපනය කර තිබූ අප ඒකකය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය - පනාගොඩ වෙත 2009 නොවැම්බර් මස 17 වන දින රැගෙන එන ලදි. සංඥා බලකාධිපතිතුමන්ගේ සහ ප්‍රධාන සංඥා නිලධාරීතුමන්ගේ පාලනයෙන් යුක්තව අප ඒකකය සංඥා බලකායට අනුයුක්තව 2010 සැප්තැම්බර් මස 21 වන දින සිට 11 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය නමින් පිහිටුවන ලදි. එහි පළමුවන සංවත්සරය 2011 සැප්තැම්බර් මස 24 වන දින ඉතා උත්සවාකාරයෙන් පැවැත්විය.



2011.09.24 වන දින සියලු නිලයන් සඳහා පැවැත්වූ දිවා භෝජන සංග්‍රහය



11 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකායේ ප්‍රථම අණදෙන නිලධාරී වන ලුතිනන් කර්නල් පිවන්දු ජයරත්න යන ජ්‍යෙෂ්ඨ නිලධාරී හට ආරක්ෂක මුරය පිරිනැමීම.

ආරම්භයත් සමග අප ඒකකය තොරතුරු තාක්ෂණ නිලධාරීන් 39 දෙනෙකුගෙන් සහ සෙසුනිලයින් 524 කින් සමන්විත විය. යුද හමුදාවෙහි තොරතුරු තාක්ෂණය ප්‍රචලිත වීමත් සමගම නිලධාරීන් සහ සෙසුනිලයින් ඒ සඳහා යෙදවීමේ අවශ්‍යතාවය මත මේ වන විට නිලධාරීන් 63 දෙනෙකුගෙන් සහ සෙසුනිලයින් 726 දෙදෙනෙකුගෙන් බල සංඛ්‍යාව වර්ධනය වී ඇත. දැනට තත් අයවලුන් යුද හමුදාවෙහි සියලුම ස්ථානයන් ආවරණය වන පරිදි නොයෙකුත් තොරතුරු තාක්ෂණ සේවාවන්හි නිරතව සිටි. අනෙකුත් සංඥා බලකායන් අතුරින් යුද හමුදාව තුළ පරිගණක රාජකාරීන් වෙනුවෙන් කාන්තා ශ්‍රම දායකත්වයද අප ඒකකය වෙතින් ලබාදෙන අතර, එම කාන්තා සෙබළියන් මෙතෙක් යුද හමුදාවෙහි වෙනත් ඒකකයන් නියෝජනය කරමින් අප ඒකකය වෙත ඇතුලත්ව රාජකාරීන් හි නිරතව සිටියද, ඔවුන් සංඥා බලකායට ඇතුලත් කර ගැනීම වෙනුවෙන්, 2010 අගෝස්තු මස 12 වන දින, ඔවුන් වෙත නිළ ලාංජන පැළඳවීම, සිදුකිරීම මෙම වසරේ අප ඒකකයෙහි සිදුවූ සුවිශේෂී සිදුවීම් අතුරන් එක් සිදුවීමකි. සමස්ත යුද හමුදාව තුල තොරතුරු තාක්ෂණය ව්‍යාප්ත කිරීම පිණිස, ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් මත රණවිරු තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 05 ක් මේ වන විට යුද හමුදා කඳවුරු තුල ස්ථාපනය කර ඇත. පරිගණක/පරිගණක උපාංග බෙදාහැරීම, අලුත්වැඩියා කිරීම, යනාදි සියලුම පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා එහිදී අප ඒකක නිළධාරීන් සහ සෙසුනිලයින් ඔවුන්ගේ නොමසුරු දායකත්වය ලබාදෙනු ඇත. අනෙකුත් සංඥා බලකායන් සමග ඉදිරියට යන මේ ගමනේ තොරතුරු තාක්ෂණය තුලින් කැපී පෙනෙන ඒකකයක් ලෙස ක්‍රියා කිරීම පිණිස, අප ඒකකය සතුව දක්ෂතාවයෙන්, නවීන තාක්ෂණ හැකියාව හා දැනුමක් ඇති පරිපූර්ණ නිළධාරීන් මෙන්ම සෙසුනිලයින් ගෙන් සමන්විත වේ. එසේම ඔවුන්ගෙන් යුද හමුදාව තුළ සිදුවන සේවාවද,

# SIGNAL JUNIOR'S CLUB

## ABOUT US

The Signal Junior's Club was founded on 1st March 2009. The Signal Junior's Club for children of Signallers affiliate to the Signal Seva Vanitha Branch. The main purpose of the organization is to bring all the Children of the Signallers together and assist these Children to develop their interpersonal skills and to give them the opportunity to take part in various extra activities in order to prepare them to face upcoming challenges, and to provide humanitarian service to the community. It is open to all the children of signallers between the ages of 5 years to 25 years. Members usually meet once a month at the Officers Mess to discuss and organize work on their service goals. The Motto of the Club is "Together we can do better". The Signal Junior Club has a religious element in the official creed too. " Beacon" is the name of the News letter.. It is a form of Signal. The Signal Regiment was the first to inaugurate a Junior Club in the Sri Lanka Army.

## OUR LOGO

It's a symbol of communication. That is Leadership

***OUR MOTTO :*** *"Together we can do better"*

***OUR MISSION:*** *To provide development opportunities that empower young children to create positive change*

***OUR VISION :*** *To be the leading club of young active citizens*

## SIGNAL JUNIOR'S CLUB STANDS FOR:

S - Social
I - Intelligence
G - Gigantic
N - Naughty
A - Attractive
L - Lovable

J - Joy
U - Unity
N - Negotiating
I - Interacting
O - Organised
R - Rare to Find
S - Super

C - Confident
L - Lend a Hand
U - Under Control
B - Best of the best

## PROJECTS DONE & PHOTOS

The activities carried out by the members of the Signal Junior's Club for 2011 up to the month of July are mentioned below:

### MEMBERSHIP T SHIRT AND CAP



*During the month of March printed Membership T Shirt and Cap for each member of the club. This was done to boost the image of the Club. Members appeared very smart in these T Shirt and Caps.*



### RANA ARUNA UDANAYA AVURUDU POLA STALL





*On 9th & 10th April, 2011 the Signal Junior's Club ented a stall at the Rana Aruna Udanaya Avurudu Pola at the Panagoda School complex, Panagoda. All members of the club took part in the supply of items and sale at the stall. A variety of food items, clothes and stationery items were sold at the stall. All members worked enthusiastically to earn a substantial profit. It was really a successful project. Members were able to raise substantial profit from the sales at the stall.*

### VESAK GREETING CARDS

During the month of May, members printed Vesak Greeting Cards in Four Designs to coincide with the 2600 Sri Sambuddhatva Jayanthi Vesak Commemoration Ceremony. These cards were dispatched to distinguished personnel of the Army.

### OIL,FLOWERS WICKS, JOYSTICKS & MATI PAHAN DANSALA



*On 18th May, 2011 members organized a Dansala where Oil, Flowers, Wicks, Joysticks & Mati Pahan were distributed at Panagoda Bodhirajaramaya Temple to coincide with the 2600 Sri Sambuddhatva Jayanthi Vesak Commemoration Ceremony. All members took part in this project. This too was a successful project and it was telecast on ITN News on May, 2011.*

### DONATION OF AN ARTIFICIAL LIMB TO A DISABLED SOLDIER





*On 18th May 2011,Vesak Full Moon Poya day, members took pride in donating an Artificial Limb to a Disabled Soldier namely Signalman Madushanka KGC of the 6th Signal Regiment. This money was raised from the Avurudu Pola Stall in April 2011.*

### POSON BAKTHI GEE



*On 15th of June 2011 members organized a Poson Bakthi Gee Programme at Panagoda Bodhirajaramaya. Most of the members took part in this project. This too was telecast on ITN News on June 2011.*

### PROJECT FOR MENTALLY RETARDED & PHYSICALLY DISABLED CHILDREN AT CAMILA SCHOOL, LIONS PARK, MATTEGODA

Members of the Signal Junior's Club have decided to visit and help the above school on 1st October 2011 to commemorate with the World Children's Day. Members will donate Soap, Washing Powder, Washing Buckets, Dry Rations, Sweets, Fruits, Medicines etc.

### PARTICIPATION AT OTHER CLUB EVENTS

### SIX A SIDE CRICKET TOURNAMENT ORGANISED BY COUGERS CLUB – SINGHE REGIMENT



*Signal Junior's Club represented 2 teams( Above 13 yrs & below 13 years) for the above Cricket tournament at Ambepussa Camp on 4th September 2011.*

### DRAMA PRESENTATION ORGANISED BY VIRU DARU CLUB



### WORLD CHILDREN'S DAY - A PROJECT FOR MENTALLY RETARDED & PHYSICALLY DISABLE CHILDREN AT CAMILA SCHOOL, LIONE PARK, MATTEGODA



*Army Seva Vanitha Unit requested each regiment to present an item, and out of which they will select 5 items to be staged at the Inaugural Meeting of the Viru Daru Club. These items were judged by Mr. Nissanka Diddeniya, Mr. Jayalath Manoratne & Ms. Ratna Lalani Jayakody on 18th September 2011 at Manning Town Nursery Hall. There were 23 items presented on that day and they selected 5 items to be staged at the inaugural meeting of the Viru Daru Club at Defence College on 24th September 2011. Signal Regiment Item (Gami Suwada – Dance) was selected among the 5 items where 13 members took part in the Dance.(Girls & Boys)*

### FUTURE PROJECTS

- Publishing a News Letter.
- Table Ethics programme for Children.
- Seminar on Leadership.





## SIGNAL Sports Hits

## කෙළි බිම

### ප්‍රායෝගික පිස්තෝල වෙඩි තැබීම
**බ්‍රිගේඩියර් එච්පී සෙනෙවිරත්න**



- 2010 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ශ්‍රී ලංකා රයිෆල් සංගමයේ ගරු ලේකම් ධුරය හෙබවීය.
- 2011 ජුනි මස 24 වන දින සිට 26 වන දින දක්වා කැන්ඩි හිල්කන්ට්‍රි ක්‍රීඩා සමාජය විසින් හන්තාන වෙඩි පිටියේදී සංවිධානය කරන ලද "Action Challange Open Division" තරගයේ අනුශූරතාවය ලබා ගැනීම.
- 2011 සැප්තැම්බර් 28 දින සිට ඔක්තොම්බර් 08 වන දින දක්වා ග්‍රීසියේ පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රායෝගික පිස්තෝල වෙඩි තැබීමේ ලෝක ශූරතාවය (Practical Pistol Shooting World Championship) සඳහා ශ්‍රී ලංකා කණ්ඩායමේ එකම යුධ හමුදා සමාජිකයා වීම.



### බැඩ්මින්ටන්
**ලුතිතන් කර්නල් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී**

- 2011 වසරේදී යුධ හමුදා අන්තර් රෙජිමේන්තු අවු 40 න් ඉහල වයස් කාණ්ඩය යටතේ බැඩ්මින්ටන් ඒකල සහ යුගල තරග වලදී අනුශූරතාවයන් ලබාගැනිමට සමත්විය.

### බිලියට් සහ ස්නූකර්
**කපිතාන් ටීටීඑන් මෙන්ඩිස්**

යුධ හමුදා බිලියට් සහ ස්නූකර් සම්මේලනය වෙතින් සංවිධානය කරන ලද 2010 වර්ෂයේ යුද හමුදා බිලියට් සහ ස්නූකර් තරඟාවලියේ බිලියට් තරගයේදී 6 වන ස්ථානය ලබාගැනීමට සමත්විය.

### මළල ක්‍රීඩාව
**සැරයන් සරත් සමරසිංහ පීපී**



- 2011. 05. 07 දින අනුරාධපුර මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්වූ උතුරු මැද පළාත් ප්‍රථම ප්‍රවීණයන්ගේ මළල ක්‍රීඩා උළෙලට අවුරුදු 40 න් ඉහල වයස් කාණ්ඩය යටතේ තරග වැදුනු 3 වන සංඥා රෙජිමේන්තුවේ සැරයන් සරත් සමරසිංහ පීපී 1989 වසරේ සිටම යුධ හමුදාව සහ උතුරු මැද / මධ්‍යම පළාත් නියෝජනය කරමින් දෙස් විදෙස් තරග රැසකට සහභාගී වූ දක්ෂ ප්‍රවීණ මළල ක්‍රීඩකයෙකි.
- හෙතෙම මීටර් 400, 1500, 5000, සහ 4 X 100 යන තරග සමගින් මීටර් 5000 තරග ඇවිදීම ඉසව්වද සමග ඉසව් 05 ක් ජය ගනිමින් රන් පදක්කම් ලබාගත් මෙම ජ්‍යෙෂ්ඨකොණෝණි එම තරඟාවලියේ දක්ෂතම මළලක්‍රීඩකයාද විය.
- දැනට ශ්‍රීලංසංඛ මළලක්‍රීඩා පුහුණු සංවිතයේ සහයක පුහුණුකරු/කළමණාකරු වශයෙන් කටයුතු කරන මොහු 2006 වසරේ සංඥා බළකා වර්ණද, 2010 වසරේ සංඥා බළකා මළලක්‍රීඩා ප්‍රණාමද ලබාගන්නා ලදී.

## හැන්ඩ් බෝල්

### ස/279504 ලා/කෝ ජයසූරිය එච්එච්සිකේ



❑. 2010 වසර බංගලාදේශයේ ඩකා නුවර පැවති 11 වන දකුණු ආසියාතික තරඟාවලිය වෙනුවෙන් ශ්‍රී ලංකා කණ්ඩායම නියෝජනය කිරීම.

❑ 2010 වසර ආරක්ෂක සේවා ශූරතාව දිනාගත් යුධ හමුදා කණ්ඩායම නියෝජනය කිරීම.

❑ 2011 වසර ජාතික ශූරතාව දිනාගත් යුධ හමුදා කණ්ඩායම නියෝජනය කිරීම.

❑ 2011 වසර ජාතික කණ්ඩායම නියෝජනය කිරීම.

## පැසිපන්දු

### සෙ/281442 සංසෙ පෙරේරා කේඑස්



❑ 2011 ජූලි මස 13 සිට 16 දක්වා ඉන්දියාවේ දිල්ලි නුවර පැවති දකුණු ආසියාතික පැසිපන්දු තරගාවලිය සඳහා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරන ලදී. එහිදී ශ්‍රී ලංකා පැසිපන්දු කණ්ඩායම දෙවන ස්ථානය හිමි කර ගැනීම සඳහා දායකවීම.

## කරාතේ සංචිතය

### සෙ/281792 ලා/කෝ රියවාන් ආර්එච් 10 ශ්‍රීලංසංබ(ආ/බ)



❑ 2010 ඌව පළාත් කිලෝ 55 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී ඉන්දියාව, නේපාලය හා ජපානය රටවල් තුන සහභාගි කර ගනිමින් ගාල්ලෙහි පැවති තරගාවලියේදී කිලෝ 55 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී ඉන්දියාව, නේපාලය, ජපානය හා බංගලාදේශය රටවල් හතර සහභාගිකර ගනිමින් තිස්සමහාරාමයේදී පැවති තරගාවලියෙහි දී කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී පැවති සංඥා බලකා ඒකක අතර තරගාවලියෙහිදී කිලෝ 55 අඩු කුමිතේ ඉසව්ව දෙවන ස්ථානය.
❑ 2011 දී පැවති මොණරාගල දිස්ත්‍රික් කිලෝ 55 අඩු කුමිතේ ඉසව්ව - දෙවන ස්ථානය.
❑ 2011 දී පැවති ඌව පළාත් කිලෝ 55 අඩු කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.

### සෙ/282387 සංසෙ ගයාෂාන් පීඒවන් 5 ශ්‍රීලංසංබ(ආ/බ)



❑ 2009 දී පැවති යුධ හමුදා තරගාවලියේ දී කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී පැවති සංඥා බලකා ඒකක අතර කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී ඉන්දියාව, නේපාලය හා ජපානය රටවල් තුන සහභාගි කර ගනිමින් ගාල්ලෙහි පැවති තරගාවලියේදී කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී ඉන්දියාව, නේපාලය, ජපානය හා බංගලාදේශය රටවල් හතර සහභාගිකර ගනිමින් පැවති තරගාවලියේ දී කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2010 දී පැවති දකුණු පලාත් කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - දෙවන ස්ථානය
❑ 2010 දී පැවති ජාතික තරගාවලිය කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.
❑ 2011 දී පැවති හම්බන්තොට දිස්ත්‍රික් කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2011 දීන පැවති දකුණු පලාත් කිලෝ 60 අඩු කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.







### සෙ/සි100865 සංසෙ කුමාර ඒපේම් 2 (සෙවේ) ශ්‍රීලංසංබ

❑ 2008 දී සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවති කළු පටි කිලෝ 50 අඩු කාතා ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2008 දී පැවති තාරුණ්‍යට හෙටක් මගින් සංවිධානය කරන ලද තරගාවලියෙහි කිලෝ 50 අඩු කාතා ඉසව්ව - ප්‍රථම ස්ථානය.
❑ 2009 දී පැවති 35 වන ජාතික මහා ක්‍රීඩාවලියේදී ගාල්ල දිස්ත්‍රික් කිලෝ 50 අඩු කළු පටි කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.
❑ 2010 දී පැවති සංඥා බලකා අන්තර් ඒකක තරගාවලියේදී කළු පටි කිලෝ 55 අඩු කුමිතේ ප්‍රථම ස්ථානය/එම තරගාවලියේදී දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය.
❑ 2010 දී පැවති ත්‍රිවිධ හමුදා තරගාවලියේදී කළු පටි කිලෝ 50 අඩු කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.
❑ 2010 දී පැවති ඉන්දියාව, නේපාලය හා ජපානය රටවල් තුන සහභාගිකර ගනිමින් ගාල්ලෙහි පැවති තරගාවලියේ දී කිලෝ 60 අඩු කළු පටි කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.



### සෙ/263669 සංසෙ රත්නායක ඒඒපීඑස් 8 ශ්‍රීලංසංබ (ආ/බ)

❑ 2010 දී පැවති සබරගමු පළාත් කිලෝ 50 අඩු කුමිතේ ඉසව්ව - ප්‍රථම ස්ථානය/ කටා - තෙවන ස්ථානය.
❑ 2010 දී පැවති ත්‍රිවිධ හමුදා තරඟාවලියේදී දුඹුරු පටි කිලෝ 50 අඩු කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.
❑ 2011 දී පැවති රත්නපුර දිස්ත්‍රික් කිලෝ 50 අඩු කුමිතේ ඉසව්ව - තෙවන ස්ථානය.

## අන්තර් රෙජිමේන්තු අත්පන්දු තරඟාවලිය - 2011



යුහ අන්තර් රෙජිමේන්තු අත්පන්දු තරගාවලිය 2011 ජූලි මස 05 වන දින සිට 13 වන දින දක්වා පවත්වන ලද අතර, එහි ඒ කාණ්ඩය යටතේ තුන්වන ස්ථානය ශ්‍රී ලංකා සංඥා බලකා කණ්ඩායම විසින් දිනාගන්නා ලදී.

## අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරඟාවලිය - 2011

යුහ අන්තර් රෙජිමේන්තු මේසපන්දු තරඟාවලිය 2011 අගෝස්තු 24, 25 සහ 26 යන දිනයන්හිදී, පනාගොඩ යුද හමුදා ශාපුපා හිදී පවත්වන ලද අතර එහි කණ්ඩායම් පිරිමි ශූරතාවය සහ කාන්තා අනුශූරතාව ශ්‍රී ලංකා සංඥා බලකා කණ්ඩායම් විසින් දිනාගන්නා ලදී.





## කණ්ඩායම් තරගාවලිය - පිරිමි

**ශූරතාවය (රන් පදක්කම)**
ශ්‍රීලංසංබ 'බී' කණ්ඩායම

| | | |
|---|---|---|
| 2/ලුතිතන් | ජේවීවයිඑස් | ජයකොඩි |
| 2/ලුතිතන් | එල්එස් | කාවින්ද |
| සංසෛ | ගලබඩ | ආර්ආර්පිඩබ් |
| ලා/කෝ | ලක්මාල් | කේවීඑස්එස් |

**තෙවන ස්ථානය (ලොකඩ පදක්කම)**
ශ්‍රීලංසංබ 'සී' කණ්ඩායම

| | | |
|---|---|---|
| මේජර් | ආර්සී | විජේකෝන් පීඑස්සී |
| මා/සැ | කුරේ | ජේකේඅයිඑන් |
| කෝප්‍රල් | පුෂ්පකුමාර | එම්පීඑස්එම් |
| සංසෛ | රුවන් කුමාර | ඩබ්පී |

## පිරිමි විවෘත කේවල

**ශූරතාවය - (රන් පදක්කම)**

| | | |
|---|---|---|
| 2/ලුතිතන් | එල්එස් | කාවින්ද |

**අනු ශූරතාවය - (රිදී පදක්කම)**

| | | |
|---|---|---|
| 2/ලුතිතන් | ජේවීවයිඑස් | ජයකොඩි |

## පිරිමි විවෘත යුගල

**ශූරතාවය (රන් පදක්කම)**

| | | |
|---|---|---|
| 2/ලුතිතන් | ජේවීවයිඑස් | ජයකොඩි |
| 2/ලුතිතන් | එල්එස් | කාවින්ද |

**තෙවන ස්ථානය (ලෝකඩ පදක්කම)**

| | | |
|---|---|---|
| මේජර් ආර්සී | විජේකෝන් | පීඑස්සී |
| මා/සැ කුරේ | ජේකේඅයිඑන් | |

## අවුරුදු 40 ට ඉහල පිරිමි කේවල

**තෙවන ස්ථානය (ලෝකඩ පදක්කම)**
ලුතිතන් කර්නල් එස්පීපී පතෂවීර

| | | |
|---|---|---|
| මා/සැ | කුරේ | ජේකේඅයිඑන් |

## අවුරුදු 40 ට ඉහල පිරිමි යුගල

**අනු ශූරතාවය (රිදී පදක්කම)**
මේජර් ජෙනරාල් පීපී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී
කර්නල් ඩීආර් ධර්මසිරි

## කණ්ඩායම් තරගාවලිය - කාන්තා

**අනු ශූරතාවය (රිදී පදක්කම)**
ශ්‍රීලංසංබ කණ්ඩායම

| | | |
|---|---|---|
| බනි 11 | කලුතොට | කේඑච්පීජීකේ |
| ලා/කෝ | ප්‍රනාන්දු | කේඑස්කේ |
| ලා/කෝ | බණ්ඩාරනායක | එම්එම්ජී |
| සාසෛ | කලංසූරිය | ටීඑස් |

**තෙවන ස්ථානය (ලොකඩ පදක්කම)**
ශ්‍රීලංසංබ කණ්ඩායම

| | | |
|---|---|---|
| ලා/කෝ | හේරත් එච්එම්ජී | |
| ලා/කෝ | අත්තනායක | කේඑම්යුකේඑස් |
| ලා/කෝ | ගුණතිලක | |

## කාන්තා විවෘත කේවල

**අනු ශූරතාවය (රිදී පදක්කම)**

| | | |
|---|---|---|
| ලා/කෝ | අත්තනායක | කේඑම්යුකේඑස් |

**තෙවන ස්ථානය (ලොකඩ පදක්කම)**

| | | |
|---|---|---|
| බනි 11 | කලුතොට | කේඑච්පීජීකේ |
| සාසෛ | කලංසූරිය | ටීඑස් |

## කාන්තා විවෘත යුගල

**අනු ශූරතාවය (රිදී පදක්කම)**

| | | |
|---|---|---|
| බනි 11 | කලුතොට | කේඑච්පීජීකේ |
| ලා/කෝ | අත්තනායක | කේඑම්යුකේඑස් |

**තෙවන ස්ථානය (ලෝකඩ පදක්කම)**

| | | |
|---|---|---|
| ලා/කෝ | හේරත් එච්එම්ජී | |
| ලා/කෝ | බණ්ඩාරනායක එම්එම්ජී | |
| සාසෛ | කලංසූරිය | ටීඑස් |
| ලා/කෝ | ප්‍රනාන්දු | කේඑස්කේ |

**තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා**
2/ලුතිතන් එල්එස් කාවින්ද





## 2011 වසර අන්තර් සංඝ) ඒකක ක්‍රීඩා තරඟාවලිය

| ක්‍රීඩාව | ශූරතාව | අනුශූරතාව |
|---|---|---|
| ක්‍රිකට් | 7 ශ්‍රීලංසංබ | 9 ශ්‍රීලංසංබ |
| බිලියඩ් | 9 ශ්‍රීලංසංබ | සංමූවැ |
| වෙඩි තැබීම | 7 ශ්‍රීලංසංබ | 10 ශ්‍රීලංසංබ |
| ටයිකොන්ඩෝ | 9 ශ්‍රීලංසංබ | 3 ශ්‍රීලංසංබ |
| මලල ක්‍රීඩා | 4 ශ්‍රීලංසංබ | 3 ශ්‍රීලංසංබ |
| කඹ ඇදීම | 9 ශ්‍රීලංසංබ | 8 ශ්‍රීලංසංබ |
| කබඩි | 5 ශ්‍රීලංසංබ | 9 ශ්‍රීලංසංබ |
| පිහිනුම් | 8 ශ්‍රීලංසංබ | සංමූවැ |
| රගර් | 6 ශ්‍රීලංසංබ | සංමූවැ |
| කාරාතේ | 8 ශ්‍රීලංසංබ | 4 සහ 10 ශ්‍රීලංසංබ |
| මල්ලව පොර | 7 ශ්‍රීලංසංබ | 8 ශ්‍රීලංසංබ |
| බර ඉසිලීම | 8 ශ්‍රීලංසංබ | 9 ශ්‍රීලංසංබ |
| අත් පන්දු | සංමූවැ | 7 ශ්‍රීලංසංබ |
| කාය වර්ධන | 8 ශ්‍රීලංසංබ | 9 ශ්‍රීලංසංබ |
| බැඩ්මින්ටන් | සංමූවැ | 1 ශ්‍රීලංසංබ |
| මුෂ්ටි ප්‍රහාර | 10 ශ්‍රීලංසංබ | 8 ශ්‍රීලංසංබ |
| ටෙනිස් | 5 ශ්‍රීලංසංබ | 8 ශ්‍රීලංසංබ |
| පාපන්දු | 9 ශ්‍රීලංසංබ | 4 ශ්‍රීලංසංබ |
| ස්කොෂ් | 5 ශ්‍රීලංසංබ | 1 ශ්‍රීලංසංබ |
| පැසිපන්දු | සංමූවැ | 9 ශ්‍රීලංසංබ |
| එල්ලේ | 9 ශ්‍රීලංසංබ | 6 ශ්‍රීලංසංබ |
| මේස පන්දු | 2(ස්වේ) ශ්‍රීලංසංබ | 1 ශ්‍රීලංසංබ |




## අන්තර් ඒකක මළල ක්‍රීඩා උළෙල 2011

මීටර් 100 - පළමු ස්ථානය
සෙ/279707 ලා/කෝ කුලතුංග කේඑම්ඒ
5 ශ්‍රීලංසංබ(ආ/බ)

මීටර් 200- පළමු ස්ථානය
සෙ/279707 ලා/කෝ කුලතුංග කේඑම්ඒ
5 ශ්‍රීලංසංබ(ආ/බ)

මීටර් 400 - පළමු ස්ථානය
සෙ/283655 සංසෙ රොෂාන් කුමාර ටීසී
4 ශ්‍රීලංසංබ

මීටර් 800 - පළමු ස්ථානය
සෙ/280155 සංසෙ ජයවික්‍රම බීපීඑස්එන්
4 ශ්‍රීලංසංබ

මීටර් 1500 - පළමු ස්ථානය
සෙ/278196 ලා/කෝ ජයසේන ටීපීඑස්කේ
3 ශ්‍රීලංසංබ

මීටර් 5000 - පළමු ස්ථානය
සෙ/279631 ලා/කෝ වික්‍රමසිංහ කේකේඑම්ඊස්
3 ශ්‍රීලංසංබ

මීටර් 10000 - පළමු ස්ථානය
සෙ/279631 ලා/කෝ වික්‍රමසිංහ කේකේඑම්ඊස්
3 ශ්‍රීලංසංබ

දුර පැනීම - පළමු ස්ථානය
සෙ/2038986 ආ/සෙ විමලසිරි ඩීඒපීජේප
ආධුනික සෙබල

මීටර් 4 × 100 - පළමු ස්ථානය
8 ශ්‍රීලංසංබ(ආ/බ)

මීටර් 4 × 100 - පළමු ස්ථානය
9 ශ්‍රීලංසංබ

## අන්තර් ඒකක මල්ලවපොර තරඟාවලිය - 2011

කිලෝ ග්‍රෑම් 43 බර පංතිය - පළමු ස්ථානය
සෙ/283301 සංසෙ අබේරත්න ඩබ්සීඑම්
9 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 46 බර පංතිය - පළමු ස්ථානය
සෙ/280774 ලා/කෝ චමින්ද එස්ඩී
7 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 48 බර පංතිය - පළමු ස්ථානය
සෙ/281213 ලා/කෝ විජේරත්න බණ්ඩා ඩීඑම්
7 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 50 බර පංතිය - පළමු ස්ථානය
සෙ/283295 සංසෙ ලක්මාල් ඒඒසී
4 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 55 බර පංතිය - පළමු ස්ථානය
සෙ/281361 ලා/කෝ ප්‍රදීප් කුමාර ජේඑඩී
7 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 60 බර පංතිය - පළමු ස්ථානය
සෙ/281596 සංසෙ සරත් කුමාර එන්ඩබ්
5 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 66 බර පංතිය - පළමු ස්ථානය
සෙ/281145 ලා/කෝ පතිරණ ඩීඑම්
5 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 74 බර පංතිය - පළමු ස්ථානය
සෙ/279107 සංසෙ ප්‍රසන්න ඩීකේඒ
සංමුවැ

කිලෝ ග්‍රෑම් 84 බර පංතිය - පළමු ස්ථානය
සෙ/279191 ලා/කෝ මෙරෙංඥ්සා එම්සීඑස්
1 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 96 බර පංතිය - පළමු ස්ථානය
සෙ/278475 කෝප්‍රල් සංජීව වීඒඑම්
9 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 120 බර පංතිය - පළමු ස්ථානය
සෙ/275656 මා/සැ පෙරේරා පීඑල්ටීඒ
11 ශ්‍රීලංසංබ






## අන්තර් ඒකක කායවර්ධන සහ බර ඉසිලීමේ තරඟාවලිය - 2011

කායවර්ධන

කිලෝ ග්‍රෑම් 55-60 බර පංතිය - පළමු ස්ථානය
සෙ/279453 ලා/කෝ කුමාර ඒඑම්ඒ
සංමුවැ

කිලෝ ග්‍රෑම් 65-70 බර පංතිය - පළමු ස්ථානය
සෙ/283492 සංසෙ කනුගල කේඑස්කේ
8 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 70-75 බර පංතිය - පළමු ස්ථානය
සෙ/276992 සංසෙ දනනායක එස්බී
1 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 80-85 බර පංතිය - පළමු ස්ථානය
සෙ/282311 සංසෙ පුෂ්පකුමාර කේඒඑස්
10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 85ට වැඩි බර පංතිය - පළමු ස්ථානය
සෙ/283304 සංසෙ චතුරංග එන්ටීඒ
8 ශ්‍රීලංසංබ(ආ/බ)

බර ඉසිලීම

කිලෝ ග්‍රෑම් 56-62 බර පංතිය - පළමු ස්ථානය
සෙ/283281 සංසෙ ජයසිංහ ජේඒඑන්
7 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 69-77 බර පංතිය - පළමු ස්ථානය
සෙ/282685 සංසෙ දිසානායක ඩීඑම්යූ - 9 ශ්‍රීලංසංබ

කිලෝ ග්‍රෑම් 85-94 බර පංතිය - පළමු ස්ථානය
සෙ/282311 සංසෙ පුෂ්පකුමාර කේඒඑස්
10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 105 වැඩි බර පංතිය - පළමු ස්ථානය
සෙ/285060 බහි 1 ඩබ්ඒඩීඑස් චමින්ද
8 ශ්‍රීලංසංබ(ආ/බ)

## අන්තර් රෙජිමේන්තු මුෂ්ටි ප්‍රහාරක තරගාවලිය - 2011 වසර

කිලෝ ග්‍රෑම් 52ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/281085 ලා/කෝ ප්‍රදීප්කුමාර ඩබ්එම් - 10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 56ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/282529 සංසෙ සමන්සිරි ඩීපීඩී
10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 60ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/281057 ලා/කෝ නිශාන්ත එච්වීඒ
10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 64ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/281106 ලා/කෝ දිසානායක ඩීඑම්බී - 10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 75ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/281163 සංසෙ සමරවික්‍රම එස්එච්එම් - 10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 81ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/283639 සංසෙ විතානගේ කේඩබ්ආර් - 10 ශ්‍රීලංසංබ(ආ/බ)

කිලෝ ග්‍රෑම් 91ට අඩු බර පංතිය - පළමු ස්ථානය
සෙ/282311 සංසෙ පුෂ්පකුමාර කේඒඑස් - 10 ශ්‍රීලංසංබ(ආ/බ)

## අන්තර් ඒකක ටයිකොන්ඩෝ තරගාවලිය - 2011

පළමු ස්ථානය - 9 ශ්‍රීලංසංබ
දක්ෂතම ක්‍රීඩකයා - සෙ/279646 ලා/කෝ සිරිසේන එස්පී - 3 ශ්‍රීලංසංබ

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



අන්තර් ඒකක ක්‍රිකට් තරගය ආරම්භ කිරීමට ප්‍රථම අණදෙන නිලධාරී විසින් පොල්තෙල් පහන දල්වමින්.



අන්තර් ඒකක ක්‍රිකට් තරඟාවලිය සඳහා සහභාගී වූ කණ්ඩායම්.



අන්තර් ඒකක ක්‍රිකට් තරඟාවලියේ ජයග්‍රාහකයින් සඳහා කුසලාන ප්‍රධානය කිරීමේ අවස්ථාව.



THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය



22 වන සංවත්සරයට සමගාමීව බළඝණයන් අතර පැවති පාපන්දු තරගය.



22 වන සංවත්සරයට සමගාමීව බළඝණයන් අතර පැවති අත්පන්දු තරගය.



2010 වර්ෂයේ 3 ශ්‍රීලංසංබ වෙතින් සංවිධානය කරනු ලැබූ ආසේමු.(යා) මළල ක්‍රීඩා උත්සවයේ ඔලිම්පික් පහන දල්වා ආරම්භක කිරීම.



2010 වර්ෂයේ 3 ශ්‍රීලංසංබ වෙතින් සංවිධානය කරනු ලැබූ ආසේමු (යා) මළල ක්‍රීඩා උත්සවයේ අණදෙන. නිලධාරී විසින් සියළු නිළයින් ඇමතීම.



2010 වර්ෂයේ 3 ශ්‍රීලංසංබ වෙතින් සංවිධානය කරනු ලැබූ ආසේමු (යා) මළල ක්‍රීඩා තරගය සඳහා සහභාගිවූ මෙම ඒකක කණ්ඩායම.

## 5 වන රෙජිමේන්තුව (ආධාරක බලඇණිය) ශ්‍රී ලංකා සංඥා බලකාය




2011 අන්තර් ඒකක කබඩි තරඟාවලියේ පළමු ස්ථානය දිනාගත් 5 ශ්‍රීලංසංබ කබඩි කණ්ඩායම.

## 7 වන රෙජිමේන්තුව (ආධාරක බලඇණිය) ශ්‍රී ලංකා සංඥා බලකාය

මෙම වසරේ පවත්වන්නට යෙදුනු අන්තර් ඒකක මල්ලව පොර ක්‍රීඩා තරඟාවලියෙන් දෙවන වරටත්, ප්‍රථම ස්ථානය ලබාගැනීමට මෙම ඒකක මල්ලවපොර කණ්ඩායම සමත් විය. තවද, 7 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය (ආධාරක බලඇණිය) ආරම්භයෙන් පසු ප්‍රථම වරට අන්තර් ඒකක ක්‍රිකට් ශූරතාවය හා වෙඩිතැබීමේ තරඟාවලියේ ශූරතාවය හිමිකර ගැනීමට සමත්විය. තවද, 2011 වසරේ අන්තර් ඒකක ස්කොෂ් තරඟාවලියේ තුන්වන ස්ථානය ලබාගැනීමට සමත්විය. සෙ/279380 සංසෙ උදයකුමාර සෝජ් අන්තර් ඒකක තයිකොන්ඩෝ තරගාවලියේ කි:ග්‍රෑ: 55 බර පංතියේ ප්‍රථම ස්ථානය දිනා ගත් අතර, එමගින් ඒකකයට එම තරගාවලියේ තුන්වන ස්ථානය ලබාගැනීමට හැකිවිය. ඒ අතරම තම ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කර ගැනීම සඳහා අවැසි පුහුණු කටයුතු සිදු කරගෙනයාමට පූර්ණ නිදහස ලබාදෙමින්, සෙනින්ගේ ක්‍රීඩා හැකියාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට අණදෙන නිළධාරීගෙන් උපරිම අනුග්‍රහයක් ලැබීම මෙයට හේතුපාදක වී ඇත.





## 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

2011 වසර වෙනුවෙන් පවත්වන ලද අන්තර් ඒකක ක්‍රීඩා තරග අතරින් 9 වන සංඥා රෙජිමේන්තු සෙනින්ගේ අධිෂ්ඨානශීලි දැඩි කැපවීම හා උනන්දුව මත අන්තර් ඒකක වොලිබෝල්, බිලියඩ්, තයිකොන්ඩෝ, කඹ ඇදීම හා පාපන්දු ශූරතාවයන් දිනා ගැනීමට සමත්විය.




සිංහල හා හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් ඒකක කඳවුරු පරිශ්‍රය තුල පවත්වන ලද "බක්මහ උළෙල" ජන ක්‍රීඩා වලට මුල් තැනක් ලබා දෙමින් අණදෙන නිළධාරීගේ පූර්ණ අධීක්ෂණය සහ මගපෙන්වීම යටතේ ඉතා සාර්ථකව පවත්වන්නට යෙදුනි.

## සංඥා මූලික වැඩපල




2010 අන්තර් සංඥා ඒකක කරාතේ
අනුශූරතාවය දිනාගත් සංඥා මූලික වැඩපල කණ්ඩායම.

# කැටපත් පවුර
KATAPATH PAURA



## දයාබර බිරිඳ...

දුක අතරින් සිනාසෙන්න
දුක සතුටක් යැයි සිතන්න
පිපිදෙන්න උදේ පිපෙන
මලක් මෙන්
පහන් වැටක් සේ දිලී
එපා ඔය දුක ඔබේ
යැයි සිතන්න
මටත් ටිකක් දෙන්න
ඔය දුක දරාගන්න
ඔබේ සතුටෙදිත්
ඔබේ දුකේදිත්
මට ලඟ ඉන්න අවසර ද
ඔබට මට සිනාසෙන්න...

සෙ/283295 සංසෙ ලක්මාල් ඒඑස්
4 ශ්‍රීලංසංබ - අනුරාධපුර

## අම්මා

හිරුට වඩා එලිය දෙන
හිරු නුඹයි මට...

සඳට වඩා සිසිල දෙන
සඳ නුඹයි මට...

මලට වඩා සුවඳ දෙන
මල නුඹයි මට...

ජීවිතේ අරුත දෙන
ලියවෙනා අලුත් කවියට

අරුත නුඹයි මට....

සෙ/275215
බනි 11 උදය කුමාර කේඩීටී
4 ශ්‍රීලංසංබ - අනුරාධපුර

## නුඹයි දූවේ පහන අපේ

අඳුරු ලොවක නුඹේ අම්මත් මමත් එදා
කල් ගෙව්වෙමි දුකෙන් හඬා

සංසාරේ පැතු පැතුම් ඉටුවුන දා
නුඹේ කිරිකැටි මුව දුටුවා පුංචි දූවේ

කිරිකැටි වදන් නුඹේ මුවින් කිය වුනදා
මා පිය රජෙකුයැයි මට සිතුනා

ඝන අඳුර රජකල අපේ නිවහන එදා
ආලෝකමත් කල පහන නුඹයි මගේ දූවේ ..........

සෙ/276840
කෝප්‍රල් අටුගෙදර ඒපීඩී
4 ශ්‍රීලංසංබ - අනුරාධපුර

## සැලෙනා සිත...

මලක් සේ නැත මෙලෙක් වී සිත..
ගලක් තරමට දැඩිවෙලා
තුවක්කුව ගත් රුවැත්තියකට
කවක් සෙනෙහෙන් ලියවිලා..

නිමක් දැක්මට පෙමක් තිබුනට
කමක් නැ සුදු නංගියේ
ගමක් ගෙදරත් එපා මතකෙට
ඉමක් නොපෙනෙන යුධ බිමේ..

තවත් දැකුමට නුවන් පින්මද.
රුවන් වන් මිනි මුතු ලදේ
උපන් නුපන් පුතුන් වෙනුවෙන්
රැපුන් වනසමු නිජබිමේ..........



සෙ/283582 සංසෙ කුලරත්න ආර්ජී
4 ශ්‍රීලංසංබ - අනුරාධපුරය
ග්‍රැෆික් නිර්මාණය:
සෙ/800694 සංසෙ අබේසුන්දර ඒඑච්එම්
11 ශ්‍රීලංසංබ

## සෙබලෙක් විය....

අහස්ගැබ සිපගන්නට...
සඳ කුමරු ඔබ වැන්න
අලුයමට තුරු වදුලෙ
තුෂාරය හිරි වැන්න
තනිකමට උපන් සිත
රැය පාළු කරවන්න
කවි කලා මුළු රැයම
සෙබලෙක් වී මෙලෙස.

මව් බිමට සඳ කුමරු ඔබය
කිරණ විහිදා දැයම පුබුදන
සිංහ ධජය ලෙළ දෙන්නට
පෙරට ආ නුඹ දෙවියෙක්.

සෙ/276678 සැරයන්
ඉමංගොඩවත්ත අයිසීපී
4 ශ්‍රීලංසංබ - අනුරාධපුර

## පින් පව්

නිති බුදුන් නමදිමින්
බණ පිරිත් අසමින්
භාවනා වඩමින්
එකතු කරයි පිං..................
නිති මුසාවාදය බිඳමින්
අනුන්ගේ වැරදි දකිමින්
දොර පරොස් නගමින්
එකතු කරයි පව්
..................

සෙ/800191
සාසෙ සිරිමාන්න එම්ටීවී
11 රෙජි:
ශ්‍රීලංකා සංඥා බලකාය
(පිපඅම)



## Mother SLMA

In the morning,
"You are late for the drill
Run to white gate and come"

In the lecture period,
"You are sleepy guys,
Been nut"
After lunch,
"You are don't care bugger,
Wear the battle order and
Come near to the torch"

In the afternoon,
"You cant remember
anything about
Weapon, begin forward roll."
In the PT time,
"You can't do PT in
proper way
Been easy position"

In the midnight,
"You haven't discipline,
Have a barth and come"
This is the life of cadet

However,
They are learning
so many thing
with those thing

Mother SLMA,
You are the future
of Sri Lanka.

**O/68205**
**2/Lt GSPN Thushara**
**4 SLSC - Anuradhapuraya**



## සෙබල දුක

තුරුණු ජිවිතය
ගෙවී යන්නට දි
මහ වනයට
ඔවුන් විඳින දුක්
ඔබට පෙනේවිනම්
කවමදාකවත් ඔවුනට
සතුට මිස දුකක්
නොදේවි කිසි දිනේ
දුන් විට ඔවුනට දුකක්
විඳවන්නට වනවා
නොඅනුමානය

සෙ/279373
ලා/කෝ ජයතිලක පීපීඩීබී
7 ශ්‍රීලංසංබ (ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## රණවිරුවා

රුදුරු ගිනි අවි අත
අමෝරාගෙන සිටිත්
මහ වනය මැද
උණුවන හදවත් ඇත්තේය මොවුනට
ඒ මන්ද ලේ ඇට මස් නහර
වලින් සැදුනු ඔනෑම පුද්ගලයකුට
දුක දොම්නස දැනෙන නිසාවෙනි
ඔවුන්ටද ඇත්තේ එවැනි හැඟිමකි
ඒ කවුරුන්ද ?
ඒ කවුරුවත් නොව
රට ජාතියට මහා
කිර්තියක් ගෙන ආ

විරෝධාර රණ සෙබළුන්ය.......
සෙ/283014 සංසෙ
සමන් කුමාර එස්එම්පීපීපී
7 ශ්‍රීලංසංබ (ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## සැනසෙනු සොඳුර

කඳුගැට මුදුන් වල සෙනි ඇති සතර | වට
මිහිපිට සලු ඇලින් සැම රුව දකින | විට
අමුතුම හැඟිමක් විත් හද පතුල | යට
මාලි සොයා පියඹන්නට හිතෙයි | මට

පහලට ඇදෙන දියවැල් කොමලියක | වෙසින්
සොඳුරන හඬ ඇසේ පෙම් යුවලකගෙ | හඬින්
කඳුගැට සිසාරා ඔබ ගැන කියන | ලෙසින්
සීතල සුළං රැලි එයි වෙල්යාය | දෙසින්

මැසි මදුරුවන් ලේ බී පලු නැගෙන | පිටේ
ඇකිරිලි මෙට්ට නැති අද පොලු අතර | ගැටේ
අල්ලක් වීතර ඇති කුටියක සතර | වටේ
අප සිව් දෙනෙකුගේ ජිවන පුක්ම | වැටේ

සැනසුම සතුට සොයමින් සැරිසරන | බවේ
දුක් වේදනා අතරින් සල දවස | ගෙවේ
විපතක කෙලවරක සැපතක් ලගයි | සුවේ
අටලෝ දහම අපටත් සැරකෙයිද | ලොවේ

සැතපුම් ගණන් කඳුනැග බැස රැගෙන | දිරි
නුපුරුදු ගමනකින් පායුග වැටෙයි | හිරි
සැපතක් නුදුටු දිවියක දුක් ගැහැට | පිරි
ජිවන සටන ගෙන යමි මම නොමැටි | මැරි

මේ සුළු මුදල සුරැකිව ලග තබා | ගෙන
හොඳ සිහියකින් අගහිග පිරි මසා | ගෙන
ඉඩ ලද විගස එන පෙත් මග සොයා | ගෙන
සැනසෙනු සොඳුර දරුවන් රැක බලා | ගෙන

සෙ/276572 සැරයන් ජයලත් ජේඑම්පී
4 රෙජි ශ්‍රීලංසංබ - අනුරාධපුරය.



## පුතුනි මගේ

ලොව්තුරු බුදු කල
යසෝදරා සේ
බලා හිඳිවී මම
රාහුල පුතු දෙස
සිතට උපන් පුත්
කුමරකු සේ නුඹ
එතෙර කරන තුරු
සංසාර සසරින්

සෙ/282040
සංසෙ දිසානායක ඩීඑම්අයි
7 ශ්‍රීලංසංබ(ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## අම්මා ඔබයි මා හැදූ

දණ නමා ආදරෙන් හෙලා බිම නළල්තල
පා වදිමි බැතියෙන් අම්මා ඔබයි මා හැදූ ..........

දසමසක් හොවා කුස පොවා ලේ කිරි කර
නොයෙක් දුක් දරාගෙන අම්මා ඔබයි මා හැදූ ..........

නගන්නට අත් පොඩි තබන්නට පා පොඩි
තියන විචරණ දුන් අම්මා ඔබයි මා හැදූ ..........

කඳුළු බිඳු පිස දමා සෙනෙහසින් ලඟතබා
දැස පාදා දුන් අම්මා ඔබයි මා හැදූ ..........

සංසෙ කුමාර එච්එම්පී
11 රෙජි: ශ්‍රීලංකා සංඥා බලකාය



## දයාබර මගේ පුතේ

දෙතොලේ කිරි සිනා
නිවයි දුක් වේදනා
දකින විට සැනසෙනා
මගේ දයාබර පුතේ..........

සුරඟනන් හා සිනාවෙන
ඔබේ ඔය මුව මඬල
අතිශයින් සුන්දරයි
දූෂිත නොවූ සිත..........

හිඳිනු මැන මගේ පුතේ
සුරලියන්ගේ ලොවේ
එපා යලි එන්න ඔබ
විසකුරුයි අපෙ ලොවේ......

සෙ/800189 සාසෙ කුමාරි යුදම්
11 රෙජි: ශ්‍රීලංකා සංඥා බලකාය
(පුහුණුඅම)

## අහම් වූ ප්‍රේමය..

ඔබ හමුවී සතුටින් ගෙවූ කාලය
මට අද මෙන් මැවී මැවී පෙනේ....
ඔබ මා හැර දා ගිය දිනත්
මැවී මැවී පෙනේ..

නුඹ ඇසුරු කල කාලයේ නොයෙක් දේ
ඉගෙන ගත් නමුදු.. දුක කඳුල වේදනාව
හා පසුතැවීම වැනි දේටත්
හුරු පුරුදු වුනෙමි.

ඉතින් සබැඳියේ නුඹ මා හැර ගියත්
මා ඉගෙනගත් සියලු දෙය මා ලඟ.
සදාකල් තිබෙන බව ඔබ දන්නවාද
නුඹ යනෙන මඟ දෙපස
මල් පිපී තිබෙන මුත්..

මා යනෙන මාවතේ වැලි දූලි පිරී ඇත.
නමුත් එය මා හට සැපතක්ය.
නුඹ ඇසුරු කල කාලය මෙන්.
අවසන් වතාවට නුඹ කියූ වදන් පෙළ..
අහිමි වූ ප්‍රේමයට.. ඉරක් හා තිතක් විය..

සෙ/276108 කෝප්‍රල් රාජපක්ෂ ටීඑම්එම්
(5 ශ්‍රීලංසංබ)
4 ශ්‍රීලංසංබ රෙජි මූලයේ සිට





## අහිමි වූ මව් සෙනෙහස

ලේ කිරි කඳුලින් මා කුස පිරුණා..
මුදු වදනින් මා සිත සුවපත් කෙරුණා
ඔබෙ උණුසුම් සුව කෙසේ ලබන්නද
ඔබ මියගිය දවසේ මගෙ පැතුමයි
බිඳුණේ...

ඔබ දුන් කිරිවල වලය බලන්නට
ඔබ හට නොහැකි වුණා.
මා පෙම් කිරිවල ණය කරුවෙකි මා
ඒ ගැන දුක හිතුනා.

යලි කිව්වත් ඔබෙ උණුසුම මට
නොලැබෙන බව දැනුණා ...
සමාවෙන්න මට ඔබ රැකගන්නට
ඔබෙ පොඩි පුතු පමා උනා...

සෙ/281506
සංසෙ කුසුම්සිරි සේවවිචන්
4 ශ්‍රීලංසංබ - අනුරාධපුරය

ග්‍රැෆික් නිර්මාණය:
සෙ/800694 සංසෙ අබේසුන්දර ඒඒඑන්එම්
11 ශ්‍රීලංසංබ





## එදා සහ අද

අරුණලු හිනහේ
සොඳුරු නිමාවේ
විකසිත මුව කමලේ
දිදුලන පුන් සඳ සේ ....................
තාරුණ්‍ය දිලිසේ
ජවය - අසුන් සදිසේ
නොකලමනා - කලමනා
කුමක්දෝ
නෑ හඳ විමසන්නේ .......
ගිමන් හරින අම්බලමක් අභියස
අතීත සැමරුම් සමරන්නේ
විටෙක නැගෙන මුව මදහස
කුස පොත්තට ඇලුනත් කම් නැ
කිලුටු වතින් - සුරතින්
වියැකුණු සිරුරක පිරිමදිමන්
සියොලඟ -උණුසුම් කර ගනිමින්

සෙ/279370
ලා/කෝ වර්ණසූරිය ඒආර්පී
7ශ්‍රීලංසංබ(ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු



## හිමි නොවන ආදරය

ගලා යන ගංගාවක් වගේ
ආදරය කලා නිමක් නොමැතිව
හුදකලා මුත් මා ඔබට
සෙනෙහසින් ආදරය........
ඇයිද ඔබට නොදැනුනේ
ඔබට මා ආදරය බව........

අහිමි වී ගිය ආදරය
සිහි කරයි සිත නිතර
මා ඔබට පුද කල ආදරය
වැඩි උනාදෝ මන්දා
හැර ගියා ඔබ මාව
ඇයි? කියා නොදන්වා
මගේ සිත වෑලපෙයි නිතර
ඉන්නේ ඔබ කොයිද කියා
අහිංසක මාගේ හිතට
දුන්නේ ලොකු දුක්මය
ගෙවන හැම රැයක්ම
දන්නවද මා හඬන බව
මට දුන්න ඒ දුක
දෙන්න එපා තව කෙනෙකුට
කරන ලෙස අවංක ආදරය
කියමි මම නිසැකවම

සෙ/282244 සංසෙ
චන්ද්‍රරත්න ආර්එම්එස්කේ
7 ශ්‍රීලංසංබ (ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## අවසන් කලෙම් රසබර පාසල් දිවිය

මල් මල් අනාගතයකට සුභ ලකුණු ගෙනා
මගේ ජීවිතය ගිණිඅවියට තුරුළු වුනා
වෙඩි හඬ ඇසෙද්දි බංකරේ මතක් වුනා
මිගරයි මිරිකද්දි උණ්ඩය පිටත් වුනා

අවසන් කලෙම් රසබර පාසල් දිවිය
දෑතට ගත්තේ යුධ ලිපියේ ගිනි අවිය
රට රැක ගන්න මා කරනා මේ හරිය
දෙනවද නංගි දෙනවද මට ඔබෙ දිරිය

ඉන්නා පුතුන් හට හෙට දින උපන්දින
නිදහස් රටක් ඕනැද ජීවත් වෙන්න
සටනෙදි මා මේ ලෝකෙ අම්මේ නොහඬන්න
පාතියෙ නමින් හිත සනසාගෙන ඉන්න

සෙ/281229 ලා/කෝ ගුණරත්න එම්එම්ආර්
7ශ්‍රීලංසංබ(ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## යුධ ගිනි දුරලා සාමය උදෙසා

අවිහිංසා වාදි මිනිසුන්
වෙමුද හිතවාදි
දැහැමින් ප්‍රේමෙන් සමඟිව සාමෙන්
නංවමු දැය සුසැදි
හෙල විරුවන් සේ
රට නංවන්නට
යමු අපි පෙල සැදි

හමුවුනු නැහැ නෙත මුලු දියතේ
මෙවැනි මනරම් සොඳුරු රටක්
ඒරට ඉසුරින් සරු කරන්නට
කැපවෙමු ගෙන අපමණ වෙහෙසක්

යුධ බිය ඇති රට නිරයක් මැයි
සාමය නම් සැපතක් මැයි
යුධ ගිනි දුරලා සාමය උදෙසා
දිවිපිදුවේ ඉටුදෙවියන් මැයි

සෙ/276079 සැරයන් විමලසේන ඒ
8 ශ්‍රීලංසංබ(ආ/බ)
බී බළඝණය

## සමාවෙන්න අම්මේ

පාරක් ගැහුවානම් ඒ වරදට අම්මේ
නැත තරහක් ඔබ ගැන
මගෙ අම්මේ
බිව් කිරිවල බිඳෙන්නට නාය අම්මේ
දුන්නේ සවිය මා හට පිය තුමාගේ
ලැබුවා ආශිර්වාදය අම්මේ
රැකුවා රට තිසි ලෙස අම්මේ
පැතුමයි ඔබේ වෙන්නට
මතු බවයේ අම්මේ......

සෙ/276996
සංසෙ බණ්ඩාර ජේඑම්වයි
7 ශ්‍රීලංසංබ (ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු



## සෙබල පෙම්වත

සකල මුහුදු තිරයේ
නිසල සිතුවිලි සැටිව
සැග වෙනුවට ගිණි අවිය
අත දරා සිටියි නුඹ .......

සාමයේ පරවියන්
ඉගිලෙන දවසකදී
මාගේ සිත සතුටු වේ
ඔබ විරයෙකු පමණක් නොව
උතුම් මිනිසෙකු වන නිසා.....

එදින පැමිණෙන තෙක්
මග බලා සිටිමි මම
ඔබේ රුව දැක ගන්න
ආදරණීය විරුවාණනි ..........

හදවතින් දිරියෙන්
ඔබේ ආදරය වෙනුවෙන්
කිසිදාක හැරදමා
නොයමි මම සත්තකින්

සෙ/280382
ලා/කෝ රත්නායක
7ශ්‍රීලංසංබ(ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## රංකැටි පුතුට

පාළු අඳුරු නිවහන තුලට
එළිය දැල්වූ මිහි පහනයි
සිතට ගතට සුවය සදා
සහනය සැලසුවේ පුතුටයි
දුරකථනය කනේ තියන්
හලෝ කියන චුටි පුතේ
බෝලය පිත්තයි දෑතට
ගෙන සෙල්ලම් කරන පුතේ
වසර දෙකේ උපන් දිනයට
සැමරු රංකැටි පුතුගේ
බුදු සරණින් දෙව් පිහිටින්
නිරෝගි සුවය ලබා පුතුනි
ආයු වර්ණ සැප ලබමින්
වැජඹේවා දුමිදු පුතේ

සෙ/277118 කෝප්‍රල්
මාදන එම්එච්බීඑස්පී
8 වන රෙජිමේන්තුව
ශ්‍රී ලංකා සංඥා බලකාය
(ආ/බ)-බී බළඝණය

## පිදූ සෙනෙහස

සඳක් විය ඔබ මට හදපුරා එළිය කළ
සුවඳ වී ඔබ මට හදපුරා එළිය කළ
කඳුලවිය ඔබ මට හදපුරා විදුම් දුන්
ජිවිතය ඔබය මට සිහිනෙනුත් වෙන්නොවන

සෙ/283310
සංසෙ ලක්මාල් ජේවයි
8 වන රෙජිමේන්තුව
ශ්‍රී ලංකා සංඥා බලකාය
(ආ/බ)

## සෙබළ ජිවිතය ආලෝක මත් කල බිරිඳ

රට ජාතිය හා
ආගම ගැන සිතා
තුරුණුවිය යුධ බිමට
කැපකල මා හට
තුරුණුවියෙහි තිබු කායික
මානසික හා සාමාජීය නිදහස
යම් නිති රීති වලට සීමා වී
දහසකුත් රුදුරු බාධක මැද
දිවි ගත කල මා හට
ඔබ හමුවූ දින සිට
මගේ හදවතේ දුක්
වේදනා හා දහසකුත් ගැටළු
මැනවින් තේරුම් ගනිමින්
මුළු දිවියම ජය ගන්නට
ශක්තියක් වුයේ ඔබ වැනි
අවංක හදක් ඇති
බිරිඳක් ලද නිසාය

සෙ/281202 ලා/කෝ
රාජගුරු ආර්එම්ආර්බී
7 ශ්‍රීලංසංබ (ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු



## මගේ ආදරය

| | |
|---|---|
| දුෂ්කර ගමක සිටිනා ඇය | හැඩකාරී |
| එයින් සිටින ලස්සන ඇය | කටකාරී |
| දුටු හැම විටම සිත ඇදෙනා | මනමාලි |
| සිහින් සිතුවමයි ඇය මගෙ | බාරී |
| වචනයක් කියු පසු සිත විදුනා | මාගේ |
| උණුඋනා හදවත ඇය හිමි කර ගන්නට | මාගේ |
| මේ ආත්මේ ඈ හිමි වුනා | මාගේ |
| මතු ආත්මෙත් වෙන්නයි බාරී | මාගේ |

සෙ/281221 ලා/කෝ විජේබණ්ඩාර ඒඑම්කේ
7 ශ්‍රීලංසංබ (ආ/බ) අම්පකාමම් - ඉරණමඩු





## මම මලක් වෙන්නම්

මම මලක් වෙන්නම්
ඔයා එහි නටුව වෙන්න
එවිට මට ඔයත් එක්කම පිපිලා ඉන්න
පුළුවන්

හිතන්න.............
මගෙන් තොරව ඔයාටත්
ඔයාගෙන් තොරව මටත්
ජිවිතයක් නැහැණි පැවැත්මක් නැහැණි
ආත්මයක් නැහැ

හරියට,
නටුවකින් තොරව මලකට ජිවිතයක් නැහැ
වගේ
මලකින් තොරව නටුවකටත් ජිවිතයක්
නැහැ...

ඔව්, ඔයාට ඕනේ නම් සමනළයෙක් වෙන්න
පුළුවන්
මමත් කියාවි එහෙම ලස්සනයි කියලා

එහෙත් මලෙන් මලට රොන් ගෙන යන
පිපි සලන විට මා ලඟට එන, පරවි
ගියදාට වෙන මලකට යන
සමනළයෙක් මට එපා

මම ආසයි ඔයත් එක්කම ඉපදිලා
ඔයත් එක්කම පරවෙන්න

ඒ නිසා මම මල වෙන්නම් ඔයා නටුව
වෙන්න.................
මේ ජිවිතය ඔයා ඉන්න තුරු තිබ්බම මට
ඇති ................

ඔයා නැතුව ගියදාට පණ තිබ්බත්
මට ජිවිතයක් නැහැ නේද ?

කුසලා හේවාවිතාරණ පේ
සංඥා පාසල - බුවැලිකඩ
මහනුවර

## පරිගණක කුමරියනි

| | |
|---|---|
| කොහෙද රටක ඉපදිලා | - ලංකාවට පැමිණිලා |
| සමාජයම කලඹලා | - මහ පෙරලියක් කලා |
| ඔයා ලගම සැනසිලා | - මුළු දවසම ගතකලා |
| විසිතුරු දේ මවා | - ඔයා කලා මා මුලා |
| ක්ලික් ක්ලික් හඩ නගමින්නේ | - මතක සිත්තම් පැමිණිනේ |
| පාට රූප සමගිනේ | - අකුරු රටා පෙරළුනේ |
| රතු පාටින් සැරසුනේ | - නිල් පාටින් හැඩ වුනේ |
| අසන අසන හැම පැනේ | - පිළිතුරු එවෙලෙම වුනේ |
| ලෝකයෙ සැම මුල්ලට | - අකුරු සැනින් ඉගිලෙන්නට |
| සේරම තොරතුරු ගන්නට | - එසැනින් එය විඳ ගන්නට |
| මට හැකි බව ඇති වන්නට | - ගුරු හරුකම් මට දුන්නට |
| තව හැකි බව වැඩි වන්නට | - පතමි ඔයා රැපින වන්නට |
| විදුලිය සහ වයර් වලින් | - මෙවලම් සහ කෑලි වලින් |
| එකතු කරල මිනිස් මොලෙන් | - කල වැඩ මනිනු මිලෙන් |
| විදු නිමැවුම් කලින් කලෙන් | - ඔබ මැවුනේ මිනිස් මොලෙන් |
| ඔබ කල වැඩ පිහිට බලෙන් | - කට්ටියම ගොඩ පැයෙන් දෙකෙන් |

[illegible]76615 කෝප්‍රල් ද සිල්වා එල්එම්ජී
...ලංසංබ (ආ/බ) අම්පකාමම් - ඉරණමඩු





## යෙබළ බිරිඳකගේ සිතුවිලි

දින දහයේ නිවාඩුවට
නිවස බලා පැමිණෙනවිට
මගේ සිතට දැනෙන සතුට
කෙසේද මම අකුරු කරන්නේ

දින තිහකට ආසන්නව
ඔබේ යහළු කැල සමගින්
ගත කරලා සිනා සිලා
මගේ සිතට සතුට අරන්
එන්නේ ඔබයි මගේ හිමියනි
දරු දෙදෙනගෙ හුරතලයයි
බිරිඳගේ ලොකු හිනා රැලයි
හිතට දැනෙන සතුට ගොඩයි
ජිවිතයම අළුත් කරයි

සෙ/281231 ලා/කෝ සේනාරත්න පීපීපී
7 ශ්‍රීලංසංබ (ආ/බ)
අම්පකාමම් - ඉරණමඩු

## දුම් වැටිය

තරුණ ජිවිත විනාශ කර දමන දුක් කරදර
ඇති කර දෙන අමා රස ඇති මිනිසා මත් කරවන
දුම් වැටිය නිස මොළ ඇති මිනිසුනේ ඇයිද
නුඹේ තොලට ලංවුයේ දුම් වැටිය යමෙකුට සතුටකි
යමෙකුට හිසරදයකි මේ ගැන ඇයිද
නොසිතන්නේ මිනිසුනේ

සෙ/278786 කෝප්‍රල් තිලකරත්න එච්ටීඑම්ඩබ්
8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා
බලකාය(ආ/බ) බී බළඝණය

## චපල ප්‍රේමය

ආදරණීය සුදු නංගී
ඔබ මා අත්වැල් පටලා සිටි කාලය
සිහියට නැගෙයි මට නිතරම
ඔබ මගෙන් දුරස්ව කොපමණ
කලක් ගත වුවද ?
රැදුරු ගිනි අවිය පමණක්
ඉතිරි විය මට ඒ නමුදු
මා ඔබට ශාප නොකරමි.
වෛර නොකරමි
මාගේ පැතුම අද ඔබගේ සතුටමය
මා වෙදා ඔබ හැර ගියත්
මා ඔබට වෛර නොකලේ
එතරම්ම ඔබට පෙම්කල
නිසා සුදු නංගී

සෙ/280849
ලා/කෝ රාජමුණි ආර්ඩීඑස්කේ
8 ශ්‍රීලංසංබ (ආ/බ)
බී බළඝණය

## ප්‍රාර්ථනාව

නිසල සඳැවක
බෝපත් සෙවනක
සතුටු සිහින්
ප්‍රාර්ථනා කරන්නෙමි
සිතේ දහසක්
පැතුම් සිතුවට
බොඳ නොවන්නට
වග බලා ගන්නම්
ආදරය තුල
හැඟුම් සිත තුල
හිර කරන්
දුකත් සතුටත්
එකට විඳගෙන
ජිවිතයට මුහුණ දෙන්නම්

සෙ/281889
සංසෙ සඳරුවන් එම්පීඑම්
8 වන රෙජිමේන්තුව
ශ්‍රී ලංකා සංඥා බලකාය(ආ/බ)
බී බළඝණය

## How do I

How do I
Get through a night without you
If I had live without you
What kind a life would that be
Oh now… I need you in my arms.
need you to hold
You are my world,
You are my heart,
You are my soul
If you ever leave
Baby you will take away
every thing
Good in my life
Without you… There be no
sun in my sky
There would be
no love in my life
There will be no
where for me
And I….. Baby I don't
know what I would do
I will be lost if I lost you
If you ever leave……
Baby you will take
away every thing
Really in my life…..
And tell me now
How do I live without you
I want to know
How do I breath without you
If you ever go
How do I ever……
Ever so more
How do I …. How do I……
How do I

S/2C00566 L/Cpl Marso TJ
2SLSC(V) Welikanda

## හන්තාන සන්ද මට ඔබ නම්

හන්තාන කන්දේ
මීදුම් වදුල්ලේ
සිත සුලං රැල්ලේ
සරසවි සඳැල්ලේ
සඳතුරු වදුල්ලේ
මියුරු කොවුල් රාවේ

ඔබ ඉන්න නොසැලවී
මොහොතක්
මා දැස පියා ගන්නා තෙක්
හන්තාන සන්ද මම ඔබ නම්
එලෙසින් හිඳින්න හැමකල්

සෙ/800224 සාසෙ කලංසූරිය
මීඑස් 11 රෙජි:
ශ්‍රීලංකා සංඥා බලකාය
(සංඥා රෙම)

## අම්මා

අමාවක වූ හිස් අහසට
සුපුන් සඳයි අම්මා
අන්ධකාර ජිවිතයට
පහන් සිසිල අම්මා
හරයක් නොමැති ජිවිතයට
තනු නැති ජිවිත දිවියට
සුම්හිරි ලෙස ජිවය දුන්
වාසනාවයි අම්මා

සෙ/280369
සංසෙ සමන්ත එච්ජ්
8 වන රෙජිමේන්තුව
ශ්‍රී ලංකා සංඥා
බලකාය(ආ/බ)
බී බළඝණය





## දයාබර සොයුරිය...

වෙන්කල නොහැකි ධර්මතාවයකට ඔබටත් මටත්
වෙනස්ව යා නොහැක යථාර්ථය තුල වසාගත්
ඔය දෙනෙත ඔබ යලිත් විවර නොකරනු ඇත
ඉතිං ඔබට අවසර අපෙන් නික්ම යන්නට
ඔබගැන මතකය එදාමෙන් අදටත් .... හෙටටත්
අපට සුන්දරය හැඟුම් බරය අපි දවසක සංසාරේ
මුණ ගැසෙමු සොයුරිය මේ පැතුම එලෙසම
ඉටුවන්නට යලි අකල් මරණයකට
ගොදුරු නොවන්නට අප කරන්නා වූ ඒ පින්
මහිමයෙන් නමුත් .... පතන් නෑ ඔබට අමා මහ නිවන
යලි ඉපදේවා ඔබ එනතුරු
බලා හිදින්නෙ මේ අත්භවයේදීම..!

සෙ/2සී00585
ලා/කෝ සමරනායක ආර්ඒ
9 ශ්‍රීලංසංබ යුහ කඳවුර
ඉරණමඩු කිලිනොච්චිය.

## අවංක මිනිසෙකු වන්න

අවංක වන්න
පමාව් හෝ ඔබට සාදාරනත්වයක්
ඉටුවේවි
නිහතමානී වන්න
මිනිසුන් ඔබව අගය කරාවි
ගුණගරුක වන්න
මිනිසුන් ඔබට ගෞරව කරාවි
සුභවාදිව සිතන්න
දුකත් සතුටත් විඳගන්නට ලැබේවි
ආදරණීය වන්න
සදාකාලයෙන් සදාකාලයට
ඔබ තනි නොවේවි

සෙ/280664 සංසෙ එදිරිසිංහ එච්එල්
8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා
බලකාය(ආ/බ) බී බළඝණය

## ආදරය

අකීකරු සුලග ඇවිදින්
ඔය වත හැපුනාම
ඉරිසියා තමයි මට
පැටලෙන්න බැරි අතේ
මල් කිනිති රැදුනාම
හාදු දෙන මුව මඩලට
ලොබයි තමයි මට
ගිලිහෙනා තරු වගේ
කටිළු කැට වැටුනාම
ඔබේ නිල නුවන් ගැන
තරහා නම් තමයි මට
වැහෙන හිත බරටම
ආදරේ වක්කඩ කැඩුනාම
දරාගන්න බැරි හිත්
ඉවුර බදාගෙන ඇඩන්න
හිතෙනවා තමයි මට

සෙ/279747 ලා/කෝ බංඩාර
ටීජීඅයිකේ
රෙජිමේන්තු මූලස්ථාන බළඝණය
9 ශ්‍රීලංසංබ යුහ කඳවුර
ඉරණමඩු කිලිනොච්චිය.

## තනිකම

ජිවිතය කවියක්ව
වැයෙන විට තනුවක්ව
ඔබ මගේ ලඟින් උන්
දවස් දෙක සුන්දරයි.

කවියේ පද ගිලිහී
තනුවේ ස්වර වියැකුණු
දිනක සුන්දරයි කිව්වද
දැනෙන් දුක ද
අඩුවක්ම නැතිව

සෙ/800178 සාසෙ
ෆෙල්ටිමන් එස්බී
11 රෙජි:
ශ්‍රීලංකා සංඥා බලකාය
(බුද්ධිඅම)

## පිවිතුරු ආදරය.....

සඳුන් ශාක පුෂ්පයක් බදු නිර්මල වූ
පිවිතුරු
ආදරය සදා කාලිකයි
අවරගිර පර්වතයේ සිට හිමගිර පර්වතය
දක්වා
සූර්ය වස්තූන් ගමන් ගන්නා බව සිතන්න
අන්න ඒ ආකාරයයි අවංක හදවතකට
නැගෙන්නා වූ
ආදරය දයාව කරුණාව
එක අහසට පායන එක සඳ මමනං
ඒ සඳවටා බැබලෙන පුංචි තාරකාවිය ඔයයි
ඇත්තෙන්ම මගේ ජිවිතයට ඇතින් පායපු
පුංචි තාරකාවිය ඔයයි
ආදරය කියන්නේ උත්තරීතර පැතුමක්
මිස සංකල්පයක් නොවේ
අධ්‍යාත්මයෙන් හටගත් අවංක ආදරය තරම්
වටිනා වස්තුවක්
මෙලොව නොමැති තරම්

සෙ/279831
ලා/කෝ රත්නායක ආර්ඒ එන්ටී
රෙජිමේන්තු පොලිස් අංශය
9 ශ්‍රීලංසංබ යුහ කඳවුර
ඉරණමඩු කිලිනොච්චිය.

### අකාලේ ආ වසන්තය නුඹ

නිශාමයෙ නැගෙන
කල්පනා සයුර නුඹ
උදා හිරු කිරණ වැද
විකසිතවූ පියුම නුඹ
සිතාරෙන් නැගඑනා
එකම එක තනුව නුඹ
ඉඩ ලැබෙන ඇසිල්ලෙන්
සිත ඇදෙන රුවයි නුඹ
නිදි නොඑන යාමයේ
නෙතු ලග තනි රකින
සුළඟ සේ ඇවිත්
නොකියාම දුර ඇදෙන
නෙතු බැල්මකින් මිස
වදනකින් පණ නොලබන
දුක හිතෙන හැන්දෑවේ
මගේ තනි හිතට එබෙන
හුරු පුරුදු සුවඳ රැගෙන
අකාලේ ආ වසන්තය නුඹ

සෙ/2සී00697
සංසෙ පෙරේරා යූඩීආර්
-2රෙපි:ශ්‍රීලංසංබ(සෙව්)

### ආදරණීය දිල් දියණියේ

හිරු නිවී සඳු ඇවිදින්
හොරෙන් එබිකම් කරයි
පිපෙන්න පෙර මලට
බඹරු එබිකම් කරයි

පිපුණු මලවටා බඹරු
රොන් බිබී සැරිසරයි
පෙති වැටී රොන් සිඳී
මලක් කඳුලැලි සලයි

මලසේම නුඹ පිපි
දහස් නෙතු ඔබ ලඟයි
හොරැවටෙනු නුඹ ජිවිතේ
මලසේම පෙති සැලෙයි

සෙ/279747
ලා/කෝ බංඩාර ටීවීඅයිකේ
රෙජිමේන්තු මූලස්ථාන
බළඇණිය
9 ශ්‍රීලංසංබ යුහ
කඳවුර ඉරණමඩු
කිලිනොච්චිය.

### අනේ මට ඇසුනා රෑ නිදියහනේ

පොලොව් පිපෙන රතුමල් රුධිරයම තමා
මුහුදේ ගලන දල රළ ඔබේ හැඬුම තමා
අහසින් වැටෙන වැහිබිඳු ඔබේ කඳුල තමා
විරුවෝ අපේ නොමියෙන මිනිසුන්ම තමා

උතුරුකරේ නැගෙනහිරේ යුධ ගිනි මැද්දේ
සාම පරවියන් රැනක් ඉගිලෙන සද්දේ
අනෙ මට ඇසුනා රෑ නිදියහනේ
උතුර දකුණ යා කරන පාළම නිම කරනා
එනා ඉමෙත් මෙහා ඉමෙත් මුව හසරැල් නැගුනා

ලෙක්බිම අපි සැමදෙන එක පවුලේ නේද
අපි එක පවුලක් කියා ලොවටම කියමු නේද...
අනේ මට ඇසුනා රෑ නිදි යහනේ

සෙ/279831 ලා/කෝ රත්නායක ආර්එ එන්ටී
රෙජිමේන්තු පොලිස් අංශය 9 ශ්‍රීලංසංබ
යුහ කඳවුර ඉරණමඩු කිලිනොච්චිය.

### සුන්දර ආදරේ

ලෝකය මේ තරම්
සුන්දර යැයි
මගෙ ජිවිතයට
කියා දුන්නේ ඔබයි
නැතිනම් ඔබේ ආදරය

මගේ ජිවිතයට ගිම්හානය පැමිණ
මගේ සියළු සතුට
නුඹ රැගෙන ආවා

දැන් මට ඉතිරිව ඇත්තේ ඔබයි
මගෙ ජිවිතයටත් වැඩිය
ඔබට ආදරය කල බව සැබෑවකි
එම සිහිනය සැබෑවූ බවද සැබෑවකි

සෙ/279747
ලා/කෝ බංඩාර ටීවීඅයිකේ
රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය
9 ශ්‍රීලංසංබ යුහ කඳවුර
ඉරණමඩු කිලිනොච්චිය.

### වෙන්වීම

කහට උගුරු දෙක තුනකින්
කහටක් නැති හිත සනසා
නාගදිප වෙහෙර බිමේ
අඹ විකුණන සෙල්වරාජිණි
කොපුල් තලා මතින් වැටෙන
යෞවනයේ කඳුළු බින්දු
පිස දමන්න නොහැකිද මට
සෙල්වරාජිණි
යාල් දේවියෙන් මම ආපසු
ගම රට යන දාට
නුඹට ගොඩක් දුක දැනෙයිද
සෙල්වරාජිණි

සෙ/2සී00564 ලා/කෝ කුමාරසිංහ
ආර්ජේ -2රෙපි:ශ්‍රීලංසංබ(සෙව්)



## මන්දාකිණිය

# පාඨමාලා ජයග්‍රහණ

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලාව - අංක 5

ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් පහත සඳහන් නිළධාරීන් 2011 වසරේ ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලාව අංක 5, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාසල, බටලන්ද හි දී සාර්ථකව හදාරමින් සිටි.



නි/64499
මේජර්
එච්ඩීඩබ් හෙට්ටිආරච්චි
3 ශ්‍රීලංසංබ



නි/64595
මේජර්
පීවීආර් ඇන්තනීස්
3 ශ්‍රීලංසංබ



නි/64733
මේජර්
එස්ඩීඑල්අයි ජයසේන
3 ශ්‍රීලංසංබ



නි/64962
මේජර්
ටීකේජී නිශාන්ත
4 ශ්‍රීලංසංබ

2012 වසර සඳහා පැවති ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලාව සඳහා ඇතුලත් වීමේ පරීක්ෂණයෙන් පහත නම් සඳහන් ශ්‍රී ලංකා සංඥා බලකායට අයත් නිලධාරීන් සමත් වී ඇත.

නි/65144 මේජර් ජේඩබ්ලිව්පීකේ ජයලත්
නි/65141 මේජර් පීපීඩබ්ලිව් පටබැඳිගේ
නි/65838 කපිතාන් කේඩබ්ලිව්අයිපී හේමපාල

Junior Command and Staff Officers' Course - No 34 (Junior Command and Staff College- Sri Lanka Air force)

Maj. A.K.D Adikari has successfully completed the Junior Command and Staff Officers' Course - No 34 conducted by the Junior Command and Staff College- Sri Lanka Air force. The Officer has received a special award for "Best in Public Speaking". This trophy is awarded to the officer who has displayed the best public speaking skills in the course presentations as well as in other exercises and who has also displayed his interest and willingness to make use of the opportunities available for improving public speaking skills during the course.



## සංඥා නිලධාරි ඉංජිනේරු උපාධි පාඨමාලාව - ඉන්දියාව (අංක 97)
## SIGNAL OFFICERS DEGREE ENGINEERING - INDIA (NO. 97)



නි/63814 මේජර් පිපි ප්‍රනාන්දු



නි/65192 මේජර් එච්එම්බීඑම්බී හේරත්

ඉහත නම් සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2007.06.14 දින සිට 2010.07.28 දින දක්වා ඉන්දියාවේ පැවති සංඥා නිලධාරි ඉංජිනේරු උපාධි පාඨමාලාව අංක 97 හදෑරූ අතර, පාඨමාලාව අවසානයේදී මේජර් පිපි ප්‍රනාන්දු දෙවන පෙළ ගෞරව සමාර්ථයක් හිමි කරගෙන ඇති අතර, මේජර් එච්එම්බීඑම්බී හේරත් පලමු පෙළ ගෞරව සමාර්ථයක් හා හොඳම ඉංජිනේරු ව්‍යාපෘතියට හිමි සම්මානය ලබාගෙන ඇත.

## කණිෂ්ඨ මාණ්ඩලික නිළධාරි පාඨමාලා (අංක 33)
## JUNIOR STAFF COURSE (NO 33)



2(සේව) ශ්‍රීලංසංබ ඒකකයේ විධායක අධිකාරි ලෙස රාජකාරි කරනු ලබන නි/6746 ලුතිතන් එම්ජ්බීපි සිල්වා යන නිළධාරි යුහච්පි - දියතලාව වෙතින් 2011.05.07 දින සිට 2011.08.06 දින දක්වා පවත්වන ලද කණිෂ්ඨ මාණ්ඩලික නිළධාරි පාඨමාලා අංක 33 සාර්ථකව හදාරා තුන්වන ස්ථානය ලබාගෙන ඇත.

## එක්සත් රාජධානිය සරඹ උපදේශක පාඨමාලාව
## ADVANCE DRILL INSTRUCTOR - UK



සෙ/277366 සැරයන් අමරසිරි එම්පීඑන් යන ජ්‍යෙෂ්ඨකොනොනි 2011.01.21 දින සිට සපුපා අම්පාර වෙතින් පවත්වන ලද සරඹ උපදේශක පාඨමාලාව අංක 95 සාර්ථකව හදාරා ඉන් උසස් ලෙස සමත්වීමෙන් පසු එංගලන්තයේ පැවැත්වෙන එක්සත් රාජධානිය සරඹ උපදේශක පාඨමාලාව (ADVANCE DRILL INSTRUCTOR) සාර්ථක ලෙස හැදෑරීමෙන් පසු නැවත දිවයිනට පැමිණ සිටියි.

## ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව - ඉන්දියාව
## PHYSICAL TRAINING INSTRUCTOR COURSE - INDIA



සෙ/2සි00559 කෝප්‍රල් දේශප්‍රිය එල්ජේපි යන කොනොනි, ශාඅපුපා-පනාගොඩ වෙතින් පත්වන ලද උසස් ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව හදාරා විශිෂ්ඨ ප්‍රතිඵල පෙන්වා ඇති බැවින් ඉන්දියාවේ පැවැත්වෙන ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාව හැදෑරීම සඳහා 2011.10.07 දින ඉන්දියාව බලා පිටත් විය.





2009.01.08 වන දින සිට 2009.04.06 දින දක්වා පැවති යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල පනාගොඩ වෙතින් පවත්වන ලද මූලික ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවේ ප්‍රථම ස්ථානය සහ 2010.10.01 වන දින සිට 2010.02.07 දින දක්වා පැවති යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල පනාගොඩ වෙතින් පවත්වන ලද උසස් පෙළ ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවේ ප්‍රථම ස්ථානය සෙ/279832 ලා/කෝ ධර්මසේන බීඑස්කේ - 7ශ්‍රීලංසංබ(ආ/බ) විසින් දිනා ගන්නා ලදි. මූලික සහ උසස් පෙළ ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවන් දෙකෙහිම ප්‍රථම ස්ථාන ලබා ගත් නිසා, 2011.07.15 දින ඉන්දියාවේ පුනෙයි හි පිහිටි ශාරීරික පුහුණු පාසලෙහි පුහුණු වීම් සඳහා විදෙස්ගත වන ලදී.

## 7 වන රෙජිමේන්තුව (ආධාරක බලඇණිය) ශ්‍රී ලංකා සංඥා බලකාය

මෙම වසරේ ආරක්‍ෂක සේනා මුලස්ථානය කිලිනොච්චිය මගින් පැවැත්වූ දමිල භාෂා පාඨමාලාවේ හතරවන අදියරේ ප්‍රථම ස්ථානය මෙම ඒකකයේ සෙ/282002 ලා/කෝ රණසිංහ ඩබ්පීජ් විසින් ද, දෙවන ස්ථානය සෙ/278801 සංසෙ ගුණසේකර කේටීඑන් විසින්ද ලබාගැනීමට සමත්විය. තවද, එහිදීම පැවැත්වූ පරිගණක පාඨමාලාවේ දෙවන සහ තුන්වන ස්ථාන පිලිවෙලින් සෙ/279176 කෝප්‍රල් කුමාර කේජ්යූපි හටත්, සෙ/282870 සංසෙ බාලසූරිය ආර්සීඑම් හටත්, 3 කාසේමුහි පැවැත්වූ ලිපිකරු පාඨමාලාවේ ප්‍රථම ස්ථානය සෙ/279942 ලා/කෝ වීරසූරිය ඩීකේඑම් හටත් හිමිවිය. ශ්‍රීලයුපොදුසේබ කුට්ටිගල වෙතින් පැවැත්වූ සිංහල භාෂා පාඨමාලාවේ දෙවන ස්ථානය සෙ/281251 ලා/කෝ තුෂාර බංඩාර ජේආර්ඩබ්එම් ලබාගත් අතර, 631 බසේමු වෙතින් පැවැත්වූ සිංහල භාෂා පුහුණු පාඨමාලාවේ ප්‍රථම ස්ථානය සෙ/282859 සංසෙ සපුතන්ත්‍රි ඊඑම් යන සෙනින් විසින් ලබාගන්නා ලදි.

2011 වර්ෂයේ ආසේමු(කිලි) වෙතින් පවත්වන ලද දමිළ භාෂා පුහුණු පාඨමාලාවේ 4 වන අධියරෙහි ප්‍රථම ස්ථානය සෙ/282002 ලා/කෝ රණසිංහ ඩබ්පීජ් විසින් ද, දෙවන ස්ථානය සෙ/278801 සංසෙ ගුණසේකර කේටීඑන් - 7ශ්‍රීලංසංබ(ආ/බ) විසින් හිමිකර ගෙන ඇත.

## 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

යුධ හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල වෙතින් පවත්වන ලද සහකාර ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 90 වෙත මෙම ඒකකය වෙතින් සහභාගි වූ සෙ/283515 සංසෙ ප්‍රේමලාල් එල්ඊපිවයි එම පාඨමාලාවේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගත් අතර, එය මෙම ඒකකයට සහ සමස්ථ සංඥා බලකායට මහත් ආඩම්බරයකි.



සහකාර ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 90 වෙත මෙම ඒකකය වෙතින් සහභාගි වූ සෙ/283515 සංසෙ ප්‍රේමලාල් එල්ඊ පිවයි එම පාඨමාලාවේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය ලබාගන්නා අවස්ථාව

## යුධ හමුදා දත්ත ජාලය (SRI LANKA ARMY DATA NETWORK)

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සංඥා තොරතුරු සංනිවේදන තාක්ෂණය (Information Communication Technology) හඳුන්වාදීම තුලින් ආරම්භ කරන ලද යුධ හමුදා දත්ත ජාලය (Sri Lanka Army Data Network) ස්ථාපනය කිරීම තුලින් සංනිවේදනයේ පෙරළියක් ඇති වෙමින් පවතින අතර, එතෙක් පැවති සම්ප්‍රදායානුකූල ව්‍යුහය වෙනස් කොට සංනිවේදනය වඩා කාර්යක්ෂමවූත්, නිර්මාණශීලිවූත් මාවතකට යොමුවෙමින් පවතී. මෙසේ මෙම කාර්යය වැඩි දියුණු කිරීමේ අදිටනින් යුධ හමුදාපති භූතිතන් ජෙනරාල් ජගත් ජයසූරිය විඑස්වී යූඑස්පී එන්ඩියු පීඑස්සී ගේ සංකල්පයකට අනුව ප්‍රධාන සංඥා නිලධාරී, සංඥා බලසේනාධිපති, තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක හා පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ අධීක්ෂණයෙන් අධියර 6 ක් යටතේ යුධ හමුදාවේ ඇති සියලූ මූලස්ථානයන් බළඇණි දක්වා ජාලගත කිරීමේ වැඩපිළිවෙල යටතේ දෙවන අධියර අවසන්ව ඇත.

මූලික වශයෙන් ශ්‍රීලංකා යුද්ධ හමුදාව මෙම කර්තව්‍ය සඳහා මූලික වූයේ දිනෙන් දින යුද්ධ හමුදාව තුල වැඩිවන දත්ත හුවමාරුව ඉක්මන් කිරීමත් වේලාව ඉතුරු කර ගැනීමත් සහ විශ්වාසනීය භාවයෙන් යුතු තොරතුරු සංනිවේදන ජාලයක් ස්ථාපනය කිරීමේ පරමාර්ථයෙනි. මුළු ශ්‍රීලංකාව පුරාම යුධ හමුදා මූලස්ථානයේ සිට ඒකක මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම සඳහා වන තාක්ෂණික කටයුතු මේවන විටත් අවසන් වෙමින් පවතී.

### ස්ථාපිත කිරීම (IMPLEMENTATION)

යුධ හමුදා දත්ත ජාලයේ යුද හමුදාව තුළ පහත සඳහන් පරිදි ස්ථාපිත කිරීම අධියර වශයෙන් දක්වා ඇත.

- අධියර 1 - යුහමු, ආසේමු සහ සේමු සම්බන්ධ කිරීම.
- අධියර 2 - රෙජිමේන්තු මධ්‍යස්ථාන සම්බන්ධ කිරීම.
- අධියර 3 - පුහුණු පාසැල් සම්බන්ධ කිරීම.
- අධියර 4 - බසේමු සම්බන්ධ කිරීම.
- අධියර 5 - බළඇණි සම්බන්ධ කිරීම.
- අධියර 6 - දත්ත මධ්‍යස්ථානය හා සම්බන්ධ කිරීම.








### ලබාදී ඇති සම්බන්ධතාවයන්හි විස්තර (CONNECTIVITY STATUS)

පහත සඳහන් යුහමු අම/ශාඛා සම්බන්ධ කර/කරමින් ඇත.

**සම්බන්ධතාවය ලබාදී ඇති ස්ථාන**

- හලේකා
- මාප්‍රකා
- නිමාප්‍රකා
- යුසේලේශා
- ප්‍රමාශා
- විජේශා
- උමාජේශා
- යුමාජේශා
- මූකශා
- ප්‍රසංනිමු
- ක්‍රියාඅම
- සැලසුම්අම
- බුද්ධිඅම
- මාරාඅම
- පිපඅම
- නීතිසේවාඅම
- මාහිමානීඅම
- ශනිසඅම
- සැප්‍රඅම
- ගපාඅම
- ඉසේඅම
- යුසේඅම
- වියාඉඅම
- අයවැය හා මුපඅම
- අවිඅම
- වකාඅම
- තොතාඅම
- සංඥාබසේමු

**සම්බන්ධතාවය ලබාදෙමින් පවතින ස්ථාන**

- ප්‍රධාන සෙෂ්ත්‍ර ඉංජිනේරු නිළධාරී කාර්යාලය
- පුහුණුඅම
- මව්මෙඅම
- ජනමාධ්‍යඅම
- පාබලඅම
- ක්‍රීඩාඅම
- වෛසේඅම
- දන්තසේවාඅම
- විනයාරක්ෂක අම
- යුසාඅම
- අතියුසාඅම
- පුනඅම
- වැහේලේඅම
- යහසාධකඅම
- සන්නද්ධ බසේමු
- කාතු බසේමු
- ඉබසේමු
- ආබඅම

පහත සඳහන් ආසේමු/සේමු සම්බන්ධ කර/කරමින් ඇත.

| ආසේමු/සේමු | සේමු/කාසේමු | වත්මන් තත්වය |
|---|---|---|
| ආසේමු (යා) | 51 සේමු | සම්බන්ධකර ඇත |
| | 52 සේමු | සම්බන්ධකර ඇත |
| | 55 සේමු | සම්බන්ධකර ඇත |
| ආසේමු (ව) | 21 සේමු | සිදුකරමින් පවතී |
| | 54 සේමු | සම්බන්ධකර ඇත |
| | 56 සේමු | සිදුකරමින් පවතී |
| | 61 සේමු | සම්බන්ධකර ඇත |
| | 62 සේමු | සිදුකරමින් පවතී |
| ආසේමු (නැ) | 22 සේමු | සිදුකරමින් පවතී |
| | 23 සේමු | සම්බන්ධකර ඇත |
| ආසේමු (කිලි) | 57 සේමු | සම්බන්ධකර ඇත |
| | 65 සේමු | සම්බන්ධකර ඇත |
| | 66 සේමු | සම්බන්ධකර ඇත |
| | 3 කාසේමු | සිදුකරමින් පවතී |
| ආසේමු (මුල) | 59 සේමු | සිදුකරමින් පවතී |
| | 64 සේමු | සිදුකරමින් පවතී |
| | 68 සේමු | සම්බන්ධකර ඇත |
| ආසේමු (ද) | 11 සේමු | සිදුකරමින් පවතී |
| | 12 සේමු | සිදුකරමින් පවතී |
| | 14 සේමු | සිදුකරමින් පවතී |
| අමතර සේමු | 53 සේමු | සිදුකරමින් පවතී |
| | 58 සේමු | සම්බන්ධකර ඇත |

සියලුම රෙජිමේන්තු මධ්‍යස්ථාන සඳහා IPVPN තාක්ෂණය ඔස්සේ මෙම සම්බන්ධය මේ වනවිට ලබාදී ඇත.

දැනට ඉහත සම්බන්ධතාවය ලබාදී ඇති/ලබාදෙමින් පවතින ස්ථානවල සාරාංශය පහත පරිදිවේ.

| ආයතනය | සම්බන්ධකර ඇති | සම්බන්ධ කරමින් පවතින |
|---|---|---|
| යුහමු / අම | 28 | 19 |
| ආසේමු | 6 | - |
| සේමු/කාසේමු | 11 | 11 |
| රෙම | 23 | - |
| එකතුව | 68 | 30 |

යුධ හමුදා දත්ත ජාලයේ ලබාදී ඇති පහසුකම් (Facilities Available)

යුධ හමුදා දත්ත ජාලය පාවිච්චි කරන්නන් හට පහත සඳහන් තොරතුරු තාක්ෂණ පහසුකම් අත්විඳිය හැක.

සජීව හමුවීම (Live Meeting)

මෙම මගින් සජීවී ලෙස අනෙකුත් අන්තයේ සිටින පුද්ගලයන් හා සම්බන්ධ විය හැකි අතර, මෙහිදී සජීවී දර්ශන මෙන්ම ශබ්දය, ලිපිගොනු හුවමාරුව, ඩෙස්ක්ටොප් එක බෙදාගැනීම සිදුකළ හැක (Desktop Sharing)

ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය සාකච්ඡා (Audio and Video Conferencing)

මෙමගින් සජීවී සාකච්ඡා පැවැත්වීම සිදුකළ හැකි අතර ප්‍රශ්න විචාරීව අදහස් දැක්වීම සිදුකළ හැක. තවද ශබ්දය අනුව රූපය උත්ෂණයවීම් (Voice Activated) පහසුකම් සපයා ඇත.

මාර්ගගත ලිපිගොණු හුවමාරුව (Online file transferring)

මෙමගින් එක් ස්ථානයක ඇති ලිපිගොනු ඉතාමත් කෙටි කාලයක් තුල අනෙකුත් අන්තයට හුවමාරු කළ හැක. ඉතා වැඩි ධාරිතාවයකින් යුතු ගොනුවක් කෙටි කාලයක්තුල හුවමාරු කර ගැනීමේ පහසුකම් මෙය සතුවේ.

මාර්ගගත ලිපිගොණු බෙදාගැනීම (Online file Sharing)

මෙහිදී එක් අන්තයක ඇති ලිපිගොණුවක දත්තයන් අනෙකුත් අන්තයේ සිටින කිහිපදෙනෙකු හා එකවර භාවිතා කිරීමේ පහසුකම් (Share) මෙම ජාලය ඔස්සේ ක්‍රියාත්මක මෘදුකාංගය ඔස්සේ සිදුකළ හැක.

අන්තර්ජාල විද්‍යුත් තැපැල් (Intranet E-mailing)

mail.army.lk යන වෙබ් අඩවිය තුලින් ඉතාම රහසිගතව තම ලිපි හුවමාරු කිරීමට හැකි අතර, එය ඉතාමත් සුරක්ෂිත වේ. මෙම විද්‍යුත් තැපැල් ක්‍රමය යුධ හමුදා සංඥා සංනිවේදන හා දත්ත ජාලකරණයට පමණක් සීමාවුවකි.

අන්තර්ජාල පහසුකම් (Internet)

අන්තර්ජාල පහසුකම් ලබාදීම ද තවත් එක් අරමුණක් වන අතර, මේ වනවිට 5mbps ධාරිතාවයෙන් යුතු අන්තර්ජාල සබඳතාවයන් 2ක් යුධ හමුදාව වෙත ලබාගෙන ඇත. එක් සම්බන්ධතාවයක් මගින් යුධ හමුදා මූලස්ථානය හා ඒ හා සම්බන්ධ අම සහ ශාඛා සඳහා අන්තර්ජාල පහසුකම ලබා දී ඇති අතර, අනෙක් සම්බන්ධතාවය මගින් ආසේමු හා සේනාංක වෙත අන්තර්ජාල පහසුකම් සපයා ඇත.

## ස්වයංක්‍රිය හුවමාරුව (Automated System Integration)

දැනට ස්වයංක්‍රිය හුවමාරු මධ්‍යස්ථාන ස්ථාපනයකර ඇති අතර, එසේ නොවන සියලු ස්ථාන සඳහා ස්වයංක්‍රිය හුවමාරු සවිකිරීම් සිදුකරමින් පවතී. එමගින් නැවත ඇමතීම, පණිවිඩ නැවත හුවමාරු කිරීම, සෘජු ඇමතුම් ලබා ගැනීම යන කටයුතු සඳහා හැකියාව ලැබෙනු ඇත. (Call Forwarding, Redialling & Direct Dialing)

පහත සඳහන් අයුරින් අංක 5කින් සමන්විත අංකයන් ලබා දී ඇති අතර, එවා පහසුවෙන් මතක තබා ගැනීම සඳහා එහි පළමු අංක දෙක මගින් මූලස්ථානයද, ඉතිරි අංක 03 මගින් අදාල මූලස්ථානයේ තනතුරද හඳුන්වනු ලබයි.

- යුද්ධ හමුදා මූලස්ථානය - 55xxx
- ආසේමු (යා) - 56xxx
- ආසේමු (ව) - 58xxx
- ආසේමු (නැ) - 54xxx
- ආසේමු (කිලි) - 59xxx
- ආසේමු (මු) - 52xxx
- ආසේමු (ද) - 57xxx





එම අංක 5කින් සමන්විත ස්වයංක්‍රිය හුවමාරු මධ්‍යස්ථානයන් වෙත ලබා දී ඇති අංක පිලිවෙල උදාහරණයක් ලෙස පහත වගුවෙන් දක්වා ඇත.

| APPOINTMENT | SF HQ (J) | SF HQ (W) | SF HQ (E) | SF HQ (K) | SF HQ (M) | SF HQ (S) |
|---|---|---|---|---|---|---|
| Comd of the Army | 56000 | 58000 | 54000 | 59000 | 52000 | 57000 |
| SF Comd | 56001 | 58001 | 54001 | 59001 | 52001 | 57001 |
| Brig GS | 56010 | 58010 | 54010 | 59010 | 52010 | 57010 |
| Col GS | 56011 | 58011 | 54011 | 59011 | 52011 | 57011 |
| GSO I (Ops/Trg) | 56016 | 58016 | 54016 | 59016 | 52016 | 57016 |
| GSO I (Coord) | 56017 | 58017 | 54017 | 59017 | 52017 | 57017 |
| Computer Room | 56026 | 58026 | 54026 | 59026 | 52026 | 57026 |
| Brig AQ | 56100 | 58100 | 54100 | 59100 | 52100 | 57100 |
| Col AQ | 56101 | 58101 | 54101 | 59101 | 52101 | 57101 |
| SO I (A) | 56102 | 58102 | 54102 | 59102 | 52102 | 57102 |
| SO I (Log) | 56103 | 58103 | 54103 | 59103 | 52103 | 57103 |

## ජාලයෙහි ආරක්ෂාව

අදාල ජාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින්ම නිර්මාණය කිරීම හා නඩත්තු කටයුතු පවත්වාගෙන යාම සිදු කරනු ලබයි. රවුටර් සහ සර්වර් යන්ත්‍රයන්හි සේවා සැපයීම ද, අප තොරතුරු තාක්ෂණ ඉංජිනේරුවන් මගින් සිදු කරනු ලබයි. තවද, මෙම ජාලය තුල සැරිසරන පුද්ලගලයින් හා ඔවුන් හට එක් එක් ආයතනයේ දත්ත පරිහරණය පිලිබඳව සටහන් සිදුකිරීම හා පාලනය සඳහා නවීන ක්‍රමවේදයන් මෙම ජාලයට හඳුන්වාදී තිබේ. එනම්, දැනට ලෝකයේ අංක එකේ ආරක්ෂිත මෘදුකාංගයක් ලෙස භාවිතා කරන Check Point Firewall ශ්‍රී ලංකා යුධ හමුදා සංනිවේදන හා තොරතුරු දත්ත ජාලයෙහි ආරක්ෂිත මෘදුකාංගය ලෙස සඳහා යොදාගෙන ඇත. එමගින් අභ්‍යන්තර මෙන්ම බාහිර පුද්ගලයින්ට අනවසරයෙන් ඇතුල්වීම හෝ පිටතින් ලගා වන බලපෑම් පාලනය කිරීම සඳහා නිර්මාණය කර ඇත. තවද, ලබා ගන්නා අන්තර්ජාල පහසුකම් තුලින් කිසිවෙකුට අනවසරයෙන් ජාලය තුලට ඇතුල්වීම අවහිර කර ඇත. තවද, මෙමගින් සරල, ආරක්ෂිත සහ පූර්ව අනුමැතිය ඇතිව දත්ත හුවමාරුව සිදු කිරීම මෙහි ඇති සුවිශේෂී ආරක්ෂිත සැලසුමක් වේ.

## සමාප්තිය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා අභ්‍යන්තර දත්ත ජාලය, ශ්‍රී ලංකාවේ ඇති විශාලම අභ්‍යන්තර ජාල වලින් එකක් වේ. ඉහත සඳහන් කළ පරිදි මෙහි සියලුම කටයුතු යුද හමුදාව විසින්ම සිදුකරනු ලබන අතර, එහි ආරක්ෂාව ඉතාමත් ඉහල මට්ටමක පවතී. මෙම ජාලය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ක්‍රියාන්විත සහ ක්‍රියාන්විත නොවන ප්‍රදේශවල බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා පහසුකම් සපයා ඇත. මෙමගින් යුධ හමුදාව තුල සිදුකරනු ලබන සියලුම ක්‍රියාන්විත හා පාලනමය කටයුතු කාර්යක්ෂමව, වේගවත්ව සහා ඵලදායී ලෙස කරගෙන යෑම සඳහා මහඟු සේවාවක් ඉටු කිරීම අපගේ ඒකායන අරමුණයි.

## ලොව විෂ අධිකම සත්වයා "ඇරෝ ෆ්‍රොග්"



ලොව විෂ අධිකම සත්වයා පිළිබඳව ඔබගෙන් විමසුවහොත් ඔබ එකවරම පවසන්නේ නයා පොළඟා නැතහොත් වෙනත් සර්පයෙකුගේ නමක් නොවේද? එහෙත් ලොව විෂ අධිකම සත්වයා වෙනත් කිසිවෙකුත් නොව ගෙම්බෙකි. එම ගෙම්බන් විශේෂය, ඇරෝ ෆ්‍රොග්, නමින් හඳුන්වනු ලබන අතර, මොවුන් ඇමසන් වනාන්තරය ආශ්‍රිතව ජීවත් වෙයි. මෙම ගෙම්බන් විශේෂයෙහි විෂ කොපමණද කිවහොත් ස්පර්ශ කල සැනින් මිනිසෙකු ජීවිතක්ෂයට පත් කිරීමට හැකි ලොව එකම සත්වයා වේ. මෙම ගෙම්බන් විශේෂය නිල්වන් සමක් ඇති ඉතා දැකුම්කලු සත්ව විශේෂයකි.
පොත පත ඇසුරෙනි.

සෙ/275952 කෝප්‍රල් ප්‍රේමරත්න කේපීආර්
7ශ්‍රීලංසංබ(ආ/බ) ජසිප් කණ්ඩායම

## ලොව විශාලතම සහ අනතුරුදායකම දියඇල්ල "නයගරා ඇල්ල"



උතුරු ඇමෙරිකාවේ ඔන්ටේරියෝ විලෙන් ඇරඹී ඊරී විලෙන් අවසන් වන කැනඩාව හා ඇමෙරිකානු දේශසීමාව අසලදී දැකගත හැකි මෙම දියඇල්ල ඉතා මනරම් දිය ඇල්ලකි. ලොව පළලින් වැඩිම දිය ඇල්ල මෙය වන අතර මෙහි පළල අඩි 2600 කි.තත්පරයට මීටර් 6000 ක වේගයෙන් තත්පරයට ගැලුම් 826650 ක යෝධ ජලකඳක් ඇද හැලෙන මෙම දියඇල්ල ලොව වඩාත්ම අනතුරුදායක දිය ඇල්ල වන අතර, මෙය නයගරා ඇල්ල. ලෙස හඳුන්වනු ලබයි.
පොත පත ඇසුරෙනි

සෙ/275952 කෝප්‍රල් ප්‍රේමරත්න කේපීආර්
7ශ්‍රීලංසංබ(ආ/බ) ජසිප් කණ්ඩායම

## ලොව විශාලතම බෞද්ධ විහාරය "බොරෝ බුදූර්"



කවුරුන් හෝ ඔබගෙන් විමසුවහොත් ලොව විශාලතම බෞද්ධ විහාරය පිහිටා ඇත්තේ කොහේද කියා ඔබ දෙන පිළිතුර කුමක්ද ? එය මෙවන් පිළතුරක් විය හැක, ඉන්දියාවේ, බුරුමයේ, ජපානයේ, තායිලන්තයේ නැත්නම් ශ්‍රී ලංකාවේ කියා නොවේද? ඔබ එසේ කිවහොත් ඇත්තෙන්ම ඔබ වැරදිය. ලොව විශාලතම බෞද්ධ විහාරය පිහිටා ඇත්තේ ඉන්දුනීසියාවේ ජාවා දූපත්වලය. මෙය මහායාන බෞද්ධ සම්ප්‍රදායට අයත් ලොව ඉපැරණිතම හා විශාලතම බෞද්ධ විහාරය වන අතර, මෙය "බොරෝ බුදූර්" නමින් හඳුන්වයි. මෙම "බොරෝ බුදූර්" යන්නෙහි අරුත බොහෝ බුදුවරු, යන්නයි. මෙය ක්‍රි:ව: 800 දී සිසිලෙන්ද්‍රා නම් කුමරෙකු විසින් කරවන ලද්දකි. මෙහි උස මීටර් 34.5 ක් වන අතරල බුද්ධ ප්‍රතිමා 504 ක් හෙලා ඇති බිතු සිතුවම් 2672 කින් සමන්විත ගිහිකඳු 04 කින් වටවූ සිද්ධස්ථානයකි. මෙම සිද්ධස්ථානයෙහි භූමි ප්‍රමාණය වර්ග මීටර් 60000 ක් වේ.
පොත පත ඇසුරෙනි.

සෙ/275952 කෝප්‍රල් ප්‍රේමරත්න කේපීආර්
7ශ්‍රීලංසංබ(ආ/බ) ජසිප් කණ්ඩායම





## ඩෙංගු උවදුරෙන් ආරක්ෂා වෙමු

ඩෙංගු උණ වෛරසයක් මගින් බෝ කරන අතර, එම උණ රෝගය පැතිර යන්නේ අපේ අපවිත්‍ර පරිසරය තුලින් බිහි වන මදුරු දෙවර්ගයක් වන ඊඩිස් ඊජිප්ටයිස් හා ඊඩිස් ඇල්බෝපික්ටස් යන මදුරු දෙවර්ගය දෂ්ඨ කිරීම තුලිනි.

තද උණ ගතිය, හිසරදය, ඇඟපත වේදනාව සහ බඩේ කැක්කුම යන සාමන්‍ය රෝග ලක්ෂණ වන බැවින් එය දින තුනක් හතරක් පමණ කාලයක් පවතින අතර, එම ලෝග ලක්ෂණ අඩුවී සුව වී යයි. නමුත් මෙම තත්ත්වයෙන් පසු සමහර රෝගීන් සඳහා ඩෙංගු රක්තපාතයක් බවට පත්වන අවස්ථාද ඇත. එහිදී හම තුල කුඩා ලේ පැල්ලම් ඇතිවීම, ඇස් රතු වීම, නාසයෙන් ලේ ගැලීම, මුත්‍රා සමග ලේ පිටවීම සහ වමනය හෝ මල පහ කිරීමේදී තද කළු හෝ දුඹුරු පාටට පිටවීම දක්නට ලැබේ. එවැනි අවස්ථාවකදී අනිවාර්යෙන්ම වෛද්‍ය ප්‍රතිකාර සඳහා රෝගියා යොමු කර යුතු වේ.

සමහර අවස්ථාවන් හිදී ඩෙංගු රක්තපාත උණෙන් පෙලෙන රෝගියෙකුගේ උණ හිටි හැටියේම බැස යා හැකිය. එහෙත් එම රෝගියා අසනීප ගතියෙන් පසු වේ නම් එය කම්පන ලක්ෂණයක් විය හැකිය. ඇඟ සීතල වීම, ඇඟ සුදුමැලි වීම, කලබලකාරී හා නිදිමත ස්වභාවය, නාඩි වැටීම වේගවත් වේ නම් එය කම්පන ලක්ෂණයක් විය හැකිය.

විශේෂයෙන්ම උණෙන් පෙලෙන දරුවෙකු තුල හදිසි උණ බැසීමක් ඇති වුවහොත් ඒ ගැන විමසිලිමත් විය යුතුයි. ඇස්ප්‍රින් හෝ ඇස්ප්‍රින් අඩංගු ඖෂධ දරුවාට ලබාදීමෙන් වැලකී දරුවා වෛද්‍යවරයෙකු ලඟට රැගෙන යාමට උත්සුක වන්න මෙවැනි අවස්ථාවන් වලදී කුඩා දරුවන් ගැන අනිවාර්යෙන්ම විමසිල්ලෙන් සිටිය යුතුයි.

ගෙවත්ත ඔබ ආයතන අවට පිරිසිදුව තබා ගැනීම සඳහා කුණු කසල පුලුස්සා හෝ වලලා දමන්න, පොල්කටු, පැඹිලි කෝම්බ තුල වතුර එකතු නොවන ලෙස කුඩාවට පලා දමන්න. හිස්ටින් කිරි හට්ටි, සහ නිවෙස් වල වහලවල් මත ඇති ටයර් වලට වැලි පුරවන්න. තවද අපි අලංකාරය සඳහා මේසය සරසන මල් බඳුන් සහ කුඹි උගුල් සඳහා දමන ජලය මතට ලුණු එක්කාසු කරන්න.

අපේ පරිසරය පිරිසිදුව තබාගෙන ඩෙංගු මදුරුවන්ට හිස එසවීමට නොදී තමාගේ ජීවිතය පමණක් නොව සියළු ජීවිත ඩෙංගු වසංගතය තුලින් ආරක්ෂා කර ගනිමු.

සෙ/279945 ලා/කෝ ගුණතිලක ඩීපීඑස්
3 වන රෙජිමේන්තුව
ශ්‍රීලංකා සංඥා බළකාය
යුත කඳවුර වාසවිලාන් - පලාලි



# ජීවිතයට වින කරන දුම්වැටි මාරයා

දුම්වැටි නිසා සෑම තත්පර 10 කට වතාවක් ලොවේ කොතනක හෝ මරණයක් සිදුවේ. මේ බැව් ලෝක සෞඛ්‍ය සංවිධානය ප්‍රකාශයට පත් කර ඇත. එසේ නම් ලොව මෙම දුම්කොල සමාගම් සෑම තත්පර 10 කට වතාවක් තම දුම්වැටි අලෙවිය සඳහා එක් අයෙකු හෝ වැඩි දෙනෙකු දුම් පානයට යොමුකර ගත යුතුය. ඒ සඳහා ඔවුහු නොයක් ක්‍රමවේද අනුගමනය කරති.

එම ක්‍රමවේද වශයෙන් නොයෙක් ආකාරයේ ක්‍රමවේද යොදන අතර, දුම් පානය ඉතා විචිත්‍රවත් විනෝදකාමී තාරුණ්‍ය හැඩ කරන හැඟීමක් සහිත සාමාජයේ කැපිපෙනෙන විරෝධාර ක්‍රියාවක් ලෙස හුවා දැක්වීමට හා තාරුණ්‍ය දුම් පානය සඳහා යොමුකර ගැනීමට ඔවුහු සැමවිටම කටයුතු කරති. එම ප්‍රචාරක වැඩවලට ඔබ රැවටෙනවාද? නැත. ඔබ කිසිදාක නොරැවටෙන බව මට විශ්වාසයි.

ඔබ මෙලොවට ගෙන ඇතිදැඩි කළ මව්පියෝ හැකි උපරිමයෙන් ඔබ යහපත් පුරවැසියෙකු කිරීමට මහත් වෙහෙසක් ගනිති. ඒ අනුව ඔබමද ඔවුන් වෙනුවෙන් යම් මෙහෙවරක් පැවරී ඇත. අවසන් අවස්ථාවේ මගේ කටට වතුර ටිකක් දාන්න. මගේ පුතා ඉන්නවානේ යන්න ඔවුන්ගේ පැතුමයි. නමුත් දුම්පානය නිසා මව්පියන්ට පෙර දරුවෝ ජීවිතයෙන් සමුගනිති. එය මව්පියන් මොලොව තම දෑසින් දකින අවසානවන්තම සිදුවීමයි. එවන් තත්වයක් ඔබ මව්පියන්ගේ දර්ශනයට ලක් කරනවාද? නැත. යන්න ඔබේ පිළිතුරයැයි මම දනිමි. එසේ නම් දුම් පානයෙන් ඉවත් වන්න.

ඔබ පවුලක සාමාජිකයෙකි. ඔබ ලොකු අයියා විය හැකිය. බාල මල්ලි විය හැකිය. අයියා කෙනෙකු හෝ මල්ලි කෙනෙකු විය හැකිය. ඔබට තම සහෝදර සහෝදරියන් වෙනුවෙන් කිරීමට බොහෝ දේ ඇත. කුමක් නොකලත් ඔබ ඔවුන් සමග සිටීම පවුලේ සැමට සතුටකි. ආශිර්වාදයකි. හයියකි.

ඔබ ආදරණිය පියෙකි. ආදරණිය ස්වාමිපුරුෂයෙකි. පියෙකු වශයෙන් දරුවන් වෙනුවෙන් කළ යුතු දෑ බොහෝය. ස්වාමි පුරුෂයෙකු වශයෙන් භාර්යාවට මෙන්ම පවුලට කල යුතු සේවා බොහෝය. භාර්යාවට ස්වාමිපුරුෂයාගේ රැකවරණය ජිවිත කාලයටම අවශ්‍යය. ආදරණිය පියාගේ රැකවරණය දරුවන්ට හැමදාටම අවශ්‍යය. දරුවන්ට රැකවරණය වඩාත්ම අවශ්‍ය කාලයට අබ්බගාතයෙකු හෝ පිළිකා රෝගියෙකු වනවාද ? නැත හොත් භාර්යාව හා දරුවන් මොලොව තනිකර දමා ජිවිතයෙන් සමුගන්නවාද ? නැත යන්න ඔබේ පිළිතුර බව මම දනිමි. එසේ නම් දුම්පානයෙන් සදහටම ඉවත් වන්න.

ඔබ සමාජීය පුද්ගලයෙකි. වැඩිහිටියෙකි. සාමාජයේ යහපත වෙනුවෙන් ඔබ කළ යුතු දෑ බොහෝය. ඔබ පසුපස එන ජිළඟ පරම්පරාව යහමගට ගෙන ඒමට ඔබට මහත් වගකීමක් ඇත. ඒ වගකීම ඉටුකිරීමට ඔබ බොහෝ කලක් සමාජයේ යහතින් සිටිය යුතුය. ඔබ දුම්පානය කරන්නේනම් එය යුතුකම වගකීම අතහැර දමා අකාලයේ ජිවිතයෙන් සමුගැනීමට සිදුවනු ඇත. එවැනි පුද්ගලයෙකු වීමට ඔබට අවශ්‍ය නැති බව දනිමි. ඔබ ඔබට ආදරය බවත් සාමාජයට යහපතක් කිරීමට දිගු කාලයක් නිරෝගිව සිටීමට කැමැතිනම් එබැවින් ඔබ දුම්පානයෙන් ඉවත් වී ඇති බවත් දනිමි.

ඔබට දුම්පානය නතර කළ හැකිය. එය අපහසු කාර්යක් නොවේ. ඔබට ආත්ම ශක්තියක් තිබේද ? ආත්ම විශ්වාසයක් තිබේද? කෙටියෙන් කියනවානම් ඔබට කොන්දක් තිබේද? "ඔව්" නම් දුම්පානය දැන් නතර කළ හැකිය.

ඔබ ආදරණිය පුතකු වන්න. ආදරණිය සොහොයුරෙකු වන්න. වාසනාවන්ත ස්වාමිපුරුෂයෙකු වන්න. වාසනාවන්ත පියෙකු වන්න. සාමාජ වගකීම දරණ වැඩිහිටියෙකු වන්න.

ශ්‍රී ලංකා පිළිකා සංගමය මහජන අධ්‍යාපන
නිළධාරී ඩීඩබ්එස් ජයරත්නගේ ලිපියට අනුව ඉදිරිපත් කිරීම

සෙ/275690 කෝප්‍රල් සිරිමාන්න කේපීජ්
8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය(ආ/ඔ)









# සංයුක්ත තැටි සහ සංයුක්ත ධාවක හඳුනා ගනිමු




මෘදුකාංග වල තත්වය උසස් වීමත්, පරිගණකයෙන් කරගත හැකි වැඩපල තත්වය සහ වපසරිය පුලුල් වීමත් සමග ලැබෙන විශාල දත්ත සමුදාය එහා මෙහා ගෙන යාම සඳහා දෙවන පරම්පාරවේදී වැඩියෙන් භාවිතා කරන ලද්දේ සංයුක්ත තැටියයි. කරන ලද කාර්යයන්ගේ පසු කොපි හෙවත් උපස්ථ පිටපත් (Backup) ගුරැකිමට ද ඉන් ලැබුනේ මහගු අත්වැලකි. සංයුක්ත තැටියක් 120MM විශ්කම්භයකින් යුක්තය. එහි ගබඩා කල හැකි උපරිම මෙමරි ප්‍රමාණය 700MB මේ. ඕඩියෝ හෝ විඩියෝ පට ධාවන කාලය මිනිත්තු 80කි.

සංයුක්ත තැටියක් ස්ථර කිහිපයකින් යුක්තය.

අ - පොලිකාබනේට් රවුම් තැටිය. මේ මත ඩිජිටල් තත්වයේ ඇති නැති සංඥා අනුව ලේසර් කිරණය රැලි හෙවත් ගැටිති සටහන් කරනු ලැබේ.

ආ - ඇලුමිනියම් ස්ථරය - ඒ රැලි සහිත තැටිය හරහා යන ලේසර් කිරණය පරාවර්තනය කරන්නේ මේ අතිශය තුනී ඇලුමිනියම් ස්ථරයයි. ඉන් පරාවර්තනය වන ලේසර් කිරණයේ වර්තනය අනුව නැවත දත්තනය කියවනු ලැබේ.

ඇ - ලැකර් (Laquer) ආලේපනය - මේ සඳහා ඇලුමිනියම් ස්ථරයෙහි ඔක්සිඩයිස් (මලකඩ) වීම වැළැක්වීම සඳහා ඒ මත ආරක්‍ෂක ලැකර් ආලේපනයක් ගල්වා ඇත.

ඈ - මුද්‍රණය - සිඩී තැටිය හඳුනාගැනීම සඳහා ඒ මත සිල්ක් ස්ක්‍රීන් හෝ ඕෆ්සෙට් තාක්‍ෂණයෙන් කිසියම් මුද්‍රණයක් සටහන් කෙරේ. එවැනි මුද්‍රණයක් නැතිවිට එය පොදු ආලේපනයකින් පමණක් යුක්ත විය යුතුය.

තවද සමහර සිඩී මත විශේෂ ආකාරයට මුද්‍රණය කල හැක. එය ආකාර දෙකක් ලෙස සැලකේ. එකක් ඒ සඳහාම නිෂ්පාදිත සිඩී සහ රයිටර් මගින් කරන මුද්‍රණයයි. එය වර්ණ දෙකකට පමණක් සීමා වේ. දෙවැන්න සිඩී මත ඉන්ජෙක්ට් තැටියෙන් පරිඝණකයේ හාඩ් ඩිස්ක් එකෙන් දත්ත සටහන් වන්නේ එකම රටාවකටය. රූප සටහනට අනුව යනු ඔර්ජනු එකය. B යනු Sector එකකි. C යනු Sector එක තුල ඇති සෙක්ටරයේ කොටස වන Cluster යයි. Data වැඩි දියුණු කරන ලද නව සංස්කරණයක දත්ත ලියන ආකාරය මෙසේ දැකගත හැක.

## නැවත ලිවියහැකි සිඩී (Re-writable CD)

සාමාන්‍ය සිඩී තැටියක් මත දත්ත ලිවිය හැක්කේ එක් වරක් පමණි. ඉතිරිව ඇති ඉඩෙහි යලිත් වරක් ලිවිය හැකිය. නමුත් Re-writable CD එකක් මත සම්පූර්ණයෙන්ම නැවත නැවතත් දත්ත මකමින් ලියන්නට පුලුවන. ඒ නිසා වඩින් දත්ත හුවමාරුවේදී අඩු පිරිවැයකින් වැඩි ප්‍රයෝජනයක් ලබාගන්නට පුලුවන.




මෙම Re-writable තැටියේ පොලිකාබනේට් තැටියට පසු ආලෝක සංවේදී මෙටලික් ඇලෝයි මිශ්‍ර ඩයි (Metallic Alloy instead of a Dye) සහිත රසායනික ස්ථරයක් Emulsion ඇති අතර, ලේසර් කිරණින් උත්පාදනය වන තාපය මගින් එම රසායනයේ අවස්ථිතික (කිසිදු හැඩයක් නැති) Amorphous අංශු ස්ඵටික Crystalline බවට පරිවර්ථනය කරයි. මේ ස්ඵටික ආලෝකය පරාවර්ථනය කරන නිසා එමගින් එහි ඇති දත්තය නැවත කියවිය හැකිය. සාමාන්‍ය සිඩී එකකට වඩා මේ පරාවර්ථන හැකියාව දුර්වලය. ඒ නිසා ගෘහස්ත සිඩී ධාවකවලදී කියවීම අපහසු වේ. එහි සිදුවන රසායනික වෙනස්කම් කලකදී නිවැරදිව සිදුනොවන නිසා Re-writable CD අසීමිත වාර ගණනක් භාවිතා කරන්නටද නොහැකිය.

## ඩීවීඩී (DVD)

අද කාලයේ දත්ත සුරැකීමට ඇති තරමක් හොඳම මාධ්‍ය ලෙස පිළිගැනෙන්නේ ඩීවීඩී හෙවත් Digital Versatile Disc නම් තැටියයි. එය ප්‍රමාණයෙන් සීඩී තැටියේ වට ප්‍රමාණයට සමානය. නමුත් එහි ලියැවෙන පැත්ත තද අඳුරින් අමුතු නිල් පැහැයකින් යුක්තය.

ඩීවීඩී වර්ග කිහිපයකින් යුක්තය. සමහර වර්ග ලේයර් (Layer) හෙවත් ස්ථර දෙකකින් යුක්තය. සමහර ඩීවීඩී දෙපැත්තේම ලේයර් දෙක බැගින් Double side/ Dual Layer වලින් යුක්තය. එමෙන්ම එහි ගබඩා කළ හැකි දත්ත ප්‍රමාණය අතිශයින් ඉහළය. සාමාන්‍ය භාවිතයට ගන්නා DVD R තැටියක සීඩී එකක මෙන් 6.8 ක දත්ත ගබඩා කර ලියා තැබිය හැකිය. එනම් DVD R තැටියක උපරිම මතක ධාරිතාව Gigabite 8.5කි.

| Disk Space | Capacity |
|---|---|
| DVD –R (SL) | 4.7 |
| DVD + R (SL) | 4.7 |
| DVD-R (DL) | 8.5 |
| DVD+R (DL) | 8.5 |
| SL/DL – Single/Dual Layer | |

## තැටි ධාවක (Disk Drivers)

### සීඩී ධාවකය - CD ROM

සාමාන්‍ය සීඩී තැටි කියවන ධාවකය හැඳින්වෙන්නේ සීඩී රොම් (CD ROM) නමිනි. එයින් කල හැක්කේ දත්ත කියවීම Read Only Memory පමණි. එහි මුහුණතේ වෙළඳ සලකුණ, සීඩී කියවන සහ ලියන වේගය (52x24x8x) හැර කිසිවක් සඳහන් ව නැතිනම් එය සීඩී රොම් එකකි.




### සීඩී රයිටර් - CD WRITER

සීඩී තැටිය මත දත්ත ලියන්නට නම් ඒ සඳහා සීඩී රයිටරයක් භාවිතා කල යුතුය. මේ සීඩී රයිටරයෙන් දත්ත කියවන්නට Read ද, ලියන්නට Write ද පුලුවන. එනිසා ඔබේ පරිගණකයට වඩා සුදුසු වන්නේ සීඩී රයිටරයයි. මෙහි මුහුණතේ රයිටබල් ඩිස්ක් සඳහා වන ලියාපදිංචි සළකුණ පැහැදිලිව දක්වා ඇත.

### ඩීවීඩී රයිටර් - DVD WRITER

DVD ROM එකකින් කළ හැක්කේ ඩීවීඩී කියවන්නට පමණක් වන අතර ඉන් සීඩී කියවීමේ හැකියාවද පවතී. ඩීවීඩී එකේ මුහුණතේ සම්මත ඩීවීඩී ලාංඡනය පමණක් සටහන් කර ඇත.




### කොම්බෝ ඩ්‍රයිව් - Combo Drive

සීඩී ලියන්නටද, කියවන්නටද, ඩීවීඩී කියවන්නටද හැකි බහු කාර්ය කොම්බෝ ඩ්‍රයිව් එකක් තිබීම තවත් ප්‍රයෝජනවත් විය හැකිය. මන්ද ඉන් සීඩී කියවන්නටත්, ඒ මත ලියන්නටත් ඊටත් වඩා ඩීවීඩී කියන්නටත් හැකි බැවිනි.

### ඩීවීඩී රයිටර් - DVD Writer

ඩීවීඩී රයිටරයකින් DVD RW තැටි සම්බන්ධ සියලුදේත් කරගත හැකිය. ඉන් ඩීවීඩී එකක ලියවන්නට මෙන්ම කියවන්නටද පුලුවන. එ නිසා ඔබට වඩාම ප්‍රයෝජනවත් වන්නේ ඩීවීඩී රයිටරයක් තිබීමයි. දැන් එහි මිලද සිග්‍රයෙන් අඩු වෙමින් පවතී. නූතන බොහෝ පරිඝණකවල සමාන්‍ය ධාවකය ලෙසින්ද සවි කරන්නේ ඩීවීඩී රයිටරයන්ය.

ඩීවීඩී රයිටර ද ආකාර කිහිපයකින් දැකිය හැකිය. සාමාන්‍ය ඩීවීඩී රයිටරය, දත්ත ලේයර් දෙකකින් ලියන්නට හැකි ඩුවල් ලේයර් Dual layer, වර්ගය සහ ඩීවීඩියක දෙපැත්තේම ලිවිය හැකි ඩබල් සයිඩ් Double Side වර්ගය යනාදි වශයෙනි.




සැරයන් ලංකානි සිල්වා එල්වවිජ්යු - 11 ශ්‍රීලංසංබ



THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

## මංගල සීනු
## *Mangala Seenu*



2010.12.17 වන දින වාසනාවන්ත යුග දිවියකට පා තැබූ සෙ/2සී00636 ලා/කෝ පියතිලක පිපිපිඑස් සහ කේවීවීඑන් තිශාන්ති මෙනෙවිය සියළු පැතුම් ඉටුවූ ඒ සොඳුරුබර මොහොත



2011.01.20 වන දින වාසනාවන්ත යුග දිවියකට පා තැබූ 11 ශ්‍රීලංසම්බ සෙ/800242 සංසෙ බණ්ඩුසිංහ එන්යූ සහ ශ්‍රීලංගුහ හි කෝප්‍රල් ප්‍රියදර්ශන එස්කේ සමග



2011 ජනවාරි මස 20 වන දින යුග දිවි ගමන් ඇරඹූ 2(සෙවි)ශ්‍රීලංසංබ ඒකකයට අයත්, 9ශ්‍රීලංසංබ ඒකකයේ රාජකාරි නියුතු සෙ/2සී00585 ලා/කෝ සමරනායක ආර්එ හා ශානිකා කුමාරි රණසිංහ මෙනවිය.



2011.04.08 වන දින වාසනාවන්ත යුග දිවියකට පා තැබූ 11 ශ්‍රීලංසංබ සෙ/800727 සංසෙ වික්‍රමසේකර සිඑස් සහ මනෝෂිකා උදයංගනි මෙනෙවිය



සෙ/279945 ලා/කෝ ගුණතිලක කේඩීපීඑස් 2011.02.24 දින සුරංගි අනුරුද්ධිකා රාජපක්‍ෂ මෙනවිය සමග අතිනතගත් සුභ මොහොත



සෙ/280828 ලා/කෝ මුණසිංහ ඩබ්කේ 2011.05.27 දින නිල්මිණි රණවීර මෙනවිය සමග අතිනතගත් සුභ මොහොත

# 2 වන රෙජිමේන්තුව
# ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙවේච්ඡා)

2 වන රෙජිමේන්තුව, ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්), ශ්‍රී ලංකා සංඥා බලසේනාව යටතේ 1 වන බළඝණය ශ්‍රී ලංකා සංඥා බළකාය ලෙස, 1980 අගෝස්තු මස 07 දින හවනි 21/80 නහාසිටුවීමේ උපදෙස් මගින්, නිළධාරීන් 8 දෙනෙකු හා සෙසුනිළයින් 200 දෙනෙකුගෙන් යුතුව, බළඝණාධිපතිවරයෙකු ගේ අණදීම යටතේ බළඝණයක් වශයෙන් උපත ලැබීය. මෙම බළඝණය 1 ශ්‍රීලංසංඛ අණදෙන නිළධාරීගේ පාලනය යටතේ ක්‍රියාත්මක වූ අතර, 1989 ජනවාරි මස 26 දින හවනි 05/89 නහාසිටුවීමේ උපදෙස් මත 1980 අප්‍රේල් මස 25 දින සිට බලපැවැත්වෙන සේ, ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක වීමට අනුමැතිය ලද අතර, 1999 අප්‍රේල් මස 15 දින 1 ශ්‍රීලංසංඛ අණ හා පාලනයෙන් මිදී ස්වාධීන ඒකකයක් ලෙස රෙජිමේන්තු මධ්‍යස්ථානය යටතට පත්විය.

2006 අප්‍රේල් මස 28 දින හවනි 15/2006 නහාසිටුවීමේ උපදෙස් මත නිළධාරීන් 21 දෙනෙකුගෙන් සහ සෙසුනිළයින් 464 දෙනෙකුගෙන් යුතු නව සංස්ථාව අනුමත වීමෙන් පසුව 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙව්) නිදහස් ඒකකයක් ලෙස පෙරට යාමේ අත්තිවාරම දමන ලදි.

ඒ වන විටද, නිත්‍ය සහෝදර ඒකක ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විසින් මෙම ඒකක අණදීම සිදු කරන ලද අතර, යුද හමුදා මූලස්ථානයේ අනුමැතිය මත 2ශ්‍රීලංසංඛ(සෙව්) ප්‍රථම අණදෙන නිළධාරී වීමේ භාග්‍යය උදා වූයේ ලුතිනන් කර්නල් ආර්ඩී කරුණාරත්න 4 ශ්‍රීලංසංඛ (එවකට මේජර්) වෙතය. ඉතා කෙටි කාලයක ඇවෑමෙන් ලුතිනන් කර්නල් එම්පිජේවික්සේ පටබැඳිගේ 4 ශ්‍රීලංසංඛ (එවකට මේජර්) විසින් අණදෙන නිළධාරී පදවිය භාරගන්නා ලදි. එහෙත් මාසයක් වැනි සුළු කාලයකදී ඔහුට විදේශ පාඨමාලාවක් හැදෑරීම සඳහා දිවයිනෙන් බැහැරව යාමට සිදුවීමෙන් අනතුරුව 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙව්) ඉතිහාසයේ ප්‍රථම සෙව්ච්ඡා අණදෙන නිළධාරී වීමේ භාග්‍යය මේජර් එල්ජේඩි ද පීරිස් යන ජ්‍යෙෂ්ඨ නිළධාරී හිමිකරගන්නා ලදි. මේ වන විට ඒකකයේ සෙසු නිළයින්ගේ දීර්ඝ කාලීනව නොලැබී පැවති නිළ උසස්වීම් වෙනුවෙන් වූ ඇවැසි උසස් කිරීම් පාඨමාලා හදාරවා මේ වන විට ඔවුන්ට හිමි නිළ උසස්වීම් නිසියාකාරව ලබා දී ඇත.

ස්ථිර පදනමකින් තොරව, ස්ථිර අධිෂ්ඨානයක් නොමැතිව, අපහැදිලි අනාගතයක සිහින දකිමින්, ජ්‍යෙෂ්ඨයන්ගෙන් අනාගත සිහින බිඳ වැටෙනු දකිමින්, කල් ගෙවූ පරපුරක බලාපොරොත්තු සහිත පොට දිනයක අරුණළු තුලින් නව ජීවිතයක උදාව 2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ඒකකයේ සියළු දෙනා හට එතැන් සිට දැකගත හැකි විය. වත්මන් අණදෙන නිළධාරීගේ නිවැරදි මගපෙන්වීමට අනුව නිළධාරී මඬුල්ල හා සෙසුනිළයින් සහෝදරත්වයෙන් එකමුතුව එකාවන්ව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අද සෙසු නිත්‍ය සහෝදර ඒකකයන් අතර, අද්විතියව වැජඹෙන්නට 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඒකකයට හැකියාව ලැබී ඇත. ඒ අනුව වත්මන් ඒකක සංයුතිය නිළධාරීන් 18 දෙනෙකුගෙන් හා සෙසුනිළයින් 400 කින් සමන්විතව සාර්ථක අනාගතයක් වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතී.

ඉතාමත් දීර්ඝ කාල පරාසයක් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන කඳවුරු භූමිය තුල ස්ථාපනය කර තිබූ මෙම ඒකකය ප්‍රථම වතාවට 2009.05.13 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඒකකයක් වශයෙන් වෙනම ස්වාධීනව රාජකාරී කිරීම සඳහා ආසේමු (නැ) වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගතව ඒකකය නගා සිටුවීමේ කටයුතු මේ වන විට ඉතාමත් කැපවීමකින් හා උත්සාහයකින් යුතුව ඉටු කරනු ලබන බව සිහිපත් කරන්නේ ඉතාමත් අභිමානයෙන් හා නිහතමානීත්වයෙන් යුතුවය.

අණදෙන නිළධාරී තනතුර හොබවනු ලැබූ මේජර් එල්ජේඩි ද පීරිස් යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2010.09.06 දින එම තනතුර අත්හැරීමෙන් පසු මෙම ඒකකයටම අයත් ලුතිනන් කර්නල් ඒආර් ඔබේසේකර යන ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් එම තනතුර භාරගත් අතර, උප අණදෙන නිළධාරී තනතුර හොබවනු ලැබූ මේජර් එච්ඊඩී පෙරේරා යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2010.04.10 දින එම තනතුර අත්හැරීමෙන් පසු මෙම ඒකකයටම අයත් මේජර් කේපීඩී ප්‍රියංක යන ජ්‍යෙෂ්ඨ නිළධාරී විසින් එම තනතුර භාරගත් අතර, විධායක අධිකාරී 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය (සෙව්) මාතාවගේම දරුවෝ වන අතර, ඒ අප ඒකක මාතාවන්ගේ ස්වාධිපත්‍යයේ කාහල නාදයයි. 2011 අප්‍රේල් මස 25 වන දින ඒකක මාතාවගේ තිස්එක් වන ජන්ම දිනය සැමරූ අතර, එම දිනය නිමිති කොටගෙන 2011.04.25 දින මෙම ඒකක අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී කරනු ලබන ලුතිනන් කර්නල් ඒආර් ඔබේසේකර යන ජ්‍යෙෂ්ඨ නිළධාරී වෙත නිදහස්ව හා ස්වාධීනව ඒකක සංවත්සර උත්සව දිනය සනිටුහන් කිරීම වස් එහි ප්‍රධාන අංගය වන සම්මාන පෙළපාලියේ උත්තමාචාරය පිරිනැමුවේ ඉමහත් භක්තියෙනි. එය අපට මහත් ගෞරවයකි. 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ඉතිහාසයේ නොමැකෙන සිහිවටනයකි. ඒකකය වෙන්ව ස්ථානගත වීමෙන් පසු සෙසුනිළයින් වෙත ලැබිය යුතු ස්වාධීන වරප්‍රසාදයන් වන බිහි/සැර නිවස්නය, කොනොනි සමාජශාලාව, සෙසුනිළ භෝජනාගාරයන්හි පවතින තනතුරු හෙබවීමට අවස්ථාව උදා වී ඇති බැව් ඉතාමත් සතුටින් දන්වා සිටීමට කැමැත්තෙමි. එසේම අපට ස්වාධීනව දෙපයින් නැගී සිටින්නට එදත් අදත් සවදත් අත හිත දුන් සංඥා බළකාධිපති වරුන්, බළසේනාධිපති වරුන්, මධ්‍යස්ථාන සේනාවිධායක වරුන් ඇතුළු සියලු සංඥා ඒකකවල ජ්‍යෙෂ්ඨ, කනිෂ්ඨ නිළධාරීන් මෙන්ම ජ්‍යෙෂ්ඨ හා කනිෂ්ඨ සෙසුනිළයින් ඉමහත් ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නට මෙය අවස්ථාවක් කර ගනිමි.







31 වන ඒකක සංවත්සරය වෙනුවෙන් අණදෙන නිළධාරී තුමන් විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම.



31 වන ඒකක සංවත්සරය වෙනුවෙන් අණදෙන නිළධාරී හට පිරිනමන ලද ආචාර පෙළපාලිය.




31 වන ඒකක සංවත්සරය වෙනුවෙන් අණදෙන නිළධාරී විසින් සියළු නිළයින් ඇමතීම.



2011.10.11 දින සංඥා බළසේනාධිපතිගේ කඳවුරු සංචාරයේදී සංඥා බළසේනාධිපති විසින් කඳවුරු මුරය පරීක්ෂාව.



2011.09.23 දින සිට 25 දින දක්වා පැවැත්වූ East Expo 2011 ප්‍රදර්ශණය සඳහා ඒකකය වෙතින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශණ කුටිය.







2011.06.26 වන දින හයිටි රාජ්‍යයේ සාමසාධක රාජකාරි සඳහා නික්ම ගිය 12 වන අතිරේක කණ්ඩායම විසින් සංඥා බලකාධිපති තුමන් වෙත 20011.06.09 වන දින පිරිනැමු ආචාර පෙලපාලිය සහ සමූහ ඡායාරූපය





13 වන සාමසාධක බලඇණිය ගැමුණු (හයිටි) සඳහා සහභාගිවූ නිළධාරි/සෙසු නිළයින් විදේශිය හමුදාවන් සමඟ එච් එෆ් වර්ගයේ රේඩියෝ පුහුණු අභ්‍යාසයක නිරතවෙමින්





13 වන සාමසාධක බලඇණිය ගැමුණු (හයිටි) සඳහා සහභාගිවූ නිළධාරි/සෙසු නිළයින් හට පදක්කම් පැළඳවීමේ පෙලපාලිය සහ සංඥා නිළධාරි/සෙසු නිළ සමූහ ඡායාරූපය



THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

## ERE / ATT SENIOR OFFICERS

| RANK | NAME | REGT NO | UNIT | PRESENT LOC | NATURE OF DUTY |
|---|---|---|---|---|---|
| Maj Gen | EP De Z Abeysekera USP | O/50912 | | AHQ/RHQSLSCMGO/ | Col Comdt |
| Maj Gen | SAPP Samarasinghe RSP psc | O/50878 | | OCDS | Director General Coord DOC TRG/DG-CRD |
| Maj Gen | HMHA Herath psc | O/50884 | | AG Br | AG |
| Brig | RA Kaduwela | O/50941 | | HQ CSO | CSO |
| Brig | KRP Rowel RWP USP psc | O/60477 | | 57 Div | GOC |
| Brig | BHMA Wijesinghe psc | O/60405 | | 222 Bde | Bde Comd |
| Col | D Ekanayake USP | O/60513 | | Transit Camp (RTM) | Comdt |
| Col | NM Hettiarachchi psc | O/60460 | | Sig Bde | Comd Sig Bde |
| Col | DR Dharmasiri Hdmc | O/60307 | | RHQ SLSC | Cen Comdt |
| Col | MT Vaidyaratne | O/60472 | | HQ 53 Div | Col GS |
| Brig | DAPN Dematanpitiya psc | O/60579 | | 523 Bde | Bde Comd |
| Brig | HP Seneviratne | O/60580 | | 621 Bde | Bde Comd |
| Col | CMDP Chandrasekere | O/60611 | | 651 Bde | Offg Bde Comd |
| Col | KMRP Karunathilake psc | O/60582 | | 642 Bde | Offg Bde Comd |
| Col | WGD Wanniarachchi psc | O/60478 | | Dte of Trg | Col Trg |
| Col | WPAK Tilakaratne psc | O/60974 | | UN Mission - Haiti | Dy Chief Mil Per Offr |
| Col | NP Akuranthilake | O/60850 | | 65 Div | Col GS |
| Lt Col | RD Karunarathne | O/60791 | 4 SLSC | SFHQ (MLT) | Offg Col GS |
| Lt Col | PAJ Peiris | O/61021 | 1 SLSC | DMC | DMC - Coord |
| Lt Col | WL Premasiri | O/61077 | 4 SLSC | 5 SLSC (Rft) | CO |
| Lt Col | LSP Perera | O/61114 | 3 SLSC | HQ CSO | Col Coord |
| Lt Col | MPJSK Patabendige | O/61149 | 1 SLSC | 6 SLSC (Rft) | CO |
| Lt Col | DL Sarathchandra | O/60911 | 3 SLSC | 3 SLSC | CO |
| Lt Col | WG Dias | O/60919 | 3 SLSC | 4 SLSC | CO |
| Lt Col | WACN Warakagoda psc | O/61229 | 3 SLSC | Sch of Sig | Comdt |
| Lt Col | SSK Jayawickrama | O/61246 | 4 SLSC | MOD | Staff Offr |
| Lt Col | HMLD Herath RSP psc | O/61454 | 1 SLSC | UN Mission - Haiti | Mil Rep / COE Inspector |
| Lt Col | KAWS Rathnayake | O/61415 | 1 SLSC | 7 SLSC (Rft) | CO |
| Lt Col | DBC Jayasinghe psc | O/61501 | 4 SLSC | 9 SLSC | CO |
| Lt Col | SHPD Tilakaratne RSP | O/61517 | 4 SLSC | 8 SLSC (Rft) | CO |
| Lt Col | DMPP Dasanayake | O/61535 | 3 SLSC | OCDS | GSO I (Ops) |
| Lt Col | BWMJA Premadasa RSP | O/61880 | 1 SLSC | 10 SLSC (Rft) | CO |
| Lt Col | VLK Jayarathne psc | O/61863 | 3 SLSC | SBW | Comdt |
| Lt Col | RM Monaragala | O/61870 | 4 SLSC | CRD | Head of Eletronic Wing |
| Lt Col | R Elvitigala | O/61727 | 1 SLSC | 1 SLSC | CO |
| Lt Col | MAAJ Kularathna psc | O/61732 | 4 SLSC | UN Mission - Haiti | Staff Offr (Planning Cell) |
| Lt Col | IHMRK Herath psc | O/61739 | 3 SLSC | HQ CSO | GSO I (Comm) |
| Lt Col | AP Wickramasekara psc | O/61746 | 4 SLSC | RHQ SLSC | SO I |
| Lt Col | SMH Imaduwage RSP | O/61793 | 4 SLSC | SFHQ (MLT) | GSO I(Coord) |
| Lt Col | WSN Perera | O/61993 | 1 SLSC | RHQ SLSC | Temp att for Medical Treatments |
| Lt Col | RMPSB Rathnayake | O/62110 | 1 SLSC | HQ CSO | GSOI (EW) |
| Lt Col | GLSW Liyanage psc | O/62176 | 3 SLSC | SLMA - DLA | Offr Instr |
| Lt Col | CP Arangalla psc | O/62182 | 1 SLSC | 22 DIV | GSO I (Ops) |
| Lt Col | BI Assalaarachchi psc | O/62152 | 4 SLSC | MS Br | SO I (Grievance Handling) |
| Lt Col | SM Atukorala psc | O/61679 | 1 SLSC | MOD | MLO's |
| Lt Col | GS Fonseka psc | O/62054 | 4 SLSC | 11 Div | GSO I (Coord) |
| Lt Col | GGA Gunasekara | O/62001 | 3 SLSC | CRD | GSO I |
| Lt Col | DNI Amarasinghe RSP | O/62491 | 1 SLSC | HQ Log Comd | GSO I (Sy) |

**IT OFFICERS**

| RANK | NAME | REGT NO | UNIT | PRESENT LOC | NATURE OF DUTY |
|---|---|---|---|---|---|
| Lt Col | DLSU De Silva | O/61627 | 11 SLSC | OCDS | SO I - IT |
| Lt Col | GNU Jayarathne | O/61625 | 11 SLSC | 11 SLSC | CO |
| Lt Col | SPP Pakshaweera | O/61626 | 11 SLSC | KDU | Snr Lecturer |
| Lt Col | KC Prathapasinghe | O/61623 | 11 SLSC | MGO Br | SO I - IT |
| Lt Col | HAIU Hewaarachchi | O/61628 | 11 SLSC | Dte of ABF | Temp Att |

**VOLUNTEER OFFICERS**

| RANK | NAME | REGT NO | UNIT | PRESENT LOC | NATURE OF DUTY |
|---|---|---|---|---|---|
| Col | STS De Silva | O/6661 | 2 SLSC (V) | CRD | Offg Chief Coord |
| Lt Col | AR Obeysekara | O/3103 | 2 SLSC (V) | 2 SLSC (V) | CO |
| Lt Col | HWKC Wadugoda | O/3287 | 2 SLSC (V) | SF(J) | CAO |

## PROMOTION SNR OFFICERS - 2010/2011

| RANK | NAME | REGT NO | PRESENT LOC | NATURE OF DUTY |
|---|---|---|---|---|
| T/Maj Gen | EP De Z Abeysekera USP | O/50912 | AHQ/RHQSLSC | MGO/Col Comdt |
| T/Maj Gen | SAPP Samarasinghe RSP psc | O/50878 | OCDS | Director General Coord DOC TRG/DG-CRD |
| T/Maj Gen | HMHA Herath psc | O/50884 | AHQ | AG |
| T/Brig | DAPN Dematanpitiya psc | O/60579 | 523 Bde | Bde Comd |
| T/Brig | HP Seneviratne | O/60580 | 621 Bde | Bde Comd |
| T/Col | KMRP Karunathilake psc | O/60582 | 642 Bde | Offg Bde Comd |
| T/Col | WPAK Tilakaratne psc | O/60974 | UN Mission - Haiti | Staff Offr |
| T/Col | NP Akuranthilake | O/60850 | 65 Div | Col GS |



## ORIGINS OF THE SIGNALS CAP BADGE

The Royal Signals cap badge is heraldically described as; "The figure of Mercury holding a Caduceus in the left hand, the right hand aloft poised with the left foot on a globe all silver above the globe a scroll inscribed 'Certa Cito' and below on each side six laurel leaves all gold, the whole ensigned with the Crown in gold." But to every member of the Corps it is affectionately know as "JIMMY". So what are the origins of the badge and its name? Nobody can be exactly sure, but to believe the most widely accepted theories you must trace the history of communications units in the Army back to the formation, in 1870, of 'C' Telegraph Troop, Royal Engineers. The Troop served with distinction in the Ashanti and Zulu Wars and by 1884, because of the growth in communications requirements, it was decided to form 1st and 2nd Divisions of the 1st Telegraph Battalion, Royal Engineers. Major CFC Beresford was the initial Commander of the 2nd Division and he was determined that it should have its own emblem (or 'device' as he called it). Although he had asked the Battalion for suggestions there was none better than his own, and so the figure of Mercury was adopted. It was first used in the Battalion magazine, Military Telegraph Bulletin, on 15 September 1884, and was also used on headed notepaper. It is thought that the inspiration for Mercury came to Major Beresford from the statue of Mercury that his father had probably purchased at the Great Exhibition at Hyde Park in 1851. This had then been set up in his garden in Camberley. The statue was passed to the Royal Signals in 1977. The new device was liked by the soldiers and so on 9 May 1891 Major Beresford and Lieutenant CJ Elkington RE presented a mace or 'bandstick' to the Band of the Battalion. The handsome bandstick had a figure of Mercury at the top. This was also passed to the Royal Signals at a later date and now resides together with the statue in the Corps Museum.

## ORIGINS OF THE SIGNALS CAP BADGE




Mercury was never used by RE communicators as a badge. Although the emblem was used on the Band Mace of the Band of the Royal Engineers - which can now be found on display at the Museum. It was not until the 'Corps of Signals' was formed that the question of a badge came into being. Following the decision of King George V to grant the 'Royal' title the first cap badge of Mercury was approved on 24 March 1921. This was of the initial pattern with the oval band surrounding it. The Corps changed its style of badge in 1946 to that currently used. "Certa Cito", meaning "Swift and Sure", was also included at this stage.



The 1946 Cap Badge with Tudor Crow

*Extracted from*
*Royal Signals Museum website*

# SIGNALLER



# සංඥා මූලික වැඩපල
# ශ්‍රී ලංකා සංඥා බළකාය

## 11 වන සංවත්සරය

සංඥා මූලික වැඩපල 2011 අගෝස්තු මස 13 වන දිනට 11 වන සංවත්සර සමරනු ලබයි. එම ඒකක සංවත්සරයට සමගාමීව මේ වන විටත් මෙම ඒකක සේනාවිධායක උපදෙස් මත පරිපාලිතයින්ගේ දායකත්වයෙන් සහ ඒකක සෙබළුන්ගේ උපරිම කැපවීමෙන් පොදු සුභසාධන කටයුතු කිපයක් අවසන් කර ගැනීමට හැකි වූ අතර, හෝමාගම මුල්ලේගම මහා විද්‍යාලයට විශාල අඩුපාඩුවක්ව පැවති එම පාසලේ ඉගෙනුම ලබන ළමුන්ට හා ගුරුවරුන් වෙනුවෙන් . වෙන් වෙන් වශයෙන් වැසිකිලි පද්ධතියක් මෙම ඒකක අරමුදලින් ඉදිකර දීමට හැකිවීම මහඟු පිංකමකි. ඊට අමතරව මෙම ඒකක තුලවාසි/බැහැරවාසි සෙබළුන්ගේ හඩ නිවාස අලුත් වැඩියා කරදීමට හා එම අයවලුන් භාවිතා කරනු ලබන වැසිකිලි පද්ධතිය හා නාන කාමරය ඉතාමත් උසස් තත්වයෙන් අලුත් වැඩියා කර අවසන් කිරීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතී.



රජයේ සංවර්ධන ක්‍රියාදාමයේ අවශ්‍යතාවයක් වශයෙන් යුධ හමුදා මූලස්ථානය, සමහර අධ්‍යක්ෂ මණ්ඩල සහ යුධ හමුදා රෝහල එවකට තිබූ ස්ථානයෙන් ඉවත් කර එම භූමිය තුල ඉදිකර තිබූ සංඥා සම්බන්ධතා මුලුමනින්ම නව ස්ථානයන් තුල අවම කාල සීමාවකදී ස්ථාපිත කිරීමට මූලික සංඥා වැඩපල වෙත පැවරුණි. එසේ යුධ හමුදා සංඥා ජාලයට හා දෛනික සංඥා සම්බන්ධතාවයන්ට කිසිදු බාධාවකින් තොරව යුධ හමුදා මූලස්ථානයේ ස්වයංක්‍රිය විනිමය ඇතුලු සියලු ගුවන් විදුලි සම්ප්‍රේෂණ උපකරණ නව ස්ථානයන්හි ස්ථාපිත කිරීම අතිශය අභියෝගාත්මක භාරදූර කාර්යයක් විය. එවකට ප්‍රධාන සංඥා නිලධාරීගේ උපදෙස් මත සංඥා බලසේනාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ සහ මෙම වැඩපලේ නිලධාරී සහ සෙසුනිලයින්ගේ මහත් කැපවීම මත අපේක්ෂිත දිනයන් තුල එම කාර්යය නිම කිරීමට හැකිවීම සංඥා බලකායේ කීර්තිය ඔප්නැංවීමට මහත් පිටුවහලක් විය.

යුධ හමුදා දත්ත සහ සංඥා ජාලය (ARMY BACK BORN) ස්ථාපනය කර අවසන් අතර, යුධ හමුදාවේ භාවිතා කරනු ලබන රේඩියෝ රිලේ උපකරණ, ජනාධිපති ආරක්ෂක ඒකකයේ උපකරණ හා යුද හමුදාපති තුමාගේ ආරක්ෂක ඒකකයේ සංඥා උපකරණ සවි කර ඇති පිදුරුතලාගල සම්ප්‍රේෂණ කුලුණේ රාජකාරී කරනු ලබන කාර්මික සෙබළුන්ගේ නවාතැන් පහසුකම් හා එම උපකරණ රඳවා තබා ගැනීමට අඩුවක්ව පැවති ගොඩනැගිල්ල ඉදිකර නිමකිරීමෙන් පසු භාවිතයට ගැනීමට හැකිවිය. එමෙන්ම සංඥා මූලික වැඩපල ආසන්නයේ ඇන්ටනා කුලුනක් සහිතව නවතම ක්ෂේත්‍ර තරංග මැදිරියක් ස්ථාපනය කරන ලදි.



උතුරු ප්‍රදේශයට සන්නිවේදන තොරතුරු ලබාදෙනු ලබන කොකාවිල් අධි සංනිවේදන කුලුණ කුරිරු ත්‍රස්තවාදීන් විසින් පසුගිය කාලවකවානුව තුලදී විනාශ කර දමා තිබුණි. රජයේ මැදිහත් වීමෙන් හා යුධ හමුදාපතිතුමාගේ සියලු උපදෙස් මත එම ඇන්ටනා කුලුණ නැවත වරක් ඉදි කිරීමෙන් පසු 2011.06.08 දින අතිගරු ජනාධිපතිතුමා වෙතින් විවෘත කිරීමට හැකියාව ලැබුණි. එම ස්ථානයේ ඉදිකර ඇති මෙම ඒකක සංඥා මධ්‍යම වැඩපල මගින් එම ප්‍රදේශයේ සංඥා උපකරණ අළුත්වැඩියා කිරීමේ කටයුතු විශාල වශයෙන් ඉටු කරනු ලබයි. එය පොදුවේ ගත් කල මෙම ඒකකයට පමණක් නොව සංඥා බලකායටම ගෞරවයකි.

යුද්ධය අවසන් වී වසර දෙකක් ගෙවීමෙන් පසු පවත්වන්නට යෙදුනු 63 වන නිදහස් දින උත්සවයට සමගාමීව කතරගම ප්‍රදේශයේදී උත්කර්ෂවත් පෙළපාලිය හා බුත්තල ප්‍රදේශයේ දැයට කිරුළ ප්‍රදර්ශණය සිදු කරන ලද අතර, එම සියලුම ජන ඇමතුම් රාජකාරී ඉතාමත් සාර්ථකව අවසන් කිරීමට හැකියාව ලැබුණි. එම පෙළපාලිය අවසන් වීමත් සමග බුත්තල පැවති දැයට කිරුළ ප්‍රදර්ශණයේ සංඥා බලකාය නියෝජනය කරමින් මෙම ඒකකය වෙතින් ඉදි කරන ලද ප්‍රදර්ශණ කුටිය සියලුම අයවලුන්ගේ පැසසුමට ලක් වන පරිදි ඉදිකිරීමට මෙම ඒකක නිළධාරී/සෙසුනිළයින් හට හැකියාව ලැබුණි.



යුද්ධය අවසන් කර ජයග්‍රහණය සමරමින් දෙවන වරට ගාලුමෝදර පිටියේ පවත්වන ලද විජයග්‍රහන පෙළපාලියේ විශේෂ සංඥා රාජකාරී ඉටු කිරීමට සංඥා බලකායට පැවරුණි. ඉතාමත් විශාල හඩ පිරිස් ප්‍රමාණයක් සහභාගි වූ එම පෙළපාලියේ වෙන් වෙන් වශයෙන් ගමන් ගත් යුධ, ගුවන්, නාවික හා පොලිස් යන සියළු සේවා ආවරණය වන පරිදි ඉතාමත් සාර්ථක ලෙස ජන ඇමතුම් සේවාව ලබාදීමට අපගේ කාර්මික හඩ පිරිස් හට හැකියාව ලැබුණි. එම පෙළපාලියට සමගාමීව පවත්වන ලද රට පෙළපාලියේ සංඥා මූලික වැඩපල මගින් සංවිධානය කරන ලද යුද්ධය අවසන් කිරීමට භාවිතා කල ගුවන් විදුලි උපකරණ රැගත් රථ පෙළ එම පෙළපාලිය නැරඹූ සියලුමදෙනාගේ පැසසුමට ලක්විය.



යුද්ධය ජයග්‍රහණය වෙනුවෙන් පිරිනමන ලද උතුරු හා නැගෙනහිර මානුෂීය මෙහෙයුම් පදක්කම් පැලඳවීමේ උත්සවයක් ප්‍රථම වරට මෙම ඒකකය වෙතින් ඉතා උත්කර්ෂවත් ලෙස සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන, ජන අවන්හලේදී 2011.05.19 දින පවත්වන ලදි. දිවයින පුරා විසිරී සිටින කාර්මික රාජකාරී කරනු ලබන මෙම ඒකකයේ සෙබළුන් විශාල ප්‍රමාණයක් සේනාවිධායක තුමා අතින් පත් පදක්කම් ලබා ගන්නා ලදි.



2010 වර්ෂයේ අන්තර් සංඥා ඒකක ක්‍රීඩා තරඟ අනුග්‍රහාව දිනා ගැනීමටද සංඥා මූලික වැඩපල සමත් විය.

30 වසරක් පැවති කුරිරු යුද්ධය අවසන් වී වසර දෙකක් ගෙවී ගිය පසුගිය වසර තුල මෙම සංඥා මූලික වැඩපල නිළධාරීන් හා සෙසුනිළයින් හට වෘත්තිමය වශයෙන් විශාල අභියෝගාත්මක රාජකාරී කොටසක් ඉටු කිරීමට සිදුවිය. එම රාජකාරීන් අතරතුර කාර්මික සෙබළුන්ගේ වෘත්තිමය දැනුම දියුණු කර ගැනීම සදහා හමුදා මෙන්ම සිවිල් ආයතන මගින් පවත්වනු ලබන ඉලෙක්ට්‍රෝනික පාඨමාලාවන් සඳහා සැලකිය යුතු පිරිසක් සහභාගි කරවා ගැනීමට ද හැකිවීම මූලික වැඩපල ලද භාග්‍යයකි.

එළඹෙන වසර සංඥා මූලික වැඩපල නිළධාරීන්ට හා සෙසුනිළයින්ට ගිය වසරේ මෙන්ම සංඥා බලකායට කීර්තියක් ලබා දීමට හැකියාවක් ඇත. ලෝකයේ දියුණු වන තාක්ෂණයට සමගාමීව වෘත්තිය දැනුම වැඩි දියුණු කිරීම තුලින් යුධ හමුදාවට ඇවැසි කාර්මික දැනුම වලදායී ලෙස ලබාදීමේ අදිටනින් එළඹෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට අප බලාපොරොත්තු වෙමු.



කොකාවිල් අධි සම්ප්‍රේෂණ කුලුණ

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

# සංඥා පුහුණු පාසල

## 21 වන සංවත්සරය හා වසරේ විශේෂ සිදුවීම්

1995 වසරේ ඔක්තෝම්බර් මස 12 වන දින යුද හමුදා සංඥා පුහුණු පාසල ලෙස ඓතිහාසික මහනුවර සෙංකඩගල පුරවරයේ ස්ථානගත කරන ලද මෙම සංඥා පුහුණු පාසල එදා සිට මේ දක්වා සේනාවිධායකවරුන් 20 දෙනෙකු යටතේ පාලනය විය.

මෙම පුහුණු පාසලේ 21 වන සංවත්සරය 2011.10.12 වන දිනට යෙදී තිබූ අතර, එම උත්සවය පූජාමය කටයුතුවලට හා හමුදා පිලිවෙත් වලට මූලිකත්වයදී කටයුතු කරන ලදී. එනම් 2011.10.08 දින සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනය සහ පසුදින උද්‍යසන සංඝයා වහන්සේලා 21 ක් නමක් වෙත සිල් දානය සහ අටපිරිකර පූජා කල අතර, 2011.10.09 වන දින දළදා වහන්සේ වෙත දිවා දානය සහ අටපිරිකර පූජා කරන ලදී. 2011.10.14 දින සියළු නිලයින් වෙනුවෙන් සංගීත සන්ධ්‍යාවක් 2011.10.15 දින බනි/සැරයන් නිවස්න සාදය පවත්වන ලදී. ඊට අමතරව 2011.10.22 දින නව නිළධාරි නිවස්නය විවෘත කිරීමටත්, එදිනම සවස නිළධාරීන්ගේ සුහද හමුවක් පැවැත්වීමට කටයුතු යොදා ඇත.



වත්මන් සේනාවිධායක ලූතිතන් කර්නල් ඩබ්ල්සීවන් වරකාගොඩ පීඑස්සී විසින් 2010.12.08 වන දින සිය තනතුරේ රාජකාරි භාරගැනීම.



2011.10.08 දින 21 වන සංවත්සරය වෙනුවෙන් පැවැත්වූ සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනය



2011.10.12 දින 21 වන සංවත්සරය වෙනුවෙන් සේනාවිධායක විසින් ආරක්ෂක මුරය පරීක්ෂා කිරීම





2011.10.12 දින 21 වන සංවත්සරය වෙනුවෙන් පැවති සියලු නිළ දිවා භෝජන සංග්‍රහය

## පුහුණුවීම්

සංඥා බලකායට ආවේනික විෂයන්ට පරිභාහිරව මෙම වසර තුල උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ සංකල්පයකට අනුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි විශ්වවිද්‍යාල වලට ඇතුලත්වීමට සුදුසුකම් සපුරා සිටි සිසු සිසුවියන් වෙනුවෙන් නායකත්ව ගුණාංග හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ පාඨමාලා දෙකක් පවත්වන ලදී. එම පාඨමාලාවන්හි පලමු අධියර සඳහා 84 ක් හා දෙවන අධියර සඳහා 180 ක් සිසු සිසුවියන් පිලිවෙලින් සහභාගි විය. කිසිදු බාහිර හෝ අභ්‍යන්තර ගැටළුවකින් තොරව තත් අධියරයන් දෙකම සාර්ථකව අවසන් කිරීමට හැකිවීම සංඥා බලකායට මෙන්ම පොදුවේ සමස්ථ යුධ හමුදාවටද ඉමහත් ආඩම්බරයකි/ගෞරවයකි. එම පාඨමාලා අධීක්ෂණය කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමාද සහභාගී වූ අතර, සියලුම උපදේශක/උපදේශිකාවන් එම සිසු සිසුවියන් වෙනුවෙන් දරන ලද කැපවීම පිළිබඳව ඉමහත් සතුටට පත්වූ ඔවුන්, එම සියළුදෙනා වෙත සිය ප්‍රශංසාව පල කරන ලදී.





විශ්වවිද්‍යාල සිසුන් සඳහා පවත්වන ලද නායකත්ව පුහුණු පාඨමාලාවේ එක් අභ්‍යාසයක් වන කඳු තරණයේදී මහනුවර හන්තාන කඳු වැටිය තරණය කල අවස්ථාව



පූජා සත්කාර කටයුත්තකට සහභාගිවී සිටින විශ්වවිද්‍යාල සිසුන්



විශ්වවිද්‍යාල සිසුන් සඳහා පවත්වන ලද නායකත්ව පුහුණු පාඨමාලාවේ සාමූහික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වෙමින්

තවද, මෙම පුහුණු පාසලේ ස්ථාපිත රණවිරු තොරතුරු තාක්ෂණ ආයතනය වෙතින් ශ්‍රී ලංකා යුද හමුදා සේවයේ යෙදිසිටියදී, මියගිය, දැනට සේවයේ යෙදී සිටින, විශ්‍රාමික හා ආබාධිත නිළධාරී සෙසුනිළයින්ගේ හා ස්ථිර සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ පවුල්වල සාමාජිකයින් සඳහා, ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානයේ උපදෙස් මත මෙම වසර තුල පහත සඳහන් පාඨමාලා පැවැත්විය/පැවැත්වීමට කටයුතු කර ඇත.

- ශ්‍රී ලංකා පරිඝණක ධාවන බලපත්‍ර පාඨමාලාව.
- තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික පාඨමාලාව.



සංඥා පුහුණු පාසලේ ස්ථාපිත රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනයේ පාඨමාලා හදාරණ දරු දැරියන්

ඉහත පුහුණුවීම් වලට අමතරව යුධ පුහුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ඇතිව මෙම වසර තුල පහත සඳහන් පාඨමාලා පැවැත්විය/පැවැත්වීමට කටයුතු කර ඇත.

- රෙජිමේන්තු සංඥා නිළධාරී පාඨමාලා - 05
- තරුණ සංඥා නිළධාරී පාඨමාලා - 02
- වෙනත් ඒකක සංඥා පුහුණු පාඨමාලා - 07
- විද්‍යුත් සංග්‍රාමික පාඨමාලා - 04
- සංඥා උපදේශක පාඨමාලා - 05
- මූලික පරිගණක පාඨමාලා - 06
- ජ්‍යෙෂ්ඨකොණ්ඩ නායකත්ව හා කළමණාකරණ පාඨමාලා - 05
- වෘත්තිය පරීක්ෂණ I වන ශ්‍රේණිය (පිරිමි) - 02
- **වෘත්තිය පරීක්ෂණ II, III (කාන්තා) - 03**
- කෝප්‍රල් සිට සැරයන් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලා - 05
- මූලික සංඥා පාඨමාලා - 03



සංඥා පුහුණු පාසලේ පවත්වන ලද රෙජිමේන්තු සංඥා නිළධාරී පාඨමාලාවේ නිළධාරීන් ලිඛිත පරීක්ෂණයක නිරතවෙමින්.



ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරවීමේ අභ්‍යාසයක නිරත වෙමින්.



සංඥා පුහුණු පාසලේ පවත්වන ලද කෝප්‍රල් සිට සැරයන් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාවේ සෙනින් අභ්‍යාසයන් වල නිරත වන අයුරු.



කේබල් වගී හඳුනාගනිමින්.



සංඥා පුහුණු පාසලේ පවත්වන ලද කෝප්‍රල් සිට සැරයන් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාවේ සෙනින් වන අභ්‍යාසයක නිරත වන අයුරු.

## බාහිර ක්‍රියාකාරකම්

පසුගිය කාල වකවානුව තුල පැවති අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් මෙම පුහුණු පාසල ස්ථාපිත ප්‍රදේශය අවට නාය යාම් හා විවිධ ආපදා කටයුතු බහුලව පැවති අතර, එම අවස්ථාවන්හිදි මෙම පුහුණු පාසල සෙනින්ගේ ශ්‍රම දායකත්වය ආපද කළමණාකරණ කටයුතු සඳහාද ලබාදෙන ලදි.

එසේම මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ සංවර්ධන / භූමි අලංකරණ කටයුතු සඳහා ද නිරන්තරයෙන්ම ශ්‍රමදායකත්වය ලබාදෙන ලදි.

තවද, ඓතිහාසික මහනුවර ඇසල පෙරහැර සමයේ, මධ්‍යම පලාත තුල, ක්‍රියාත්මක කරන ලද "පරිසරය පූජනියයි" පූජා සත්කාරක වැඩසටහන සඳහා ද ශ්‍රමදායකත්වය ලබාදෙන ලදි.

ඉහත ක්‍රියාකාරකම් වලට අමතරව සෑම මසකම කඳවුර අසල පිහිටි නවෝදයා ආබාධිත ළමා නිවාසය වෙත දිවා ආහාරය ලබාදීම සිදු කරන අතර, බෝගම්බර ක්‍රීඩා පිටිය පිලිසකර කිරීම සඳහාද ශ්‍රම දායකත්වය මෙම පාසල වෙතින් ලබාදෙන ලදි.



THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL



මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ සංවර්ධන කටයුතු සඳහා ශ්‍රමදායකත්වය ලබාදීම

## නවීකරණ කටයුතු සිදු කිරීම

භූමි අලංකරණ කටයුතු පිළිබඳ වෘත්තීය හා මනා නිපුනත්වයක් ඇති අයවලුන්ගේ මග පෙන්වීම හා උපදෙස් මත දැනට ප්‍රධාන දොරටුවේ සිට ප්‍රධාන ගොඩනැගිල්ල දක්වා මාර්ගය දෙපස භූමිය හා ගොඩනැගිලිහි අලංකරණ කටයුතු සිදු කරමින් පවති.



නවතමයෙන් ඉදිකරමින් පවතින නිළධාරී නිවස්නය



## වෙනත් පහසුකම්

මෙම පුහුණු පාසලේ වරකට නිළධාරී/සෙනින් 250 ක් 300 ත් අතර ප්‍රමාණයක් නේවාසිකව පුහුණුවීම් කටයුතු වල නිරත වනු ලබයි. ඔවුන්ගේ නේවාසික සහ සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ පූර්ණ අනුමැතිය මත පහත සඳහන් ඉංජිනේරු සේවා කටයුතු නිම කර/නිම කරමින් පවති.

- ❑ රු: 2150098.90 ක මුදලක් වැය කර ප්‍රධාන ගොඩනැගිල්ල සහ එහි වැසිකිලි පද්ධති අළුත්වැඩියා/නවීකරණ කටයුතු සිදු කරන ලදි.

- ❑ කඳවුරේ නාය යන ස්ථාන සකස් කර ගැනීමට රු: 1403743.00 ක මුදලක් ඉසේඅම වෙතින් අනුමත කර ගැනීමෙන් පසු එහි කටයුතු සිදුකරමින් පවති.

- ❑ කාන්තා හඩ නිවාසයක් ඉදි කර ගැනීමට රු: 2605333.00 ක මුදලක් ඉසේඅම වෙතින් අනුමත කර ගැනිමෙන් පසු ඒ සඳහා අවැසි ගොඩනැගිලි ද්‍රව්‍ය ලබාගනිමින් පවති.

- ❑ 20" x 60" ප්‍රමාණයේ දේශණ ශාලාවක් සියලු නිළයින්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදි කරමින් පවති.

- ❑ නවතමයෙන් ඉදිරිකෙරෙමින් පවතින නිළධාරී නිවස්නය ඇලුමිනියම් භාවිතයෙන් කාමර වෙන් කිරීම සඳහා රු: 643989.50 ක මුදලක් ඉසේඅම වෙතින් අනුමත කර ඇති අතර, එහි ඉදිරි කටයුතු සිදු කරමින් පවති.

- ❑ මිට අමතරව නව නිළධාරී නිවස්නය සඳහා අවශ්‍ය රු:1,000,000.00 වටිනා විදුලි උපකරණ හා ගෘහ භාණ්ඩ සංඥා බලකාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ දැනට මිලදී ගනිමින් පවතිනු අතර, එම ගොඩනැගිල්ල හා ප්‍රධාන දේශන ශාලාව වායුසමනය කිරීමටද කටයුතු කර ඇත.

- ❑ තවද බාධක තර්ණයන් ඉදිකිරීම / අළුත්වැඩියා කිරීම සඳහා රු.359,266.00 ක මුදලක් අනුමත කරගැනීමෙන් පසු එහි මූලික වැඩකටයුතු සිදුකරමින් පවති.

- ❑ සංඥාරෙම වෙතින් අනුමත රු. 300,000.00 ක මුදලින් එකතු කිරීම් හා වැඩිදියුණු කිරීමේ කටයුතු සිදුකරමින් පවති.





2010 නොවැම්බර් මස 15 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් නිර්මා තිලකරත්න මහත්මියගේ සම්බන්ධිකරණයෙන් සංඥාරෙම ආබාධිත භට නිවාසය වෙත මදුරු දැල් 07 ක් පරිත්‍යාග කෙරිනි.

2010 නොවැම්බර් මස අවසානයේ ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්ට අයත් සංඥා බලකායේ මියගිය / ආබාධිත රණවිරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුවදුක් සොයාබැලීමේ සංචාරයක් සිදුකරන ලදී. මෙහිදී පවුල් 28 ක් සංචාරය කරනු ලැබූ අතර එහිදී ඔවුන්ට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අඩංගු ත්‍යාග පාර්සලය බැගින් බෙදා දීමද සිදුකරන ලදී.

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් 2010 දෙසැම්බර් 12 දින, 4 ශ්‍රීලංසංබ (අනු) හිදී අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් සංඥා බලකා සෙසුනිල පවුල් අතර සුහද හමුවක් සංවිධානය කරන ලදී. මේ සඳහා පවුල් 395 ක් හා සාමාජිකයන් 1074 ක ප්‍රමාණයක් සහභාගි විය. මෙහිදී කුඩා ළමුන්ට ක්‍රීඩා පෙදෙසක්, සංගීත සංදර්ශණයක්, රූපලාවන්‍ය වැඩමුළුවක්, ශ්‍රී ලංකා පවුල් සෞඛ්‍ය සංවිධානය මගින් සංවිධානය කරන ලද වැඩමුළුවක්, නර්තන සංදර්ශණයක්, පිරිකෘම් සංදර්ශණයක් හා තූර්යවාදක සංදර්ශණයක් පැවැත්විය.



ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් එලබෙන නව පැසැල් වාරය වෙත පියනගන රණවිරු දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අධ්‍යාපනික පොත්පත් හා ලිපි ද්‍රව්‍ය අඩංගු වටිනා ත්‍යාග පාර්සල 5 ක් ප්‍රධානය කරන ලදී. තවද මෙහිදී දලිනී ජයධීර මහත්මියගේ සම්බන්ධිකරණයෙන් ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රණවිරුවන් 07 දෙනෙකු සඳහා රෝද පුටු පරිත්‍යාග කිරීමද සිදුවිය. තවද, සංඥාරෙම අබාධිත භට නිවාසයේ වෙසෙන රණවිරුවන් හට තිළිණ ප්‍රධානය කිරීම ද මෙදිනම සිදුවිය.



ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව අභාවප්‍රාප්ත කොශලයා සේනාධිර මහත්මියගේ සම්බන්ධිකරණයෙන් යුතුව අශෝක බාලසූරිය මහතාගේ පරිත්‍යාගයෙන් ගොඩ නගන ලද රුපියල් මිලියන 1.3 ක් වටිනා අංග සම්පූර්ණ නිවසක්, 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකායේ සංඥා සෙබළ තෙන්නකෝන් ඩබ්ලිව්එම්පී රණවිරුවා වෙත පිරිනමන ලදී.



2011 ජනවාරි මස 01 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් රණවිරු දුවා දරුවන් හට අධ්‍යාපනික පොත් හා පාසැල් උපකරණ අඩංගු ත්‍යාග පාර්සල 04 ක් ප්‍රධානය කෙරිනි. මීට අමතරව එදිනදී ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් ශ්‍රී ලංකා සංඥා බලකායේ ආබාධිත රණවිරුවන් 03 දෙනෙකු හට ද, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ රණවිරුවන් 04 දෙනෙකු හටද, ගැමුණු හේවා බලකායේ රණවිරුවන් 04 දෙනෙකු හටද, ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුවෙහි රණවිරුවන් 04 දෙනෙකු හටද, කෘත්‍රිම පාද ප්‍රධානය කිරීමද සිදුකරන ලදී. ස්විඩනයේ ශ්‍රී ලංකා සංසදයේ මූලයාධාර මත සිදුකරන ලද මෙම පරිත්‍යාගය රමණී දෙමටන්පිටිය මහත්මියගේ සම්බන්ධිකරණය මත සිදු විය.



ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් 2011 ජනවාරි 15 වන දින නැගෙනහිර පළාතෙහි ගංවතුරින් අවතැන්වූවන් හට බිස්කට් පැකට් - 130, ටින්මාළු - 55, නූඩ්ල්ස් පැකට් - 164, චොකලට් - 227, කිරිපිටි පැකට් - 25, මදුරු දඟර පැකට් - 50, සීනි කිලෝ - 64, හාල් කිලෝ 100, හා පරිප්පු කිලෝ 20 ක ප්‍රමාණයක් ගංවතුර සහනාධාර ලෙස ලබාදුනි.

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් 2011 පෙබරවාරි 12 දින අප අතරින් වියෝ වූ කපිතාන් එබීවී සිරිල් රණවිරුවාගේ පුතනුවන් හට තම ජායාරූපකරණ කටයුතු සිදු කිරීම සඳහා අවැසි ඩිජිටල් කැමරාවක් ප්‍රධානය කරන ලදී.



තවද සේවයේ නියුතු සංඥා බලකායේ සෙ/277249 සැරයන් අමරපති ඒවම්ආර් ගේ වයෝවෘද්ධ පියාගේ ප්‍රයෝජනය සඳහා රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී.

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් 2011 පෙබරවාරි 22 දින දානපතින් 190 ගේ සහභාගීත්වයෙන් ලේ දන්දීමේ කඳවුරක් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී පැවත්විය. මෙම උතුම් කර්තව්‍ය සඳහා අනෙකුත් රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවන්හි සභාපතිනියන්ගේ හා සාමාජිකාවන්ගේද නොමඳ දායකත්වයක් ලැබිනි.



2011 මාර්තු 12 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් මියගිය 1/4 තුවාල ලැබූ සංඥා බලකායේ පවුල්හි සාමාජික/සාමාජිකාවන් හට දොස්තර රේණුකා ජයතිස්ස මහත්මිය විසින් පවත්වන ලද දේශනයක් සංවිධානය කරනු ලැබිය. මෙහිදී සමගාමීව භාණ්ඩ බෙදා දීමක් ද, සංගීත වැඩසටහනක්ද සංවිධානය කෙරිනි. දලිනී ජයධීර මහත්මියගේ සම්බන්ධිකරණයෙන් සංඥා බලකායේ ආබාධිත රණවිරුවකු හට රෝද පුටුවක් මෙහිදී ප්‍රධානය කරන ලදී.

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2011

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛා සාමාජිකාවන් 2011 මාර්තු 28 දින යුධ හමුදා රෝහල - කොළඹ හි නේවාසිකව ප්‍රතිකාර ලබන රෝගීන්ගේ සුවදුක් සොයා බැලූ අතර එහිදී ඔවුන් හට ත්‍යාග පාර්සල 260 ක ප්‍රමාණයක් පරිත්‍යාග කිරීමද සිදුවිය.






පසුගිය වර්ෂවලදී මෙන් මෙවරද ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව "දෙරණ අරුණ උදානය - 2011" අවුරුදු පොළෙහි වෙළද කුටියක්, ආහාර කුටියක් හා ක්‍රීඩා කුටියක් පවත්වන ලදී. මීට අමතරව සංඥා බලකා ළමා සමාජය වෙතින්ද වෙළද කුටියක් පවත්වන ලදී.

2011 අප්‍රේල් 11 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් සංඥා බලකායේ ආබාධිත/ සේවයේ නියුතු සෙබළුන් වෙනුවෙන් බක්මහ උළෙලක් පැවැත්විය. මෙහිදී ලිස්සන ගස නැගීම, කොට්ට පොරය, බිත්තර ඇල්ලීම, අලියාට ඇස තැබීම, සංගීත පුටු තරගය, රෝද පුටු ධාවන තරගය හා අවුරුදු කුමරිය තෝරීම වැනි තරඟ රාශියක් පැවැත්විණි. තවද සංඥා බලකාධිපතිතුමන් ඇතුළු සංඥා බලකායේ ජ්‍යෙෂ්ඨ නිළධාරීන් විශාල පිරිසක් මෙම උළෙල නැරඹීමට සහභාගී විය. තවද ගරු සභාපතිනිය සිංහල අළුත් අවුරුද්ද වෙනුවෙන් සංඥා ආබාධිත හඩනිවාසයේ වෙසෙන රණවිරුවන්ගේ සුවදුක් සොයාබලා ඔවුන්ට ඇද ඇතිරිලි - 30, කොට්ට උර - 30, තන තුවා - 35, ලබා දෙන ලදී.





2011 මැයි මස 12 දින යුධ හමුදා සේවා වනිතා ශාඛාව සංවිධානය කරන ලද දානමය පුණ්‍යකර්මය සදහා ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් හතු ව්‍යංජනය කිලෝ - 07 ක ප්‍රමාණයක් පිළියෙල කොට පූජා කරන ලදී.

2011 මැයි මස 01 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් සෙව්වන්දි ද සිල්වා මහත්මියගේ සම්බන්ධිකරණයෙන් යුතුව ආබාධිත රණවිරුවකු හට රෝද පුටුවක් පරිත්‍යාග කරන ලදී.

2011 මැයි මස 18 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛා සංඥා ළමා සාමාජය සමග එක්ව 2600 වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම වස් ආගමික වැඩසටහන් රාශියක් සංවිධානය කරන ලදී. මොවුන් වදින සවස්වරුවේ පනාගොඩ යුධ හමුදා බෝධිරාජාරාමය අසල මල් දන්සැලක් පැවැත්විය.





අනතුරුව සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී ධර්ම දේශනයක් පැවැත් වූ අතර එහිදී සංඥා බලකායේ ආබාධිත රණවිරුවකු හට කෘතිම පාදයක් පරිත්‍යාග කරන ලදී. මේ සදහා මූල්‍යමය දායකත්වය සංඥා ළමා සමාජය වෙතින් දරන ලදී.

2011 මැයි මස 28 දින ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව වෙතින් වාද්දුව නිවාඩු නිකේතනය වෙත, එහි පැමිණෙන ආබාධිත / මහළු සංචාරකයන්ගේ ප්‍රයෝජනය සදහා රෝද පුටු 2 ක් පරිත්‍යාග කරන ලදී.

ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව සංඥා බලකා ළමා සමාජය සමග එකමුතුවෙන් යුතුව පනාගොඩ යුධ හමුදා බෝධිරාජාරාම විහාර පරිශ්‍රයෙහිදී පොසොන් භක්ති ගීත ප්‍රසංගයක් පවත්වන ලදී. එහිදී සංඥා බලකාධිපති ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගි වූ අතර රාණි ජයතිලක මහත්මිය (ගරු සභාපතිනිය සේවා වනිතා ශාඛාව - ශ්‍රීලංසිරෙ) ඉමාලි ධීරසිංහ මහත්මිය (ගරු සභාපතිනය - ශ්‍රීලයුසේබ) හා සෙසු සේවා වනිතා ශාඛාවන්හි සාමාජිකාවන් පිරිසක්ද මේ සදහා සහභාගී විය.



යුධ හමුදා සේවා වනිතා ශාඛාව 2011 ජූනි 19 දින පනාගොඩ යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසැලෙහි පැවැත්වූ පොසොන් බැති ගී ප්‍රසංගයටද ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවන් හා සංඥා බලකා ළමා සමාජයේ සාමාජික / සාමාජිකාවන් පිරිසක් තම දායකත්වය ලබා දුනි.



ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව 2011 ජූනි 27 දින රෝද පුටුවක් ගජබා රෙජිමේන්තුවේ ආබාධිත නිළධාරියකු හට ප්‍රධානය කරන ලදී. එහිදී සංඥා බලකායේ රණවිරුවෙකුටද අත්වාරු යුගලක් පරිත්‍යාග වශයෙන් ලැබිනි.

යුධ හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනියගේ ඉල්ලීමට අනුව සංඥා මූලික වැඩපලට අයත් ආබාධිත රණවිරුවකු හට රු: 75,000/- ක වටිනාකමින් යුත් මැණික් කැපීමට භාවිතා කරනු ලබන යන්ත්‍රයක් 2011 ජූලි 23 දින දී පරිත්‍යාග කරන ලදී. තවද මෙහිදී කොළඹ යුධ හමුදා රෝහල වෙත කලක සිට අඩුපාඩුවක්ව පැවති මහන මැෂිමක් පරිත්‍යාග කිරීමද සිදුවිය. රත්මලාන අභයමැදි කදවුරෙහි සේනාධිපති ධායක තුමන්ගේ ඉල්ලීමක් මත එහි වෙසෙන ආබාධිත රණවිරුවන්ගේ ප්‍රයෝජනය සදහා වැසිකිළි පද්ධතියක් සාදා දීමට අවැසි කොමඩ් කට්ටල 03 ක් පරිත්‍යාග කිරීමද මෙහිදී සිදුවිය.

2011 ජූලි 30 දින සංඥා බලකා සේවා වනිතා ශාඛාව ඉංජිනේරු බලකා සේවා වනිතා ශාඛාව සමග සහයෝගයෙන් යුතුව රාගම රණවිරු සෙවන හි නේවාසිකව ප්‍රතිකාර ලබන පුනරුත්ථාපන ලාභීන් හට ප්‍රණීත රාත්‍රී ආහාර වේලකින් සංග්‍රහ කල අතර ඔවුන්ගේ ප්‍රශ්න පිලබදවද සොයා බැලීමද සිදුකරන ලදී. තවද එහිදී සංගීත වැඩසටහනක් ද පවත්වන ලදී.



